**වසර 2500 පසු**
**මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.**

# සත්‍ය ධර්මය අවදි විය

(දහවන වෙළුම)

# සූත්‍ර දේශනා

සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.

## සූත්‍ර දේශනා

අන්තර්ජාලයේ ධර්ම දේශනා ශ්‍රවණය කිරීමට
www.buddothpa.com

zoom දේශනාව youtube ශ්‍රවණය කිරීමට
https://youtube.com/@Zoom-up2ik

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothpado

රාත්‍රී සාකච්ඡා zoom ශ්‍රවණය කිරීමට
https://us06web.zoom.us/j/87341245000?pwd=dFFrSSt4SVBQWFpzeXppUy-tIZFZWUT09

youtube ශ්‍රවණය කිරීමට
https://youtube.com/@buddothpado

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothp?mibextid=ZbWKwL

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 දෙසැම්බර්

ධර්ම ග්‍රන්ථය පිළිබඳ විමසීම් Email: thanujafernando1975@gmail.com
Tel 070 351 8747 - බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ

පරිගණක මුද්‍රණ සැකසුම **වාක්‍යා රූ**
අංක 42/8, මකුළුදූව, පිළියන්දල.
දුරකථනය 011 2 708377

මුද්‍රණය **රුවන් පහරුව**
14/10, පළමු පටුමග, අපේක්ෂා රෝහල පාර, මහරගම.
දුරකථන/ෆැක්ස් : 0112 2840738
Email: ruwanpaha@gmail.com

# නිවන් මඟ යා යුතු අනුපිළිවෙල

(සත්‍ය කෘත්‍ය කෘතක් ද්විදසාකාරක තිපරිවට්ටම්)

**බුදුන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය තුලින් ප්‍රථම වතාවට නිවන් මඟ යා යුතු ආකාරය අනුපිළිවෙලින් මෙසේ වදාළ සේක.**

1. **පූර්ව භාග ප්‍රතිපදාව** (පළමුව කලයුතු දේ)
   සත්‍යඥාණ අවබෝධය

2. **අපරභාග ප්‍රතිපදාව** (දෙවනුව කලයුතු දේ - ප්‍රායෝගිකවන ආකාරය)
   - **2.1** කෘත්‍යඥාණය - ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම
   - **2.2** කෘතක්ඥාණය - ආත්මීය භාවයෙන් මිදීමේ අත්දැකීම

1. **පූර්ව භාග ප්‍රතිපදාව** (සත්‍යඥාණ අවබෝධය) ශ්‍රාවකයාගේ උත්සාහය මත සහ කල්‍යාන මිත්‍රයාගේ පණිවිඩය මත පවතී

බුද්ධදර්ශනය අවබෝධකරගැනීම (දර්ශන ඥාණය = සත්‍යඥාණය)

- සිත හැදෙන හැටි අවබෝධකරගැනීම
- සිත මායාවක් බව අවබෝධකරගැනීම
- සිත යනු අරමුණම බව දැනගැනීම
- අරමුණෙහි සත්‍ය දැකීම, අරමුණට නොරැවටීම
- ආත්මීය භාවය හැදෙන ආකාරය අවබෝධකර ගැනීම
- අරමුණම ආත්මය බව දැකීම
- ශූන්‍යතා අවබෝධය
- ත්‍රිවිද්‍ය දැනගැනීම (පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතූපපාත ඥාණය, ආසවක්‍ෂය ඥාණය)
  (සිත = අරමුණ = ආත්මය)

**1.1** කල්‍යාණ මිත්‍රයාගෙන් පණිවිඩය අසා දැන ගැනීම
**1.2** නැවත නැවත සද්ධර්මශ්‍රවනය
**1.3** යෝනිසෝමනසිකාරය
**1.4** ධම්මානුධම්ම ප්‍රතිපදාව

ශ්‍රාවකයා උට්ඨාන වීරියෙන් කලයුතු දෙයින් වැඩි ප්‍ර තිශතයක් ඇත්තේ පූර්ව භාග ප්‍රතිපදාව තුලයි.

බුදුන් වහන්සේ කී පරිදි, නිවන් මඟයන ශ්‍රාවකයා කලයුතු සියල්ල හිමාලය පර්වතය නම්, පූර්ව භාග ප්‍රතිපදාවෙන් පසු තව කලයුතු වන්නේ අත ඇති ගල්කැටයක පමණ දෙයකි

සක්කාය දිට්ඨි ප්‍රහාණය මෙතැනදී සිදුවේ.

ශ්‍රාවකයා ආර්ය භූමියට පිවිසේ.

## 2. අපරභාග ප්‍රතිපදාව

**2.1.** **කෘත්‍යඥාණය** - අසාදැනගත් ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම (ධර්මය තමාතුලින් දැකීම = සතර සතිපට්ඨානය වැඩීම).

***2.1.1***. අරමුණෙහි සත්‍ය දැකීම; --දර්ශනය තුල සිත හැදෙන හැටි දකින ආකාරය ප්‍රායෝගිකව අත්දැකීම (යථාභූත ඥාණය = යෝනිසෝ මනසිකාරය)

***2.1.2***. අරමුණෙහි සත්‍ය දැක මිදීම

- අරමුණ සත්‍යක් නොවන බව ප්‍රායෝගිකව අත්දැකීම
- ඒ අනුව ආත්මයක් නැතිබව ප්‍රායෝගිකව අත්දැකීම
- සවිතක්ක සවිචාර සමාධිය අත්දැකීම (විදර්ශනා සමාධි.)

***2.1.3***. ත්‍රි විද්‍ය ප්‍රායෝගිකව අත්දැකීම (පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතුපපාත ඥාණය, ආසවක්‍ෂය ඥාණය)

**2.2.** **කෘතක්ඥාණය** (ශ්‍රාවකයාට කලහැකි කිසිවක් නැත. සොභාදහමේ අනාවරනයක් පමනි. ඥාණයට හසුවේ. බුද්ධ වචනයට අනුව මෙහිදී දැඟලුවහොත් පාරුව ගිලේ.) - සම්මා සමාධි, සම්මා විමුක්ති

ආත්මයක් නැතිබව ප්‍රායෝගික අත්දැකීමෙන්, මිදීම අත්දැකීම (ආත්මීය භාවයෙන් මිදීම නිසා ඇතිවන සමාධිමත් ස්වභාවය)

අවිතක්ක අවිචාර සමාධිය - අනිමිත්ත ශුන්‍යත අප්‍රනීත චේතෝ විමුක්තිය - අරහත්ත සමාධිය - නිස්සත්තෝ නිජ්ජීවෝ ශුන්‍යෝ

ශාන්ත ප්‍රනීත නිර්වාන සම්පත්තිය

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ, මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ. ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට ඔබට ද හැකියාව ලැබේ. බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ ඉන්නේ මිත්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිතද මායාවක් වන තැන

සිතේ මායාවෙන් මිදුනු තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජක්ධ බහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුළ සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ. මලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ. ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම් ඉදප්පච්චතාවයයි. එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව බුද්ධ ස්භාවයයි. දෙයක් නැති තැන චෙතෝවිමුක්තියයි. එනම් අනිමිත්ත, ශූන්‍යත, අප්පනිත චේතොවිමුක්තියයි.

ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශූන්‍යතාවයි.

"නිස්සත්වෝ නිස්ජීවෝ ශූන්‍යයෝ"

පහන නිවීගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන. ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි. ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පභං
එත්ථ ආපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති
විඤ්ඤාස්ස නිරෝධෙන - එත්තෙ තං උපරුජ්ජන්ති

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්. නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ. නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධූරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධූරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍යය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය 'බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව' තුළින් ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**අප කලයාණ මිත්‍ර මෙහෙණින් වහන්සේ**

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මේ උතුම් සත්කාරය සඳහා අර්ථයෙන්, ධර්මයෙන්
සියළුම ආකාරයෙන් උදව් උපකාර කළා වූ
සියළුම දනන් හට, මෙම ධර්ම දානය තුළින්
ජනිත වන්නා වූ පුණ්‍ය ශක්තිය
මේ ගෞතම බුද්ධ ශාසනයේ දී ම
ඒ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය
අවබෝධ කරගෙන සංසාර දුකින් මිදී
නිවනින් ම සැනසීම ලබන්නට
හේතු වේවා !

# පිදුම



පැහැදිලි ජලය ඇති
නොකැළඹුණු ගැඹුරු විල
යම් සේද, සද්ධර්මය අසා
පැහැදුණු සෘතවත් ආර්යය
ශ්‍රාවකයා ද එසේ ය.
මේ කය අසාර වූ පෙණපිඬක්
බඳු බව දැන, සිත මායාවක්
බව මනාව අවබෝධ
කොටගෙන, ඉමක් නැති
සසරේ ඉමක් ඇති බව
ප්‍රත්‍යක්ෂකොට, නිස්සරණ
මඟ ඇවිද යන්නට මේ
සත්‍ය ධර්මය අමාදම්
ගඟුලක් වේවා !
සියලු ලෝ සතහට.

# පටුන


| | | |
|---|---|---|
| 01. | අභිනන්ද සුත්‍රය | 01 |
| 02. | අරහත්ත සුත්‍ර | 10 |
| 03. | අවිජ්ජාපහාන සුත්‍රය | 29 |
| 04. | ඤාණ සුත්‍රය | 39 |
| 05. | ධම්මකථික සූත්‍රය | 49 |
| 06. | පරිඤ්ඤෙය්‍ය සුත්‍රය | 61 |
| 07. | පලෝක ධම්ම සුත්‍රය | 73 |
| 08. | බාල පණ්ඩිත සූත්‍රය | 83 |
| 09. | ලෝක සුත්‍රය | 92 |
| 10. | සක්කාය දිට්ඨිප්පහාන සුත්‍රය | 107 |

# 01. අභිනන්ද සූත්‍රය

**අභිනන්ද සූත්‍රය, සංයුක්ත නිකාය හතරවෙනි කාණ්ඩය බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාවේ 16 වැනි ග්‍රන්ථය, 27 වැනි පිටුව.**

"මහණෙනි, යමෙක් ඇස පිළිගනී නම්, "හේ තෙමේ දුක පිළිගනී." "යමෙක් දුක පිළිගනී" නම් "හේ තෙමේ දුකින් නොමිදුනේ යැයි කියමි." මේ "ඇස පිළිගනී" නම් දුක පිළිගනී" කියලයි බුදුන් වහන්සේ දේශනා කරන්නේ, ඇස කියන්නෙ පේන බවට මැරුණු කෙනාටත් ඇහැක් තියනවා, ඒ මස් ඇහැට නෙමෙයි බුදුන් වහන්සේ ඇස කියන්නෙ පේන බවට,"

**'යෝ භික්ඛවේ චක්ඛුං අභිනන්දති - දුක්ඛං සෝ අභිනන්දති'**

"යමෙක් ඇස පිළිගනී නම්" ඒ කියන්නේ ඔබට දැන් පේන්නෙ පොතක්, මේසයක්, ඇඳක්, පුටුවක්, අඹ ගහක්, නාගහක්, ගෙයක්, අහසත් පොළවත්. ඒ කියන්නේ 'ඇස පිළිගත්තා යි' කියන්නේ 'මේ පේන බව.' මේ පේන දේවල් පිළිගත්තා කියන එකයි. ඔබට පේන්නේ පොත අපි අර නිතරම කතා කරන උපමාව. පොත පිළිගත්තා නම් ඔබට ඇහැට පේන දේ ඔබ පිළිගත්තා වෙනවා. ඇහැට පේන දේනේ ඇහැ කියන්නේ, පේන බවට. එහෙනම් පේන බව, ඔබ ඇස පිළිගත්තා කියනකොට ඔබ එතන දුක පිළි අරගෙන

ඉවරයි. මේ අභිනන්ද සූත්‍රයේ මනාකොට පෙන්නනවා මේ හැම සූත්‍රයකම වාගේ බුදුන් වහන්සේ පෙන්වනවා, මේ ඇස, ඇස පිළිගත්තා කියන තැන 'දුක පිළිගත්තා' කියන එක වගේමයි. මේ ඇස හදන දේ අපි පිළිගත්තද කියන එක.

අපි සාමාන්‍ය කෙනෙක්ගේ ස්වභාවය තමයි පේන දේවල් මේ පොත තියෙන්නේ මේ මේසේ තියෙන්නේ, මේ බිත්තිය තියෙන්නේ, කියලා පිළිගන්න එක, ඒ ඇස පිළිගත්තා කියන එක. හැබැයි, මේ පොත කිව්වේ නැහැනේ පොත කියලා, මේසේ කිව්වේ නැහැ මේසේ කියලා, අපියි කියන්නේ එහෙම නම් අපි පේනවා නෙමෙයි, අපි හිතනවා, අපි හිතන දේවල් අපිට පේන දේවල් වෙන්න බැහැ. අපිට පේන්නේ ආලෝකයක්, අපි හිතන්නේ පොතක්. අපිට ඇහෙන්නේ සද්දයක්. අපි හිතන්නේ ඒ ශබ්දයට, මේ කපුටගෙ ශබ්දයේ කියලා අපි හිතන්නේ. එතකොට මේ ධර්මය තුළ, මේ ධර්මය නොදන්න කෙනා රැවටෙන කෙනා දුකේ ඉන්නේ දුකින් මිදීමක් නැහැ, ඒ කියන්නේ අභිනන්දනය කරනවා කියන්නේ, පේන බවම අභිනන්දනය කියන්නේ, පොත කියන බවමයි අභිනන්දනය කියන්නේ. යමෙක් දුක පිළිගනී නම් හෙතෙමේ දුකින් නො මිදේ, අන්න දුක පිළිගත්තා කියන්නේ මේ දුකින් මිදීමක් නැහැ කියන්නේ.

'**යෝ භික්ඛවේ චක්ඛුං අභිනන්දති,**' යම් භික්ෂුවක් චක්ඛුං ක්ෂය අභිනන්දනය කරයි ද **චක්ඛුං සෝ අභිනන්දති, දුක්ඛං සෝ අභිනන්දති,** ඒ කියන්නේ දුක තමයි එයා පිළිගත්තා කියන්නේ අභිනන්දනය කරා කියන්නේ. **යෝ දුක්ඛං අභිනන්දති අපරි මුත්තෝ සෝ දුක්ඛස්සාති වදාමි.** යමෙක් දුක් පිළිගනී නම් ඒ තෙමේ දුකෙන් නොමිදුනේ යයි කියමි.

ඒ විදියට අනිත් ආයතන වලටත් කියනවා. කන, යමෙක් කන පිළිගනී නම් හෙතෙම දුක පිළිගනී කනට ඇහෙන ශබ්දය ඇත්ත කරගත්තා කියන්නේ දුකයි. අපි කිව්වා අපි හදාගෙන බලන දේ බාහිර තියෙනවා කියලා ගැටග හන එකයි රැවටීම කියන්නේ. ඒකයි විඤ්ඤාණ මායාව. එතකොට බාහිර තියෙනවා කියලා ගත්ත නිසයි අපිට මේ ඇහෙන අරමුණු එන ශබ්ද හැමදේම අපිට තියෙනවා කියලා ගත්තොත්. එහෙනම් අපි ඉන්නේ දුකේමයි, එහෙනම් අපිට දුකින් මිදීමක් නැහැ. ඒකයි මේ බුදුන්වහන්සේ පෙන්වන්නේ,

**"යෝ දුක්ඛං අභිනන්දති අපරි මුත්තෝ සෝ දුක්ඛස්සාති වදාමි,**
**යෝ සෝතං අභිනන්දති, දුක්ඛං සෝ අභිනන්දති"**

කන පිළිගත්තා නම් දුකයි පිළි අරගෙන තියෙන්නේ **"යෝ දුක්ඛං අභිනන්දති අපරි මුත්තෝ සෝ දුක්ඛස්සාති වදාමි, යෝ ඝානන් අභිනන්දති දුක්ඛක්සෝ අභිනන්දති, යෝදුක්ඛං අභිනන්දති අපරි මුත්තෝ සෝ දුක්ඛසාති වදාමි, යෝ ජිව්හං අභිනන්දති දුක්ඛං සෝ අභිනන්දති යෝ දුක්ඛං අභිනන්දති අපරි මුත්තෝ සෝ දුක්ඛසාති වදාමි, යෝ කායං අභිනන්දති දුක්ඛං සෝ අභිනන්දති යෝ දුක්ඛං අභිනන්දති අපරි මුත්තෝ සෝ දුක්ඛසාති යෝ මනං අභිනන්දති යෝ දුක්ඛං සෝ අභිනන්දති යෝදුක්ඛං අභිනන්දති අපරි මුත්තෝ සෝ දුක්ඛසාති වදාමි."**

ඉතින් මේ ආයතන හයම එක විදියට මයි ඒ ආයාතන වලින් මේ අරමුණු, අපි අරමුණු පිළිගත්තොත් මේ ඇස පිලිගත්තා කියන්නේ ඒ දුක පිලිගත්තා කියන එකයි, මේ කන පිලිගත්තා කියන්නේ දුක පිළිගත්තා කියන එකයි, ඇස

කියන්නේ පේන බවට කන කියන්නේ ඇහෙන බවට, ඒ වගේමයි ගන්ධය, රසය, මේ කාය ප්‍රාසාදය, උණුසුම සීතල මෙන්න මේ අපි හිතන දේ තියෙනවා කියලා ගත්තොත්, එතන තියෙන්නේ රැවටීමක්. මේ ධර්මය තුළ පේනවා නෙමෙයි හිතනවා. ඇහෙනවා නෙමෙයි හිතනවා, හැබැයි පේන තැනත් දෙයක් නැහැ හිතන තැනත් දෙයක් නැහැ, එහෙම උනොත් තමයි අපට දුකෙන් මිදෙන්න පුළුවන් වෙන්නේ. ඒක මේ ධර්මය දන්න කෙනාටයි දැනගත්ත කෙනාටයි වැටහෙන්නේ. එහෙනම් ඔබ දුකෙන් මිදෙන්න ඕන නම්, මේ සත්‍යය දැනගත යුතුමයි. පේන තැන දෙයක් නැති බව,

දෙයක් තියෙන තැන ධර්මය නැති බව එහෙනම් පොත, මේසය, ඇඳ, දුව, පුතා කියන තැන මේ ධර්මය ඔබට හමුවන්නේ නැහැ, එහෙම නම් බාහිර දෙයක් අන්තයක්. ඇත නැත කියන අන්ත දෙකින් මිදුණු ධර්මයක් ඔබ ඇසුරු කරන්නේ. එහෙනම් දෙයක් කියලා දෙයක් නැති බවයි ධර්මය කියන්නේ ඒකයි '**යේ ධම්මා හේතු භගවා තෙසං හේතු තථාගතෝ**' කිව්වේ මේ ප්‍රතිබිම්බය තමා හැදුවෙත් නැහැ වෙන අයෙක් හැදුවෙත් නැහැ "අර සේලා තෙරණිය දේශනා කරන්නෙ" '**නහිදං අත්ත කතං බිම්බං නහි දං පරකතං අගං හේතුන් පටිච්ච සංභූතා හේතු නිරුජ්ජා - නිරුජ්ජති**' හේතුඵල දහමක් හේතු තියෙන නිසයි තියෙන්නේ ආලෝකය නිසයි පේන්නේ ආලෝකය නැත්නම් අපිට පේන්නෙ නැහැ.

මෙන්න මේ පුංචි දහම් පණිවිඩය ඉතාම වැදගත්. අපි දෙයක් කියලා දකිනවා නම් ඒ දකින්නේ දුකමයි. ඒකයි අපි කිව්වේ බාහිර දෙයක් ගත්ත තැනයි භවය තියෙන්නේ. හැබැයි එහෙම දෙයක් හමු නොවුන තැන අපි බෞද්ධයෙක්

වෙනවා, භව නිරෝධය දකිනවා, එහෙම වුණොත් තමයි අපිට දුකෙන් මිදීමක් තියෙන්නේ, නැත්නම් අපිට '**සම්මා දිට්ඨියක්**' කවදාවත් හමුවන්නේ නැහැ. බාහිර දෙයක් ඇසුරු කරන කෙනෙක්ට "සම්මාදිට්ඨිය" හමුවන්නේ නැහැ **මිත්‍යාදෘෂ්ටියමයි.** මහණෙනි, යමෙක් ඇස නොපිළිගනී හේතෙමේ දුක නොපිළිගනීම් කියමි.

**"යෝ චෝ බෝ භික්ඛවේ චක්ඛුං නාභිනන්දති - දුක්ඛං සෝ නාභිනන්දති - යෝ දුක්ඛං නාභිනන්දති - පරිමුත්තෝ සෝ දුක්ඛස්සාති වදාමි,"**

ඒ කියන්නේ යම් කෙනෙක් ඇස නොපිළිගනී නම්, හේතෙමේ දුක නොපිළිගනී වදාමි. "යමෙක් දුක් නොපිළිග නී නම් හේතෙමේ දුකෙන් මිදුනේ" යැයි කියමි.

"යමෙක් කන නොපෙනී නොපිළිගනී නම් හේතෙමේ දුක නොපිළිගනී වදාමි." "යමෙක් දුක් නොපිළිගනී නම් හේතෙමේ දුකෙන් මිදුනේ යැයි කියමි."

"යමෙක් නහය නොපිළිගනී නම් හේතෙමේ දුක නොපිළිගනී, යමෙක් දුක නොපිළිගනී නම් හේ තෙමේ දුකින් මිදුනේ යැයි කියමි.

"යමෙක් මේ දිව නොපිළිගනී නම් හේතෙමේ දුක නොපිළිගනී යමෙක් දුක නොපිළිගනී නම් හේතෙමේ දුකෙන් මිදුනේ යැයි කියමි.

"යමෙක් කය නොපිළිගනී නම් හේතෙමේ දුක නොපිළිග නී යමෙක් දුක නොපිළිගනී නම් හේතෙමේ දුකෙන් මිදුනේ යයි කියමි."

මෙන්න මේ විදියට අපේ මේ සෙන්සස් 5 මේ පංචායතනය **ඇස, කන, දිව, නාසය, කය.** මෙන්න මේ ඇස කන දිව නාසය කය මන කියන මේ ආයතන හයෙන්. අපි එහෙම ගත්තොත් මේ ආයතන හයෙන්ම අපිට එන අරමුණු අපි පිළිගන්නේ නැත්නම් අපේ මේසයක්, පුටුවක්, ගෙයක්, දොරක්, ඉරක්, හඳක්, මේවා අපි දාගත්ත සද්ද ටිකක්, වර්ණ ශබ්දයි එකතුවෙලා හැදුනු මේ චිත්තය ගැන හොඳ අවබෝධයක් ඔබට තියෙනවා නම්, ඔය එකකින්වත් අපට පලක් නැහැ නේද? ඒ එකකින්වත් අගයක් වටිනාකමක් ඇති වෙන්නේ නැහැ නේද? අපිට පලක් නැහැ කිව්වොත් ඒක ආත්මීය වචනයක් වෙනවා.

මේ ධර්මය අනාත්ම ධර්මයක් ආත්මීය කතාවක් නැහැ. මෙතනම හටගෙන නිරුද්ධ වෙන ධර්මතාවයක කොහෙන්ද ආත්මීය දෙයක්, ඒක හොඳින් අපි දේශනා කළා **ලෝක සූත්‍රයෙන්.** මේ '**සුඤ්ඤ ලෝක සූත්‍රය**' ඒ විතරක් නෙවෙයි හැම තැනම බුදුන් වහන්සේ පෙන්වන ධර්මය එකම න්‍යායයි මේක අනාත්මය ධර්මයක් ආත්මීය ඇසකට පේන්නේ නැහැ. මේ ධර්මය ආත්මීය ඇසකට දැකිය නො නොහැකිය යමෙක් දුක් නොපිළිගනී නම් හේ තෙමේ දුකින් මිදුනේ යැයි කියන්නේ, ඇස නොපිලිගත්තොත් ඒ කියන්නේ, ඇසින් දෙයක් දැකලා පොතය කියලා අල්ලා ගත්තොත් එතනමයි දුක තියෙන්නෙ, ඇසින් දෙයක් දැකලා ඒක බාහිර පොත, පොත කියලා ගත්තොත් බාහිර අභ්‍යන්තර කෙසේ වෙතත් පොතක් තියෙනවා කියලා ගත්තොත් ඒක දෙයක් කර ගත්තොත් ඒ කියන්නේ දුකයි. ඇසට දෙයක් කෙනෙක් හමුනොවන තැන ඒ ඇසින් මිදිමයි,

බාහිය තාපස තුමාට ඒ දීපු පඤිවිධය ඒකයි. බුදුන් වහන්සේ බාහිය තාපස තුමාට දේශනා කරපු ධර්මය ඉතාම

කෙටි ඉතාම සෘජු වටිනා ඒ මුළු සාරාංශයම මේ ධර්මය තුළ තියෙන සියල්ලම එතන තියෙනවා. **'දිට්ඨේ දිට්ඨ මත්තං, සුතෙ සුත මත්තං, මුතේ මුත මත්තං, විඤ්ඤාතෙ විඤ්ඤාත මත්තං,'** කියපු තැන බාහිය දුටු දෙයක් නැහැ අන්න ඒකත් මෙතනම අපිට පේනවා, මහණෙනි යමෙක් ඇස පිළිගනී නම් හෙතෙම ඒ දුක පිළිගනී අන්න බාහියට කියනවා බාහිය දුටු දෙයක් නැහැ එහෙනම් ඇස පිළි නොගත්තා වෙනවා, දුටු කෙනෙක් නැහැ, එහෙම වුනොත් දකින කෙනෙකුත් නැහැ, බාහිර දෙයක් තිබ්බොත් තමයි දකින කෙනෙක් ඉන්නේ එහෙම වුනොත් තමයි ආත්ම කතාවක් තියෙන්නේ. බාහිර දෙයක් නැත්නම්, දකින කෙනෙකුත් නැහැ, දෙයක් අන්ත දෙක. ඇත නැත කියන්නේ බාහිර දෙයක් තිබ්බොත් මේ පැත්තෙ මම ඉන්නේ බාහිර දෙයක් නැත්නම් මෙතන මමත් නැහැ අර කණ්ණාඩියට වැටුණු ප්‍රතිබිම්බය බාහිර දෙයක් නැත්නම් ප්‍රතිබිම්බයට වැටෙන්න දේකුත් නැහැ. එහෙනම් ප්‍රතිබිම්බෙත් නැහැ අන්න මම ඉන්නේ දෙයක් තියෙන නිසයි. දෙයක් නැත්නම් මමත් නැහැ දෙයක්මයි ඒකමයි මම කියන්නේ. ඒක නැත්නම් මමත් නැහැ. අන්න ගැඹුරු දහම් මෙතන හොඳින් පෙන්නුම් කරනවා.

**'නාභිනන්දති යෝ දුක්ඛං නාභිනන්දති පරිමුත්තෝ සෝ දුක්ඛස්සාමිති දුක්ඛස්සාති වදාමි, යෝ මනං නාභිනන්දති දුක්ඛං සෝ නාභිනන්දති යෝ දුක්ඛං නාභිනන්දති පරි මුත්තො සෝ දුක්ඛස්සාති වදාමි'** අන්න දැන් දුකෙන් මිදෙන්නේ දෙයක් කියලා දෙයක් හමුනොවන තැනයි. ඇස පිළි නොගනී නම් ඒ දුකින් මිදීමයි ඒකයි මේ අභිනන්දන සූත්‍රයේ තියෙන වටිනාකම.

ඉතාම කෙටි දහම් පණිවිඩයක් වුණත් ඒ ධර්මය පිරිසිදුව මෙතැන තියෙනවා "**යෝ භික්ඛවේ චක්ඛුං අභිනන්දති - දුක්ඛං සෝ අභිනන්දති**' කියන තැන. යමෙක් ඇස පිළිගනී ද, එය දුකෙහි පිළි ගැනීමයි. '**යෝ දුක්ඛං අභිනන්දති අපරි මුත්තෝ සෝ දුක්ඛස්සාති වදාමි**,' යමෙකු ඇස පිළිගනි නම්, ඒ දුක පිළිගැනීමයි. යමෙක් දුක පිළිගනි නම්, ඒ තෙමේ දුකෙන් නෝ මිදුණේ යයි කියමි. අන්න දෙයක් දැක්කොත්, දකින්නේ දුකක්මයි, දුකමයි නැතිවෙන්නේ කියන එක. හටගන්නේ දුකමයි, පවතින්නේ දුකමයි, නැති වෙන්නේ කිච්චේ එකයි. ඉතින් මේ ආයතන හයෙන් එන කිසිම අරමුණක හරයක් අපට හමුවන්නේ නැහැ. මේ සත්‍ය ධර්මය දකියි නම්, පොත කියන ශබ්දය තුළ කොහෙන්ද දෙයක්? එතුළ දෙයක් හමුවෙන්නේ නැහැ, දැන් ඔබට පැහැදිලියි **අභිනන්දති** කියන වචනය අභිනන්දනය කරනවා කියන එකක් ම නෙමෙයි. පොත කිව්වොත්, ඒ තියෙන්නේ දුකක්මයි. ඇලීමයි - ගැටීමයි කියන එකයි අභිනන්දනය කියන්නේ. එහෙනම් මේ ධර්මය පැහැදිලිව ම බාහිර දෙයක් නැති බව දකිනවා වගේම, දෙයක් කියලා දෙයක් හමු නොවන බව ධර්මය කියන්නේ දෙයක් නැති බවයි. ඒකයි අපි පැහැදිලි කළේ ධර්මය කියන්නේ දෙයක් නෙමෙයි කියලා.

'**ඉදංපච්චතා ඉමස්මිං සති ඉදං හෝති. ඉමස්මිං අසති ඉදං නහෝති, ඉමස්ස උප්පදා ඉදං උප්පජ්ජති, ඉමස්ස නිරෝධා ඉදංනිරුජ්ජති.**'

"මෙය ඇති කල්හි, මෙය වේ." "මෙය නැති කල්හි, මෙය නොවේ." "මෙය ඉපදුන කල්හි, මෙය වේ." "මේ නිරුද්ධ වන කල්හි, මෙය නිරුද්ධ වේ" කියන්නේ සමීකරණයක් මේක. හොඳින් බැලුවොත් ලිහල මෙතන දෙයක් නැති බවයි

කියන්නෙ. හේතුන් **'පටිච්ච සම්භූතා - හේතු - නිරුද්ධා නිරුජ්ජන්ති'** කියන්නේත් ඒකමයි ඒ හේතුඵල දහම තුළ දෙයක් නැහැ. ඇත කිව්වත් වැරදියි. නැත කිව්වත් වැරදියි. දෙයක් නැහැ. පොත කියලා දෙයක් නැහැ. අන්න, දෙයක් නැති ධර්මය මනාව පිරිසිදුව දකින්න. ඔබට පේන ඇහෙන දැනෙන හැම දේකම දෙයක් නොදකිනවා නම්, ඔබ ඉන්නේ දහම් මාර්ගයේ. ඒකාන්තයෙන් ම ඔබ නිවන් දකිනවාමයි. එයයි නිවැරදි නිවන් මඟ.

අපිට දෙයක් හමු නොවන තැනයි, සියලු දුකෙන් මිදෙන තැනත් එතැනමයි, සිතෙන් මිදෙන තැනත් එතැනමයි. දුකෙන් මිදෙන තැනත් එතැනමයි, නිවන් මගත් එතැනමයි, සිතෙන් මිදෙන තැන දුකෙන් මිදෙන තැන නිවන් දකින මග, සිතට එන අරමුනේ සත්‍ය දැකලා මිදෙන තැන එයයි නිස්සරන මඟ.

එහෙනම් තෙරුවන් සරණයි!!!

# 02. අරහත්ත සූත්‍ර

**අරහත්ත සූත්‍රය සංයුක්ත නිකායේ තුන්වෙනි කාණ්ඩයේ බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාවේ පහළොස් වැනි ග්‍රන්ථය ස්කන්ධ සංයුක්තියෙහි ඛජ්ජනීය වග්ගය අරහත්ත සූත්‍රය එකසිය හතලිස් පස් වෙනි පිටුව**

**මහණෙනි, රූපය අනිත්‍යයි, යමක් අනිත්‍ය ද, එය දුකයි, යමක් දුක් ද එය අනාත්ම යි, යමක් අනාත්ම ද, එය මම මගේ, මගේ ආත්මය ලෙස ගත නොහැකිය, මෙසේ සම්‍යක් ප්‍රඥාවෙන් දැක යුතුයි. වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ අනිත්‍යයයි ලෙසද, අනිත්‍ය නම් එය දුක ලෙස ද, යමක් දුක නම් එය අනාත්ම ලෙසද යමක් අනාත්ම ද, එය මම මගේ, මගේ ආත්මය ලෙස ඇති සැටි සම්‍යක් ප්‍රඥාවෙන් ගත නොහැකි බව ඇති සැටි සම්‍යක් ප්‍රඥාවෙන් දැක යුතුය.**

(අරහත්ත සූත්‍රය)

එතකොට අපි මේ කතා කරන්නේ අරහත්ත සූත්‍රය. ඒ කියන්නේ රහ නැති, වෙන තැන අරහත්තයි. ඒ අරහත්ත කියන්නේ, රහ නැති වෙන එකටයි. අරහත්ත කියන්නේ, කෙනෙක් පුද්ගලයෙකු නොවේ. අරහත්වය කියන්නේ මේ සියල්ලේම තෘෂ්ණාව, තණ්හාව ක්ෂය වෙන තැන. ඒ අරහත්වය රහ නැතිවන ස්වභාවයට පත්වීමයි, එතකොට මෙතනින් හොඳට ඔබට දකින්න ලැබෙනවා. මේ පැහැදිලි

කළ කාරණාව. මහණෙනි, රූපය අනිත්‍යය **"රූපං භික්ඛවෙ, අනිච්චං යදනිච්චං තං දුක්ඛං,"** එය **අනිත්‍ය** නම් එය දුකයි **යං දුක්ඛං, තදනත්තං.** එහෙම නම් ඒක අනාත්ම යි **"යදනත්තා තං, නෙතං මම, නෙසො හමස්මිං, න මෙසෝ අත්තාතිං"** අපි කිව්වා අපිට මේ පේන දේ දකින දේ එය සත්‍යයක් නොවන බව. අපි මේ හදාගත්ත දෙයක්. දකින බව පේන්නේ අපිට අඹ ගහක් නෙමේ පේන්නේ චිත්‍රයක්. කණ්ණාඩියට වැටෙන්නේ ප්‍රතිබිම්භයක්. ඒ තුළ නැහැ දෙයක්. මේසය, පොත්, ඇඳ, දුව මේවා ශබ්ද. **අර වර්ණයි ශබ්දයි** එකට එකතු වෙන එක. වර්ණය, ශබ්දය - දිට්ඨ, සුත, මුත වර්ණ ශබ්ද සහ දැනීම් එකට **සම්පටිච්ච** වන එක. අන්න ඒ නිසා අපට දැන් එක දෙයක් වෙන්වෙන්නේ නැහැ.

මේකෙ තියනව ශබ්ද වර්ණ දැනිම් ටික. අපි මේවා, අපි කීවා මහා භූත නිසා සකස් වුණු ඒ උපාදාය රූපය. ඒක සකස් වුණේ කොහොමද? ස්පාර්ක් වීම තුළ, ප්‍රසාදවත් වීම් තුළ, දැන් කියන වචනය අපි නූතන වචනය ස්පාර්ක්. බුදුන් වහන්සේ පෙන්නුවා මේ ප්‍රසාද වත් වීම ප්‍රසාද රූපයක්, රූප කලාප පණස් සතරෙන් හැදෙන්නේ ප්‍රසාද රූපයක් අපි ඒක පෙන්නුවා **කම්ම චිත්ත ඍතු ආහාර** කියලා දශක දශක විදියට බෙදලා. බුදුන් වහන්සේ පෙන්නුවා රූප කලාපය පනස් හතරක්. **ශුද්ධාෂ්ඨකය** ඔබ දන්නවා. **පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා** කියලා මේ විදියේ රූප කලාප 54 කින් ප්‍රසාද රූපයක් හැදෙන්නේ. ඒ කියන්නේ ප්‍රතිබිම්බයක් බාහිර තියන එකක් නෙමෙයි. ඒක මහා භූත ඇසුරු කරගෙන හැදුනු උපාදාය රූපයක්, ඒ කියන්නේ හදාගත්ත එකක් සංකතයක් සකස් කර ගත්ත එකක් සංඛාරයක්, සංඛාරයක් කොහේවත් නැහැ, ඒක චිත්තයක්, මේ අපි ඇසුරු කරන්නේ සිතුවිල්ලක්.

අඹ ගහ කිව්වේ නැහැ, අඹ ගහ කියලා. අපි කියන්නේ අඹ ගහ කියලා. එහෙම නම් ඒක බාහිර තියෙන රූපය නෙමේ **'නතේ කාමායානි චිත්‍රානි ලෝකෝ සංකප්ප රාගෙ ා් පුරිසස්ස කාමෝ** ඒ පුරුෂයගේ සංඛාර, සංකප්ප ලෝකේ **ඉන්නේ චිත්තේන නීයති ලෝකෙ** ඉන්නේ, **මනෝ පුබ්බංග මා'** මේ ධර්මය, එහෙනම් මෙන්න මෙතනයි **චක්ඛුං නිච්ච වෝ අනිච්චතෝ අනිච්චං භන්තේ** කියන්නේ ඔබ බාහිර ඇත්ත කරගෙන නං ඔබ බෞද්ධයෙක් නොවේ. බෞද්ධයෙක් කියන්නේ බාහිර ඇත්තක් නොවන බව දකින තැනයි. **අජ්ඣත්ත බහිද්ධා** කියලා අන්ත දෙකක් පෙන්නලා ඒ දෙකටම අයිති නැති ධර්මයක් දේශනා කළා. **බුදුන් වහන්සේ** ඇත කිව්වත් වැරදියි මහණෙනි, නැත කිව්වත් වැරදියි මහණෙනි, **තියෙන දෙයක් නැහැ මහණෙනි, තියන ලෝකයක් නැහැ** මහණෙනි, අන්න බුදුන් වහන්සේ, **හේතුන් පටිච්ච සම්භූතා හේතු භංගා නිරුජ්ජතී** කියන ඒ හේතු ඵල දහම දේශනය කළා. **යේ ධම්මා හේතු භගවා තේසං හේතු තථාගතෝ** ඒ අස්සජි මහරහතන් වහන්සේ අන්න පැවසුවා.

ඒ තථාගතයන් වහන්සේ හේතුඵල දහමක් දේශනා කරනවා ධම්මචක්කපවත්වන සූත්‍රයේ **පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු** වූ කියලා පෙර නොඇසූ විරූ දහමක් ලෙසින් බුදුන් වහන්සේ දේශනා කරන්නේ **අජ්ඣත්ත බහිද්ධා** කියලා අන්ත දෙකක් පෙන්නලා ඒ අන්ත දෙකට ම අයිති නැති ධර්මයක් එහෙනම් බාහිර තියන දේ සත්‍යයක් ද?, නෑ **"චක්ඛුං නිච්ච තෝ අනිච්චතෝ" "අනිච්චං භන්තේ" "රූපං නිච්ච තෝ අනිච්චතෝ," "අනිච්චං භන්තේ."** ඇස අනිත්‍ය නම් මහණෙනි, ඇස කියන්නෙ පේන බවට, මස් ඇහැට නෙමෙයි. පේන බව නම්, අපට උපමාවක් ලෙසට ගත්තොත්

මේ පොත, පොතක් බාහිරින් හමුවෙනවද? පොතක් බාහිරින් හමු වෙනවා නම් පොත බාහිර ඇත්ත කර ගත්ත කෙනෙක්ට මේ ධර්මය හමුවෙන්නේ නැහැ. අන්න, අපි හිතන ධර්මයක්. පොත කියන්නේ ශබ්දයක්. **ශබ්දයයි වර්ණයයි එකතු වෙලා හැදෙන ශබ්ද තරංගයි, වර්ණ තරංගයි එකතුවෙලා හැදෙන චිත්ත තරංගයක් අපි ඇසුරු කරන්නේ.**

විඤ්ඤාණ මායාව, අර සංඛාර එකතු කරලා හදාගත්ත. අපට දැන් පේන කොටම එනවා ශබ්දය, **ඒකයි නාමරූප.** අපි හදාගත්ත එකක්. බාහිර කියලා ගත්ත එකයි **අජ්ඣත්ත බහිද්ධා** කියන එක, බාහිරට ගැටගහලා. අපි දැන් තියනවා කියලා හිතීම, ඒ දැනිමයි, අර වේගයෙන් රූප ස්පාර්ක් වෙන එක. වේගයෙන් රුප්පනය වෙන එක. **රුප්පත්ති කෝ ආවුසෝ රූපං** කියපු එක. වේගයෙන් රුප්පනය වීම තුළ අපට දෙයක් හමු වෙනවා. **රුප්පතිකෝ ආවුසෝ රූපං වදෙති රූපං රූපත්තාය සංඛතං අභිසංකාරෝති** කියපු ආකාරයට අපිට අද රූපයක් පේනවා දෙයක් පේනවා දෙයක් කියලා දෙයක් නෑ කොහේවත් නැහැ. ඒකයි සංඛාරය, **ඒකයි විඤ්ඤාණ මායාව ඒක දකින කෙනා අන්න සෝතාපන්න මාර්ගයට එනවා.**

බාහිරයෙන් දෙයක් නැති බව දකිනවා, ඒක සිතුවිල්ලක් බව දකිනවා, චිත්තයක් බව දකිනවා, එහෙම දෙයක් බාහිරෙන් හමුවන්නේ නැහැ. මේ සත්‍යය දකින එක පහසු නැහැ. **පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු** කියලා පෙර නො ඇසූ විරූ දහමක් ලෙසින් බුදුන් වහන්සේ ලෝකයට හෙළි කරන ධර්මයයි. **මේ එයයි බුද්ධ දර්ශනය.** එයයි බාහිර ඇත්ත කරගත්ත තැන බෞද්ධයෙක් නෑ කීවෙ. සතා සිවුපාවා ඉන්නේ බාහිරය

ඇත්ත කරගත්ත තැන සියලු ආගම් තියෙන්නේ බාහිර ඇත්ත කරගත්ත තැන. නමුත් බුදුන් වහන්සේ ලෝකයට හෙළි කරන ඒ ධර්මය නම්, ඇත කිව්වත් වැරදියි, නැත කිව්වත් වැරදියි, තියෙන ලෝකයක් නෑ මහණෙනි, **හේතුං පටිච්ච සම්භූතං හේතු නිරුජ්ජන් නිරුජ්ජන්ති** අන්න හේතුඵල දහමක් දේශනා කරනවා සම්භූත වෙන කියන වචනයත් ලෝකයට හෙළිකරනවා.

බුදුන් වහන්සේ, තියෙන දෙයක් නෙමේ **සම්භූත** වෙනවා කියන්නේ **සංඛතයක්.** සකස් වෙන දෙයක්, චිත්තයක්, සිතුවිල්ලක්. අපි දකින්නේ අපි හීනෙනුත් සිතුවිලි දකිනවා. බුදු අම්මෝ කියලා කෑ ගහන්නේ හීනෙන් කාගෙ න් හරි ගුටි කෑවොත්. ඔබ, ඇයි ඔබ සැප දුක් විඳ නැද්ද හීනෙන්? ඒ කියන්නේ හිනෙනුත් සැප දුක් වින්දා. ඒකමයි ඇත්ත ලෝකෙත්, සිතුවිල්ලකින් මයි සැපදුක් විඳින්නේ. ඒකයි **චිත්තේන නීයතී ලෝකෝ** කියලා කියන්නේ.

එහෙනම් මහණෙනි මේ කොටසින් ඔබට දකින්ට ලැබෙනවා රූපය අනිත්‍ය නම් එය දුකයි. බාහිරින් පේන දේ සත්‍යයක් නොවේ. එහෙනම් එතන දුකමයි හටගන්නේ, දුකමයි පවතින්නේ, දුකමයි නිරුද්ධ වෙන්නෙ. මොකද? නැති දෙයක් තියෙනවා කියලා හිතීම, නැති දෙයක් තියෙනවා කියලා ගැනීමයි දුකට හේතුව. අන්න **සමුදය** දෙයක් කියලා ගත්ත එක. අන්න, එතන මයි දුක හටගන්නේ. අන්න, ඒකෙ සත්‍යය දකින කෙනා, එහෙම දෙයක් නැති බව නිරෝධය අන්න **නිරෝධයට** පත් වෙනවා. අන්න ඒකෙන් මිදෙනවා. සිතුවිල්ලෙන් මිදෙනවා අන්න එතනයි දුකෙන් මිදෙන තැන. අන්න, ඒ දැකීමයි, **දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය** අන්න චතුරාර්ය සත්‍යය.

සමුදය බාහිර දෙයක් කියලා ගැනීම එතැනමයි දුක්ඛ සත්‍යය, තණ්හාව ජාති ජරා මරණ ශෝක පරිදේව සියල්ලේම බාහිර දෙයක් තිබ්බොත් ඒකටයි ඇලෙන්නේ ගැටෙන්නෙ රාග ද්වේශ මෝහ සිත් හටගන්නේ, එතැනමයි දුක එතැනමයි උපාදාන, එතනමයි ජාති ජරා මරණ, එතැනමයි භවය, බාහිර දෙයක් තියෙනව නම් එතැන භවය තියනවා ජාතිය තියෙනවා උපත මරණ දෙකම එතනම දෙයක් කරගත්ත තැනයි දුක තියෙන්නෙ. එහෙනම් දුකින් මිදෙන්න සත්‍ය දකින තැනයි එහෙනම් දුකින් මිදෙන්න සත්‍ය දකින්නේ එතනයි. බාහිර දෙයක් නැති බව දකින තැන පිරිසිදු **ශ්‍රී සද්ධර්මය** ඔබට මුණ ගැහිලා තියෙනවා.

දැන් මේ ධර්මය සූත්‍රවල ඔබට දකින්න ලැබෙනවා අපි මනා කොට ඒවා හෙළි කරගෙන යන්නේ. ඒ ඔබ දකින්නේ ධර්මයයි එහෙනම් '**රූපං භික්ඛවේ අනිච්චං, යදනිච්චං තං දුක්ඛං.** රූපය අනිත්‍ය නම් මහණෙනි එය දුකයි. **රූපය කියන්නේ එන අරමුණේ ශබ්ද රූප, වර්ණ රූප, ගන්ධ රූප, රස රූප, පොට්ඨබ්බ රූප.** එහෙනම් රූපය කියලා ගන්නේ, බාහිර දෙයක් කියලා ගත්ත තැනමයි, අරමුණ කියන්නේ. **එහෙනම් බාහිර දෙයක් නැති බව දකින තැනමයි,** රූපය **අනිච්චං කියන්නේ. අනිත්‍යය දකිනවා කියන්නෙ, බාහිර දෙයක් නැති බව දකින තැනයි. දෙයක් තියෙනවානන් ඒ රූපය ඇත්ත කරගත්ත තැනයි.**

එහෙනම් '**විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දෝමනස්සං කායේ කායානුපස්සී විහරති**' කියන විදියට ලෝකය ඇත්තක් නොවන බව දකින්නයි සතර සතිපට්ඨානය වඩන්නේ. එහෙනම් ලෝකය ඇත්තක් නෙවෙයි, අපි හදාගත්ත දෙයක් දකින්නේ. ඒකයි පේනවා නෙමෙයි හිතනවා කියලා

කියන්නේ. එහෙනම් චිත්තයක් අපි ඇසුරු කරන්නේ. **රූපං භික්ඛවේ අනිච්චං යදනිච්චං තං දුක්ඛං;** අනිත්‍ය නම් එය ඇත්තක් නෙමෙ නම් මහණෙනි එය දුකයි. එහෙනම් මහණෙනි දුක නම් එය **තද නත්තං ආත්ම වශයෙන් ගත හැකිද?** මෙතන ආත්ම කතාවක් නැහැ. අනාත්ම ධර්මය ලෝකයට හෙළි කරනවා. **හේතුන් පටිච්ච සම්භූතා හේතු නිරුජ්ජන් නිරුජ්ජති** කියන්නේ ආලෝකය තියන විට පේනවා. ආලෝකය නැත්නම් පේන්නෙ නැහැ. එහෙනම් මේ පේනවා කියන එක කවුරුත් කරනවා නෙවෙයි. හේතුව තියෙනකොට තියෙනවා නැති වෙනකොට නැති වෙනවා. සොබාදහමක්. දෙයක් කියලා දෙයක්, නැති බවයි. **ඉඳන් පච්ච් තාවය,** මෙය ඇති කල්හි මෙය වේ. මෙය නැති කල්හි මෙය නොවේ. මේ හටගත් කල්හි මෙය හට ගනී. මේ අය නිරුද්ධ වන කල්හි මෙය නිරුද්ධ වේ. අන්න, **ඉදං පච්චච තාවය** කියන්නේ දෙයක් නැති බවයි, පොත, මේසේ, ඇඳ, දුව, පුතා, ඉර, හඳ, ගහකොළ දෙයක් කියලා ගත්ත තැන දුකයි තියෙන්නේ. දෙයක් නැති බව දකින තැනයි **පටිච්ච සමුප්පාදය මෙනෙහි කරනවා** කියන්නේ. **හටගන්නා ආකාරය සිහි කරන එකයි.** අවිද්‍යාව නොදන්නාකම සංඛාරා එකතු කරගත්ත නාමරූප. අන්න එකතු වුණ තැනයි සංඛාර එකතු වුණ එකයි, ඒකමයි විඤ්ඤාණය කියන්නේ. ඒකමයි ආයතන කියන්නේ ඇස කියන්නෙ පේන බව කියන්නේ මේ මොහොතේ සිතට එන අරමුණයි මේ සියල්ලම අරමුණයි සිත කියන්නේ එහෙනම් අරමුණුයි, මේ සියල්ලම. එහෙනම් **ඵස්ස පච්චයා වේදනා, තණ්හා, උපාදාන, ඵස්ස, පච්චයා වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ** කියන ස්කන්ධයෙන් තමයි පොතක් හදා ගත්තේ ඒකමයි සංඛාර කරනවා කියන්නේ ඒකමයි අපි අවසානයේ මේ එන අරමුනයි මේ සේරම.

දැනගැනීම විඥානය වෙන්නේ. අන්න චක්ඛු ප්‍රසාදය තුළ සෝත ප්‍රසාදය තුළ අර අවසානයේ මේ සියල්ල එකතු වෙලා හදාගත්ත අන්න **මනෝ විඤ්ඤාණය** කියන එක හදාගත්තා දැන ගැනීමයි පොත කියන එක **වට්ටං වට්ටති** වට දෙකක් කැරකිලා එන කිරණ නෙමේ අපි දකින්නේ පින්තූරයක් නෙමේ අපි දකින්නේ පොතක් කියලා හදාගත්ත දෙයක් **වට්ටං වට්ටති** වට දෙකක් කැරකෙන තැන. ඒ ඵස්ස ඒ **චක්ඛු විඤ්ඤාණය තිණ්ණං සංගති ඵස්සෝ** කියන තැනින් වේදනා, සංඥා, සංඛාර ඔස්සේ ආයෙමත් හටගන්නවා ස්පර්ශයක්. ඒකයි වේදනා සංඥා චේතනා පස්ස මනසිකාරය කියල කිව්වෙ. අපි දෙයක් කියලා ගත්තොත් ඒක තමා **මනසිකාරය යං වේදේති තං සංජානාති යං සංජානාති තං විතක්කේති යං විතක්කේති තං විජානාති යං විජානාති තං ප්‍රපංචෙති** අන්න අපි බාහිරය ඇත්ත කරගත්තොත් රැවටුනොත් **විජානාති. යංවේදේති** යමක්ද ඒ වින්දේ? **යං වේදේති තං සංජානාති තං විතක්කේති යං විතක්කෙති තං ප්‍රපංචෙති**, එහෙම වුණොත් තමයි ආ ඒ පොත ලස්සනයි කැතයි හොඳයි නරකයි කියලා කතා ගොඩක් හදාගෙන උපාදාන කරගෙන අන්න වේදනා පච්චයා තණ්හා උපාදාන භව ජාති ජරා මරණ ශෝක පරිදේව සියල්ලම තියන්නේ දෙයක් කියලා ගත්ත තැනයි **මේ සිතට එන අරමුණෙයි, පටිච්ච සමුප්පාදය තියන්නේ. මේ සිතට එන අරමුණෙයි චතුරාර්ය සත්‍යය තියන්නේ. මේ සිතට එන අරමුණෙයි සත්තිස් බෝධිපාක්ෂික ධර්මයම වඩන්න තියෙන්නේ. ඒකයි ක්ෂණ සම්පත්තිය කියල කිව්වේ. මේ ක්ෂණය විතරයි. ක්ෂණය කියන්නේ හටගෙන නිරුද්ධ වන එක් ක්ෂණික සිතක,** උදය වැය, සම්මතය තුළ මරණය හමු නොවේ කියලා කිව්වේ, එවිට මර බියක් නැහැ. මරණයක් නැහැ. සියල්ලෙන් මිදෙන තැන. මේ සියල්ලම

**එකම තැනයි. අපි ඒකයි, ක්ෂණ සම්පත්තිය, බුද්ධක්ෂණය කියලා කියන්නේ, ඒ සිතිවිලි වලින් මිදෙන තැනම, අවදි වන්නේ බුද්ධ ස්වභාවයටයි ඒක මේ සූත්‍රය තුළින් ඉතින් ඔබට දකින්නට ලැබෙනවා ඒක වටිනාම තැනක්. ඇත්තටම ඔබ දැකිය යුතුමයි, දැන් එතකොට ඔබට දකින්න ලැබෙනවා යමක් අනාත්ම ද? එය මම, මගේ, මගේ ආත්මය වශයෙන් ගත හැකි ද? නො හේතං භන්තේ. අන්න නේතං මම නේසෝ හමස්මි නමේසෝ අත්තාති, ඒව මේතං යතාභූතං සම්ප්ඤ්ඤං දට්ඨබ්බං,** එතකොට එය ඇති සැටියෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දැකිය යුතුය, මහණෙනි මෙසේ දක්නා ශ්‍රතවත් ආර්ය ශ්‍රාවකයා රූපයෙද, කලකිරේ වේදනාවේද, කලකිරේ. සඤ්ඤාවේද කලකිරේ. සංඛාරයේද කලකිරේ. විඤ්ඤාණයේද කලකිරේ. කලකිරුනේද නොඇලේ. නොඇලුනේද මිදේ. මිදුණේද, මිදුණු කල්හි, විමුක්ති ඤාණය යැයි කියනු ලැබේ. ජාතිය ක්ෂය විය බඹසර වැස නිමවන ලදී කරණීය කරන ලදී මෙන්න මෙයයි මහණෙනි සම්පූර්ණයෙන්ම මෙතැන මේ සියල්ල පෙන්වනවා.

එතකොට අපි මේක සූත්‍රයෙන් බලමු. **ඒවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බිදන්ති, වේදනායපි නිබ්බිදන්ති, සඤ්ඤා-යම්පි නිබ්බිදන්ති නිබ්බන්දං විරජ්ජති. විරාගා විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායා'ති පජානාති,** අන්න වෙන කළ යුත්තක් නැති බව මේ වාක්‍ය තුළම ගැබ්වෙනවා. ඛීණා ජාතිය ක්ෂය විය, බඹසර වැස නිමවන ලදී, කරණීය කරන ලදී, මේකේ මෙතන තේරුම ඇත්තටම මෙතන තියෙනවා, අරහත්වය කියලා දෙයක් නැහැ. රහ නැති වෙන තැන එයයි. නමුත්

මෙතැන තේරුමේ ලියනව "**අරහත්වය**" අන් කිසිවක් නැත යයි දනිමි, කියලා ඒ කියන්නේ, අරහත්වය කියලා දෙයක් මෙතන පැහැදිලි කරන්න වචනෙන් ලිව්වට මේ සූත්‍රය තුළ එහෙම දෙයක් එතැන නැහැ එතන තියෙන්නේ **ඒවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බිදන්ති වෙදනයපි නිබ්බිදන්ති, නිබ්බිදන්ති සංඛාරෙසුපි නිබ්බිදන්ති විඤ්ඤාණස්මිම්පි නිබ්බිදන්ති නිබ්බින්දං විරාජ්ජති. විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තා'ති පජානාති** කියලා නමුත් තේරුමේ ලියලා තියෙනවා අරහත්වය කියලා දෙයක්, කරලා එහෙම දෙයක් මේකේ සඳහන් වෙලා නෑ සූත්‍රයෙ. ඒ ලියල තියනවා මේ අරහත්වය පිණිස අන් කිසිවක් නැතැ යි දනී කියලා ඇත්තටම අරහත්වය කියලා දෙයක් මෙතන පෙන්නන්න හැමතිස්සෙම උලුප්පන්න, ගියාට මේ අරහත්ත සූත්‍රය රහ නැති වෙන තැන, අපි ඊ ගාව කොටසට එනකොට ඔබට මේක තවත් හොඳට වැටහෙයි

මෙතන පෙන්නන්නෙ බුද්ධ ස්වභාවයට පත් වෙනවා කියන එකයි. මේ සූත්‍රයේ තියෙනවා ඒ වචන ටික අපි පෙන්වන්නම් **ඔබ සියලු දෙනාටම මේක ඇස් ඇරෙන්න ඕන තැනක්.** අපි ධර්මය දකිනවා නම් පිරිසිදුව නිර්මලව ඒ ධර්මය දැකිය යුතුයි. මහණෙනි සත්තාවාස යම්තාක් ද, භවාග්‍රය යම්තාක් ද, ඒ තාක් ලෝකයෙ අග්‍රය ශ්‍රේෂ්ඨය. ඔවුහු කවරෙක්ද? අන්න එතනදි කියනවා **යාවතා භික්ඛවෙ සත්තාවාසා යාවතා භවග්ගං එතෙ අග්ගා, එතෙ සෙට්ඨා ලොකස්මිං යදිදං අරහන්තො'ති** ඒ අරහත්වය කියලා තියනවා, **ඉදමවෝච භගවා ඉදං වත්වාන සුගතො අථාපරං එතදවොච සත්ථා.** එතකොට මහණෙනි, සත්තාවාස යම්තාක් ද, ඒ

භාවාග්‍රය යම්තාක් ද, ඒ තාක්කල් ලෝකයේ මොහු අග්‍රය, මොහු ශ්‍රේෂ්ඨයි. මොහු කවරෙක් ද? අරහත්වයට පත්වීමයි භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. ශාස්තෘන් වහන්සේ මේ වදාළේ යැයි මතුදු තෙල වදාල සේක අපි නිර්මල ශ්‍රී සද්ධර්මය ඔබට ඉදිරිපත් කරන්නේ අපි එකක්වත් අඩු වැඩි කරන්නේ නැහැ. අපි දෘෂ්ටිගත කෝණවලින් බලන්නේ නෑ. ඒක නිසා වාක්‍යයේ තියෙන විදිහටම අපි කියනවා හැමදේම නිර්මලව ම ඉදිරිපත් කරනවා ඔබම තේරුම් ගන්න ඕනේ, මෙතැන අපි පෙන්නන දේ ඇත්තටම අරහත්ත සූත්‍රයේ අරහත්වය කියන්නේ රහ නැතිවෙන ස්වභාවය ඇත්තටම ඡන්ද රාගය දුරු  වෙන තැන ඒ ස්වභාවයට පත් වෙන ආකාරය ඒ සත්‍ය දකින කෙනා අවිද්‍යා අවශේෂ විරාග නිරෝධයෙන් මේ ස්වභාවයට පත් වෙන බව. ඔබ දැක්කා **නිබ්බිදංති විරාගන්ති, විරාගන්ති නිරොධන්ති, නිරෝධන්ති පටිනිස්සග්ගානුපස්සි** කියනකොට අපි අර නිතරම පෙන්නන කාරණාව තමයි, ඒ රූපයේ යමෙක් සත්‍යය දකීද? ඒ සත්‍ය දකීනම්, අන්න ඒ අර බාහිර දෙයක් නැති බව දකියි නම් එතනින් ඇතිවන මිදීම තුළ අපි පෙන්නුවා ඒ නාමයෙන් රූපයෙන් මිදෙන තැන, ඒ නිබ්බිදන්ති. විරාගන්ති, විරාග න්ති, නිරෝධන්ති නිරොධන්ති පටිනිස්සාගානුපස්සි, කියන තැන. එතැනමයි, අරහත්වය, ඒ රහ නැතිවෙන ස්වභාවය.

මේ සූත්‍රයේ ඊගාව ටික බලමු දැන් අපි සුත්‍රය බලමු, **සුඛිතෝ වත අරහන්තො තණ්හා තෙසං න විජ්ජති; අසම්මානෝ සමුච්ජින්නො මෝහජාලං පදාලිතං.** රහත්හු ඒකාන්තයෙන් සුඛිතය, ඔවුනට තෘෂ්ණාවක් නැත. **සුඛි නෝ වත අරහන්තො තණ්හා තෙසං න විජ්ජති;** තණ්හාව සිඳලා තියෙන්නේ. එතකොට **අසම්මානෝ සමුජ්ජතෝ** එතකොට

ඔවුනට තෘෂ්ණාවක් නැත නව විධ අසම්මානය නුවණින් සිදලන ලදී, මෝහ නැමති දැල පලන ලදී. **මෝහ ජාලං පදාලිතං** එතකොට මෙතන **සුඛිනෝ වත තණ්හා තෙසං න විජ්ජති අසම්මානෝ සමුච්ජින්නො මෝහජාලං පදාලිතං** එතකොට ඒ මෝහ ජාලය ඒ කියන්නේ අවිද්‍යා ගනදුර සිදලලා, ඒ කියන්නේ, අස්මිමානය සිඳලලා, එතකොට තෘෂ්ණාව නැමැති තණ්හාව සිඳලලා, ඒ කියන්නේ ඒකාන්තයෙන් සුඛිතයි කියන එක. එතකොට හෙතෙම අරහත්වයට පැමිණියහ. **අනෙජං තෙ අනුප්පත්තා, චිත්තං තෙසං අනාවිලං; ලොකෙ අනුපලිත්තා තෙ, බ්‍රහ්මභූතා අනාසවා.** දැන් මේකේ තේරුම කියනවා **අනෙජං තෙ අනුප්පත්තා චිත්තං තෙසං අනාවිලං ලොකෙ අනුපලිත්තා තෙ, බ්‍රහ්මභූතා අනාසවා.** ඒ ස්වභාවයට පත් වූ විට ඔවුන්ගේ සිත කැළඹීම් රහිතයි මේ රහතන් වහන්සේගේ සිතේ ස්වභාවය, කියන්නේ. හෙතෙම ලෝකයේ තෘෂ්ණා, දෘෂ්ටින්ට නොඇලුනාහ, ශ්‍රේෂ්ඨය, ආශ්‍රව රහිතය, ඊගාව කොටස අපි බැලුවොත් **පඤ්චස්ඛන්ධෙ පරිඤ්ඤාය, සත්ත සද්ධම්මගෝචරා, පාසංසියා සප්පුරිසා, පුත්තා බුද්ධස්ස ඔරසා,** එතකොට පංචුඋපාදානස්කන්ධය, ත්‍රිවිධ ප්‍රඥාවෙන් පිළිසිඳ දැන, පංච උපාදානස්කන්ධ පරිඤ්ඤාය කියන්නෙ, ප්‍රඥාවෙන් දැනගෙන, සත්‍යය දකිනවා, පංච උපාදානස්කන්ධයේ. ස්කන්ධය නිසා හටගත් දෙයක් ලෙස, දූන සත් තස්ස ධම්මගෝචරං, එතකොට පිළිසිඳ දැන ඔහු සත්‍යය ධර්ම ගෝචර කොට ඇතිය. සත්තස්ස කියන්නේ, චතුරාර්ය සත්‍යය ධර්මය **සත්ත සද්ධම්ම ගෝචරා** සත්‍යය ධර්මය ගෝචර කොට ඇතිය, එතකොට ඊගාවට කියනවා **පාසංසියා සප්පුරිසා** එතකොට පැසසිය යුතුය කියනවා. සත්පුරුෂයන්ගේ පැසසීමට ලක් වෙනවා **පුත්තා බුද්ධස්ස ඔරසා** අන්න බුද්ධ පුත්‍රයෙක් බවට පත්වෙනවා කියල

මෙතැනදී පැහැදිලිවම. ඔබට මේ වාක්‍ය තුළ දකින්නට ලැබෙනවා **පුත්තා බුද්ධස්ස ඕරසා** ඒ කියන්නේ ඒ බුදුරජාණන් වහන්සේගේ පුත්‍රයායි, කියනු ලැබේ. දැන් ඔබට වැටහෙනවා නේද? ඒ බුද්ධ ස්වභාවය මෙතන අවබෝධ කරන බව, ඒ නිසාම මේ බුද්ධ පුත්‍රයා යයි කියන කතාවත් ඉස්සරහට ඔබට තවත් හොඳට අසන්නට ලැබෙනවා, ඔන්න බලන්න **සත්තරතනසම්පන්නා, තීසු සික්ඛාසු සික්ඛිතා; අනුවිචරන්ති මහාවීරා, පහීනභයභෙරවා** එතකොට **සප්තබොජ්ජංග** ඒ කියන්නේ සප්තබොජ්ජංගයෙන් යුක්තයි **තීසූ සික්ඛාසු සික්ඛිතා** එතකොට ශික්ෂාවෙන් යුක්තයි, ත්‍රිවිධ ශික්ෂාවෙන් යුක්තයි මහාවීරෝ ප්‍රහිනය, භය ප්‍රහින කරලා තියෙනවා. **අනුවිරචරන්ති මහවීරා.** එතකොට, **පහීනභයභෙරවා** අන්න භය ප්‍රහීන කරලා තියෙනවා, එතකොට මහාවීරෝ හෙතෙම භය ප්‍රහීන කර ඇත. එතකොට අපි ඊගාව කොටසට ගියොත් **"දසාඞ්ගෙහි සම්පන්නා, මහානාගා සමාහිතා;" එතෙ බෝ සෙට්ඨා ලොකස්මිං, තණ්හා තෙසං න විජ්ජති.** එතකොට දස අංගයකින් සමන්නාගත ඒ මහානාගායි සමාහිතාය. මොහු වනාහි ශ්‍රේෂ්ඨවෙති. ඔවුනට තෘෂ්ණාව නැති රහත් ඵල නුවණ උපන් මේ අන්තිම ආත්ම භවය යි. එතකොට **"අසේඛඤාණං මුප්පන්නං අන්තිමොයං සමුස්සයෝ; යො සාරෝ බ්‍රහ්මචරියස්ස, තස්මිං අපරපච්චයා."** අන්න එතනදි බුදුන් වහන්සේ දේශනා කරනවා, ඒ අන්තිම ආත්ම භවයයි. බ්‍රහ්මචාරියාගේ යම් සාරයක් ඇත්ද සාරාසංඛායාත ඒ මෙතන **අසෙඛ ඤාණං මුප්පන්නං** ඒ කියන්නේ ඤණය ඉපදෙන ඒ අසේක ඥානය, **සේක** කියන්නේ. ඔබ දන්නවා **අසේඛ ඤාණං උප්පානං,** එතකොට ඒ ඤාණය උප්පන්න අන්තිම මේ ආත්ම භවයයි, **අන්තිමෝයං සමුස්සයෝ; යො සාරෝ බ්‍රහ්මචරියස්ස, බ්‍රහ්මචරියස්ස,** සම්පුර්ණ කරලා, **තස්මිං**

**අපරපච්චයා.** එතකොට සමාහිතය. මොහු වනාහි දැන් එතකොට මෙතන කියන්නේ මේ අන්තිම ආත්ම භවයයි. බ්‍රහ්මචරියාගෙ යම් සාරයක් ඇත්ද? සාරාසංඛාත ඒ අන්‍ය උපකාර විරහිතව ඒ කියන්නේ තමන්ටම ප්‍රත්‍යක්ෂ තාවයෙන්, ප්‍රත්‍යක්ෂයෙන්ම තමන් ම දැනගන්නවා, තමන් ඒ ස්වභාවයට පත්වුණා කියලා. එතකොට **අසෙඛ ඤාණ මුප්පන්න** ඒ අසෙඛ ඤාණය ඉපදිලා **අන්තිමොයං සමුස්සයො** මේක අන්තිම ආත්ම භවය කියලා **යො සාරෝ බ්‍රහ්මචරියස්ස** ඒ බ්‍රහ්මචරියාවේ අවසානය. **තස්මිං අපරාපච්චයා** නැවත උත්පත්තියක් නැති බව. තමන්ටම ප්‍රත්‍යකෂ වෙනවා.

**විධාසු න විකම්පන්තී විප්පමුත්තා පුනබ්භවා; දත්තභූමිමනුප්පත්තා, තෙ ලොකෙ විජිතාවිනො.** එතකොට ත්‍රිවිධ මාන කොටස්හි නොසැලෙති, පුනර්භවයෙන් මිදුණාහ, අරහත්වයට අනුප්‍රාප්තය. එතකොට "**විධාසුන විප්පමුත්තා පුනබ්භවා" දන්තභූමිමනුප්පත්තා, තෙ ලොකෙ විජිතාවිනො.** එතකොට මේ කියන්නේ ත්‍රිවිධ මාන කොටස්හි නොසැලෙති, පුනර්භවයෙන් මිදුනාහ. ඔහු ලෝක අර රාගාදිය, දිනා සිටියාහුය. **අනුප්පන්නාහ ද්තභූමිමනුප්පන්නා තෙ ලොකෙ විජිතාවිනො එතකොට විධාසු න විකම්පන්ති.** ඒ කියන්නේ කම්පනය අර විකම්පනයට ලක් වෙන්නේ නැහැ. අර විසුද්ධියට එන තැන. "**විප්පමුත්තා පුනබ්භවා**" නැවත භවයක් අර පුනර්භවයට සකස් වෙන්න හේතු නැහැ."**දන්තභූමිමනුප්පන්නා තෙ ලොකෙවිජිතා විනෝ.**" ඒ කියන්නෙ ලොකෙන් මිදුන බවට තමන්ටම ප්‍රත්‍යක්ෂ වෙනවා. **උද්ධං තිරියං අපාචීනං, නන්දි තෙසං, න විජ්ජති; නදන්ති තෙ සීහ නාදං, බුද්ධා ලොකෙ අනුත්තරතී, උඩ සිරස යට උද්ධං තිරයන් අපාචියං** පස් හදෙහි හෝ කාලත්‍රයේ හෝ භවත්‍රයේ හෝ එහෙම තමයි

මෙකේ තේරුම, දැන් සඳහන් වෙලා තියෙන්නේ ඔවුනට තෘෂ්ණාවෙක් නැත. **උද්ධං තිරියං අපාචීනං** උඩ යට ඔවුනට උත්පත්තියක් නැහැ. **නන්දි තෙසං න විජ්ජති,** එතකොට ඔවුනට තෘෂ්ණාවක් නැත. නන්දි රාගයක් නැහැ. අනුත්තර වූ ඒ චතුරාර්ය සත්‍යය අන්න, එතනදි කියනවා "**බුද්ධා ලොකෙ අනුත්තරාති** අනුත්තර වූ බුද්ධත්වයට" පත් වුණා කියලා. **නන්දි තෙසං න විජ්ජති; "නදන්ති තෙ සිංහනාදං"** ඔහු සිංහ නාදයක් කරනවා. **උද්ධං තිරියං අපාචීනං නන්දි තෙසං න විජ්ජති; තදන්ති තෙ සිංහනාදං,** අන්න සිංහ නාදයක් කරනවා. **බුද්ධ ලෝකේ අනුත්තරෝති** අනුත්තරවූ බුද්ධත්වයට පත්වුණා, කියන එකයි කියන්නේ. එතකොට මේ අරහත්ත සූත්‍රය තුළ රහ නැති වීම තුළ අනුත්තර වූ බුද්ධත්වයට පත්වූනු බවයි මේකේ සදහන් වෙන්නේ මේ සූත්‍රයේ එහෙමයි සඳහන් වෙන්නේ නමුත් තේරුම ලියනකොට එතනටත් අර පොඩ්ඩක් එතන තියෙනවා, දෝෂයක් සහිතව නමුත් අපට එවා අදාල නැහැ. අපි මේ තේරුම විතරක් පිරිසිදුව කියපුවාම හරි. එතකොට **බුද්ධෝ ලෝකේ අනුත්තරෝ** කියන්නේ අනුත්තර වූ බුද්ධත්වයට පත්වෙන එක තමයි එතකොට මෙතනදී සිද්ධ වෙන්නේ. ඒක තමයි බුද්ධ ස්වභාවයට පත් වෙන එකයි මේ අරහත්ත සූත්‍රයේදී ඔබට දක්නට ලැබෙන්නේ. මේක සුත්‍රයේ තේරුම බැලුවොත් ඔබට ඒ සූත්‍රයේ තේරුම් කරලා ලියනකොට එතන්ටත් ඔබට දකින්ට ලැබෙනවා තේරුම හොඳින් දකින්න, සූත්‍රයත් හොඳින් දකින්න, ඔබට දකින්න ලැබේවි මෙතන බුද්ධ ස්වභාවයට පත් වෙන එකයි ඒ අනුත්තර ස්වභාවය තුළ සිදුවෙන්නේ ඒ අනුත්තර වූ ස්වභාවය තුළ ඒ බුද්ධපුත්‍රයන් බවට පත්වන බව මේකෙ මනා කොට තියෙනවා "**පුතා බුද්ධස්ස ඕරසා**" කියලා.

අපි ඒ දේශනා කරන ඒ එකදු වචනයක්වත් දෝෂයක් නැති බව. නමුත්, සමාජයට එය සමහර විට සමාජ ගත වෙලා නැති බව ඔබටම වැටහේවි. ඒකයි අපි කිව්වේ මේ අවසානයේ ඒ බුද්ධ ස්වභාවය අපට හමු වෙනවා. ඒ අනුත්තර සොබාවය තුළයි. ඒ බුද්ධ ස්වභාවය පවතින්නේ බුද්ධ ස්වභාවය තුළ නාම රූප පරිච්ඡේද ඥානයෙන් පස්සෙ ඒ සිතිවිලි වලින් මිදෙන තැන ඒ බුද්ධ ස්වභාවයටයි අවදිවෙන්නේ ඒ මේ සූත්‍රය තුළ අපි ඔබට පෙන්නන්නයි උත්සාහ කළේ. ඔබටත් දැකගත හැකියි. **අරහත්ත සූත්‍රය** බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාවේ පහළොස්වැනි **ග්‍රන්ථයෙ** සංයුත්ත නිකායේ තුන්වෙනි කාණ්ඩයේ **කන්ධ සංයුක්තයේ ඛජ්ජනීය වග්ගයේ අරහත්ත සූත්‍රය** තුළ 145 වැනි පිටුවේ ඔබට දකින්න ලැබේවි. ඒ බුද්ධ ස්වභාවයටයි පත්වෙන්නේ ඒ අනුත්තර වූ බුද්ධත්වයටයි පත්වෙන්නේ. බුද්ධ පුත්‍රයෙක් බවට පත්වෙන බව මෙතන ශ්‍රාවක බුද්ධ බවට පත් වෙන බව. අපි මීට කලිනුත් දේශනයකදි ඔබට ඉදිරිපත් කළා මේ ශ්‍රාවක බුද්ධ බවට පත්වෙන බව මේ සූත්‍ර දේශනාවෙ බොහෝ තැන්වල ඔබට දකින්නට ලැබේවි. ඒ බුද්ධ ස්වභාව යයි හමුවන්නේ. එයයි ඇත්තටම ඒ සිතිවිලි වලින් මිදුණු තැන ස්වභාවය බුද්ධ ස්වභාවයයි. එයයි, තෙරුවන් සරණ යන තැන අපට හමුවන්නේ. එයයි අපි කිව්වේ සිතුවිලි වලින් මිදුණු තැන **නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධෝ මේ සරණං වරං** අපි දුක් විඳින්නේ සිතුවිලි නිසා, සිතිවිලි වලින් මිදුණු තැන අන්න අපට හමුවන්නේ බුද්ධ ස්වභාවයයි, ඒකයි වෙන සරණක් නැහැ.

බුද්ධ සරණ හැර, කියලා. හැබැයි, ඒ ධම්මසරණ, ධර්මය දැක්කොත් විතරයි ඒ ස්වභාවය ඔබට දකින්නට ලැබෙන්නේ. ඒකයි බාහිර දෙයක් නැති බව දකින තැනයි, මේ සියල්ලම

ඔබට හමුවුන්නේ බාහිර දෙයක් තියනෙනවා කියලා යමෙක් හිතනව නම් ඔවුහු බෞද්ධයෙක් නෙමෙයි. **බෞද්ධයෙක් කියන්නේ බාහිර දෙයක් නැති බව දකින තැනයි** එතනයි භව නිරෝධය තියෙන්නේ. එතැනයි "**නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණං වරං**" කියන්නේ. බාහිර දෙයක් නැති බව දකීනම් කිසිදු දුකක් ඔහුට ඇති වෙන්න හේතුවක් නැහැ වෙන සරණක් නැහැ. ඒ සිතුවිලි වලින් මැවෙන දෙයක්. හදාගෙන අපි දුක් විඳින්නේ එහෙම දෙයක් නැති බව දකින තැනයි සියලු දුකින් මිදෙන්නෙ ඒකයි මේ එන එන අර අරමුණ දැක දැක මිදෙන තැනයි. සංඝ කියන්නේ "**නත්ථි මේ සරණං අඤ්ඤං - සංඝෝ මේ සරණං වරං**" කියන්නේ.

එහෙනම්, තෙරුවන් සරණ යන්න පුළුවන් වෙන්නේ මෙන්න මේ ආර්ය භූමිය අඳුනගත්ත අයට පමණයි, **දැන් ඔබට වැටහෙනවා සිතිවිලිවලින් මිදෙන තැන ඒ ස්වභාවයටයි ඒ බුද්ධ ස්වභාවය, කියලා කියන්නේ. එය හමුවන්නේ ඒ සියලු සිතුවිලි වලින් මිදෙන ස්වභාවය තුළයි දෙයක් නැති බව දකින තැනයි.** ඒ අනුත්තර වූ ඒ රහ නැති වෙන තැන අරහත්වය ප්‍රකාශ කරන්නේ. ඒ අරහත්වයෙ ස්වභාවය තුළ බුද්ධ ස්වභාවයයි ඔබට හමුවන්නේ. වැටහෙනවා දැන් මේ සියල්ල, අරහත්වය කියලා කියන්නේ, එහෙම කෙනෙක් පුද්ගලයෙක් නෙමේ ඒ ස්වභාවයයි, රහනැති වෙන ස්වභාවයයි අරහත් ස්වභාවය. එතන පත්වන්නේ ඇත්තටම බුද්ධ ස්වභාවයටයි. ඔබට දැන් මේ කාරණා සියල්ල වැටහෙනවනම්, අන්න ඒකයි, රහතන් වහන්සේලා කියලා කියන්නේ පුද්ගලයෙක් නෙමෙයි, රහතන් වහන්සේලා කියන්නේ ආර්ය භූමියේ දෙදෙනෙක් නෑ කිව්වේ ඒකයි, ආර්ය භූමිය කියන්නේ සත්වයෙක් පුද්ගලයෙක් නෙමෙ කීවේ ඒකයි, ඒකයි අර උපක අහන

ප්‍රශ්නය, ඔබ මනුෂ්‍යයෙක්ද? නැහැ, මනුෂ්‍යයෙක් නෙමෙද? දෙවියෙක්ද? නැහැ, දෙවියෙක් නෙමෙයි, බ්‍රහ්මයෙක්ද? නැහැ, බ්‍රහ්මයෙකු නෙවේ. ගන්ධබ්බයෙක්ද? ගන්ධබ්බයෙක් නෙවෙයි, **සත්වයෙක් පුද්ගලයෙක් නෙමේ බුද්ධ කියන්නේ සිතිවිලි වලින් මිදුණු තැන බුද්ධ ස්වභාවයයි.** සිතිවිලි වලින් තමයි අපට ලෝකය මවල තියෙන්නෙ **සංකප්ප ලෝකෙ චිත්තේන නීයති ලෝකෙ** ඒ සත්‍ය දැකලා මිදෙන තැනයි. අන්න ඒ අනුත්තර වූ බුද්ධත්වයට පත්වෙන්නේ ඒ බුද්ධ ස්වභාවය සම්මා සම්බුදු පියාණන් වහන්සේ ලෝකයට හෙලි කරපු නිසා. අපි ඒ සම්මා සම්බුදු පියාණන් වහන්සේ කියලා කියනවා ඒ බුදුරජාණන් වහන්සේ කියලා, කියනවා ඒ බුද්ධ ස්වභාවය තුළ උන්වහන්සේ අපි රජෙක් විදියට ඒ තථාගත ගෞතම සම්මා සම්බුදු පියාණන් වහන්සේ කියලා අපි එහෙම හඳුන්නනවා. ඒ වගේම බුද්ධ පුත්‍රයන් විදියට මේ සූත්‍රය තුළත් දක්වනවා **පුත්තා බුද්ධස්ස ඕරසා** කියලා ඒ කියන්නේ බුද්ධ පුත්‍රයන් විදිහට ඒ බුද්ධ ස්වභාවයටම පත්වෙන අය බුද්ධ පුත්‍රයන් විදිහටයි හඳුන්වන්නේ. එයයි මේ අවසානයේදී කියන්නේ "**බුද්ධාලෝකේ අනුත්තරාති**" කියලා ඒ අනුත්තර වූ බුද්ධත්වයට පත්වෙනවා කියලා අනුත්තරයි කියන්නේ. ඒ උත්තරීතර භාවයට පත්වෙන්නේ ඒ බුද්ධ ස්වභාවයට පත් වෙන්නෙ මේ ධර්මය දැක්කෝත් පමණයි කියන එකයි, ඔබට දකින්නට ලැබෙනවා මේ සූත්‍රය තුළ. සූත්‍රවල තියන ඒවා කාටවත් නැහැයි කියන්න බැහැ, සූත්‍රයේ මනා කොට තියෙනවා එයම ඔබට දකින්නට ලැබේවි. ඒ ධර්මයම සත්‍යමයි. අපි ඔබට දේශනා කළේ ඒ සූත්‍රයෙන් අරන් පෙන්වන්න උත්සහ කලේ අපේ ප්‍රත්‍යක්ෂ තාවය තුළ එහෙම කිසිවෙකුට ඒක එහෙම සිඳලිය නො නොහැකියි. එය සත්‍යයක්මයි. ඔබටත් මේ ධර්මය ප්‍රත්‍යක්ෂ වෙන්න ඕනේ.

ඔබගේ ම අභ්‍යන්තරයෙන් ඔබටම දැනේවි වී ඔබට නැවත ලෝකයක් නැති බව උත්පත්තියක් නැති බව. මේ ධර්මය ඇහෙනවනම් යමෙකුට ඔවුහු මහා භාග්‍යවන්තයි. ඒ වගේම ඒ මග යයි නම් ඉතාම භාග්‍යවන්තයි. නැවත දුකක් නම් හටගන්න හේතු නැහැ. නියත සම්බෝධි පරායණයි, කීවේ අන්න, ඒ නිසයි, එහෙනම් මේ අරහත්ත සූත්‍රය හැමෝගෙම දෑස් ඇරෙන්නට හේතු වේවි.

තෙරුවන් සරණයි!!!!

# 03. අවිජ්ජාපහාන සූත්‍රය

අවිජ්ජා ප්‍රහාන සූත්‍රය, සංයුක්ත නිකායේ
හතරවෙනි කොටසේ බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාවේ
16 වැනි ග්‍රන්ථය, හැට නව වෙනි පිටුව,

**චක්ඛුං චෝ භික්ඛු, අනිච්චතො ජානතො පස්සතො, අවිජ්ජා පහියති, විජ්ජා උප්පජ්ජති, රූපේ අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති. චක්ඛු විඤ්ඤාණං අනිච්චතො ජානතො පස්සතො අවිජ්ජා පහියති, විජ්ජා උප්පජ්ජති, චක්ඛුසම්ඵස්සං අනිච්චතෙ ජානතො පස්සතො අවිජ්ජා පහියති, විජ්ජා උප්පජ්ජති, යමපිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා, දුක්ඛං වා, අදුක්ඛමසුඛං වා, තම්පි අනිච්චතො ජානතෝ පස්සතො අවිජ්ජා පහියති, විජ්ජා උප්පජ්ජති.**

මෙන්න මේ කාරණාව අවිජ්ජා ප්‍රහාන සූත්‍රයේ බුදුන් වහන්සේ දේශනා කරනවා. **විද්‍යාව උපදින්නේ කොහෙන්ද?** කෙසේ, දක්නාහුට කෙසේ, දන්නා හුට අවිද්‍යා ප්‍රහීණ වේ ද? විද්‍යාව උපදී දැයි. මෙතැනදී, **බුදුන් වහන්සේ දේශනා කරනවා මහණ චක්ඛුසය අනිත්‍යයි, දක්නාහුට අවිද්‍යාව ප්‍රහීණ වෙයි විද්‍යාව උපදී.**

බුදුන් වහන්සේ මේ දේශනා කරන්නේ ඇස, ඇස කියන්නේ මසස නෙමෙයි. පේන බවට. **චක්ඛුඤ්චාවුසෝ**

**පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංගති ඵස්සෝ** කියන තැනින් පටන් අරගෙනයි මේ ඇස කියන පෙනීම කියන, මේ පේන බව කියන එක හටගන්නේ, බාහිර ආලෝකයක් නැතිව අපිට මුකුත් පේන්නෙ නැහැ, එහෙනම් ආලෝකයක් තිබුනොත් තමයි පෙනීමක් සිද්ධ වෙන්නේ. අන්න, ආලෝකයත් ගසක් නිසා ඇතිවන ප්‍රතිබිම්බයේ හෙවනැල්ල තමයි අපේ මේ චක්ඛු විඥානයේ දැනගැනීම. ඒක ස්පර්ශ වෙනවා මනෝ විඥානයට. **තිණ්ණං සංගති ඵස්සෝ, ඵස්ස පච්චයා වේදනා, යං වේදෙති තං සඤ්ජානාති (වේදනා සංඥා), යං සඤ්ජානාති තං විතක්කේති, (සංඛාරා) යං විතක්කේති තං විජානාති**, අන්න, වේදනා, සංඥා, සංඛාර ඔස්සේ විඤ්ඤාණය දැනගැනීම මනෝ විඤ්ඤාණයෙන් එනවා. වේදනා, විඳපු හැඩතලය සංඥා පෙර මතකයෙන් ගලපලා ඒ බැලීමමයි, මෙතැන සංඛාර කරනවා. කියන්නේ, මෙතැන විතක්ක කරනවා කියන්නේ, ප්‍රපඤ්ච කරනවා කියන්නේ, අන්න ඒකට රැවටුණු තැන, ඒ කෙනා මේ පෙර මතකයෙන් මේ එන හැඩතලය සංඥාවට ගලපලා පෙර මතකයෙන් තමයි බලන්නේ. **ඒ තමයි සංඥාව, සංඥාව තමයි ඇත්තටම මේ විඳින්නේ.** අපිට මේ එන හැඩතලය එනකොටම, ඒ හැඩතලයට මේ පොත කියලා හඳුනා ගැනිම සිද්ධවෙන්නේ පෙර ඒ හැඩතලයේ තිබුනු ඒ සංඥා තමයි බලන්නේ, බලන ඒක තමයි **සංඛාර** කරනවා කියන්නේ, හැබැයි ඒ සංඥාව. පෙර මතකයෙන් හඳුනාගන්න එක තමයි සංඥාව, සංඥා නිසා තමයි ඇත්තටම, විඤ්ඤාණය උපදින්නේ. ඇයි පෙර තිබූ මතකය ඒක නැත්නම් ඒ කියන මෙන්න මේ සංඥාව මිරිගුව නිසා තමයි, මිරිගුව සත්‍ය වෙලා අපිට විඤ්ඤාණ මායාවට රැවටෙන්නේ. අන්න, දැනගැනීම් එනවා. අර බාහිර ආපු හැඩතලය ඒක පොත

කියලා. බාහිර පොත් කියලා දෙයක් නැහැ. ඇත්තටම හතර මහා භූත කිව්වත් පොතක් කියල දෙයක් බාහිරයෙන් හම්බ වෙන්නේ නැහැ. ඒවා අපේ ප්‍රඥප්ති සම්මුති. අපි හදාගත්ත මතකයන්, ඇත්තටම මතකයන් කියන්නේ ඒ මොහොතේම සකස් වන එකක්, ඒ කොහේවත් තියෙන එකක් නෙවෙයි. නමුත් එකපාරටම ඒ ගැඹුරු තැනට යන්න බැහැ. ඒක නිසා අපි මුල් අවධිය දකින්න ඕනේ. ඒ කියන්නේ මේ සිත හැදෙන ක්‍රියාවලිය අපි දකින්න ඔනේ. මෙන්න මේක දකින කෙනා දකිනවා මේ සිත මායාවක් කියලා. සිත සත්‍යයක් නෙමෙයි බව. අන්න, මෙතන තමයි මේ ඇස කියන එක හැදෙන්නේ, පෙනීම කියන කාරණය. එතකොට, මේ ඇස කියන්නේ මෙන්න මේ සිද්ධියට, පේන බවට. **චක්ඛුංච පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං** කිව්වේ මෙන්න මේ පේන බවට තමයි ඇස කියන්නේ.

මහන චක්ඛුසය අනිත්‍ය, විසින් දන්නාහුට, ඒ පේන බව අනිත්‍යයයි කියලා දකින කෙනා, ඒ කියන්නේ බාහිර පොතක් හම්බ වෙන්නේ නැහැ. ඒකෙ අනිත්‍ය බව දකිනවා. අනිත්‍යයයි කියන්නේ ඒක මායාවක් බව දකින එකයි. අපිට මේ හම්බවුන පොත බාහිර හම්බ වුණොත් බාහිර භවයක් හම්බ වෙනවනේ, බාහිර භවය හම්බුනොත්, එතැන ජාතියක් තියනවනේ. පොත කියන ජාතිය තියෙනවනේ. එහෙම උනොත් එතන ඇතිවීමක් නැතිවීමක් තියෙනවනේ. ජාතිය තුළ ඉපදීමක් මරණයක් තියනවා. එහෙම වුනොත් ශෝක පරිදේව දුක්ඛ දෝමනස්ස අපිට ඇති වෙනවා. ජාති ජරා මරණ දුක් එනවා, එහෙනම් අපිට දුකෙන් මිදීමක් වෙන්නැහැ. ඔව්, මේ පටිච්ච සමුප්පාදය සියල්ල පටිච්ච වෙලා අවසානයේ අපිට දුකයි උරුම වෙලා තියෙන්නේ, පොත කියලා හම්බ

වුණාට ඒ භවය පොත කියන භවය තුළ අපිට දුකයි ඇවිල්ලා තියෙන්නේ. එහෙනම් භවය එක් ක්ෂණික සිතේ දකින්න ඕනේ. නිවරැදි නිවන් මග අඳුන ගන්න නම් හැම මොහොතෙම, ක්ෂණයක් ක්ෂණයක් පාසා එන අරමුණක්, අරමුණක් පාසා ඒ මොහොතේම එක් ක්‍ෂණික සිතක, එක් ක්‍ෂණික උපදින ඒ භව නිරෝධය දකින්න ඕනේ. **'අන්න ඒ අය නිවන් දකිනවා.'**

මේ මොහොතේ හටගන්න පොත දකින සිත නෙමෙයි ඊගාව මොහොතේ හටගන්නේ, බිත්තිය දකින සිත. හැබැයි පොත දකින සිත ඒ මොහොතෙම හටගෙන ඉතුරු නැතිවම නිරුද්ධ වෙලා යනවා. **අවුත්තා සම්භූතං උත්තානං භවිස්සති** කිව්වේ ඒකයි. **"පෙර නොතිබීම හටගත්තා ඉතුරු නැතුව ම නිරුද්ධ වුණා." නමුත් මේ හට ගත්ත පොත කියන මේ නිමිත්ත, මේ සිතෙහි සත්‍ය දකිනවා නම්, මේ සිත හැදෙන හැටි දන්න කෙනා, අන්න දර්ශන ඥාණය තියෙන කෙනා. අන්න, ඒ සත්‍යය ඥානය තියන කෙනා, ඒ කෙනාට පොතක් බාහිර හම්බ වෙන්නේ නැහැ. අන්න බාහිරයෙන් මිදෙනවා. අන්න ඒ කෙනාගේ නිමිත්ත, අනිමිත්ත බවට පත්වෙනවා.**

සෑම සිතකම මෙහෙම සත්‍යය දකිනවා නම් සියලු සිත්, සියලු නිමිති අනිමිත්ත බවට පත්වෙලා අනිමිත්ත සමාධියක් උපදිනවා. **අන්න නිවන් මග අනිමිත්ත, ශූන්‍යත අප්පණිහිත සමාධිය උපදිනවා.** කොහොමද මෙහෙම ශූන්‍යතාවයකට එන්නේ. බලන්න, ඊගාව සිත, ඒක බිත්තිය දකින සිත ඒක ඇත්තක්ද නැහැ. ඒකත් පෙර මතකයක් අතීත සංඥාවක් ඒ මොහොතේමයි මේ හැඩතලය එනකොට ඒ මොහොතෙම තමයි ඒ සංඥාව උපදින්නේ, නැතුව මේක කොහෙවත් රෙකෝඩ් වෙලා තිබිලා ආවා නෙමෙයි, මේ මොහොතේ

එනකොටම මේකත් එනවා ඒ එන තැනමයි එන්නෙ. බාහිර කොහේවත් හිතේ කොහේවත් තිබිල නෙමෙයි. හේතු නිසා හටගෙන හේතු නැති වෙනකොට නැති වෙනවා. මෙතන තමයි හේතුඵල දහම දකින්න ඕන තැන, **යෙ ධම්මා හේතුත් හගවා තේසං හේතුං තථාගතෝ**, කියලා ඒ තථාගත හිමිපාණන් වහන්සේ හේතු ඵල දහමක් දේශනා කරනවා කියලා අර උපතිස්ස, ඔබ දන්නවා සාරිපුත්ත මහ රහතන් වහන්සේ සැරියුත් හිමියන්ට ඒ අස්සජි රහතන් වහන්සේගෙන් ලැබුණු ධර්ම පණිවිඩය එයයි. ඒ තුළින් තමයි නිවන් මඟට ප්‍රවේශ වුණේ. ඇත්ත, ඔබටත් අද හේතුඵල දහම දකිනවා. **හේතුං පටිච්ච සම්භූතා හේතු නිරුජ්ජා නිරුජ්ජති.** මේ හේතුව ඇති කල්හි මෙය උපදින්නේ, ආලෝකයක් නැතුව ගසක් නැතුව සෙවනැල්ලක් උපදින්නෙ නැහැ. හැබැයි, ඒ සෙවනැල්ල ආලෝකයට අයිතිත් නැහැ, ගසට අයිතිත් නැහැ. **අන්න, විඤ්ඤාණය අපි හදාගන්න මායාව,** කිසිම දේකට අයිති නැහැ. පොත කියන එක බාහිර තියෙනවද, බාහිරට අයිතිත් නැහැ, හිතේ තියෙනවද, හිතට අයිතිත් නැහැ, අන්න ශූන්‍යයතාවයට එනවා. දැන් ඊගාව සිතට පනවන්න බැහැ. බාහිරට පනවන්නත් බැහැ. බාහිර පොත් කියලා දෙයක් නැහැ, නමුත් අපි දකින්නේ පොත්, ඊගාවට බිත්තිය කියලා දකින සිත, අපි දකින්නේ බිත්තිය, බිත්තියක් තියෙනවද? එතැන තියෙන්නේ, ගල් වැලි සිමෙන්ති අපිට පේන්නෙ නැහැ. **හතරමහ භූත** අපිට පේන්නෙ නැහැ, අපි දකින්නේ බිත්ති. අපි දකින හැමදේම මේ වගේ එකින් එක එකින් එක බැලුවම සිතුවිලි, ප්‍රඥප්ති, සම්මුති, ඒවයෙ හරයක් සත්‍යක් නැහැ.

බිත්තිය දකින සිත නෙමෙයි මල දකින්නේ, මල දකින සිත නෙමෙයි පුටුව දකින්නේ, පුටුව දකින සිත නෙමෙයි පොළොව දකින්නේ, බලන්න මේ සිත් පරම්පරාව, මේ එකින් එක එකින් එක සිතින් සිත යනවා. බලන්න, මේ එක සිතක් වත් වර්තමානයට පනවන්න බැහැ. **පච්චුප්පන්න ධර්මයක් කිව්වේ එකයි,** මේකෙ ඔබ බලන්න ඇත්තටම "**භද්දේක රත්න සූත්‍රය**" තුළ **අතිතං නාපහමෙය්‍යය අප්පටිකංඛෙ ආනාගතං පච්චුපන්ාස යේ ධම්මා තත්‍ර තත්‍ර විපස්සති,** අතීත සිත ගිහින් ඉවරයි, නැවත එන්නේ නැහැ. අනාගත සිත ඇවිල්ලා නැහැ. නමුත් මේ මොහොතේ වර්තමාන සිතත්, අතීත සිතත්, පසුගිය අතිත සිතත්, අතීතයට අයිති, අනාගතයට එන සිතත් අතීතයට අයිතියි. මේ උපදින සිතත් අතීතයට අයිතියි. වර්තමානය සිතක් පනවන්නේ තැනක් නැහැ. හටගෙන නිරුද්ධ වෙනවා පමණයි. අන්න **උප්පාද පඤ්ඤායති වයෝ පඤ්ඤායති ඨිතස්ස අඤ්ඤතත්තං පඤ්ඤායති,** ඊතියක් පනවන්නේ බැහැ. අන්‍යතත්වයක් තියෙන්නේ, ඇති වෙන නැතිවෙන තැනත් ඊතියක් නැහැ. වර්තමානයකුත් නැහැ, **අන්න අකාලික ධර්මයක් හම්බ වෙනවා** තුන් කාලයට අයිති නැහැ. අතීත, අනාගත, වර්තමාන තුන් කාලයටම අයිති නෑ. **අන්න පච්චුප්පන්න ධර්මයක්, අකාලික ධර්මයක්, ඒහිපස්සික එන්න, බලන්න සාන්දිට්ඨිකව ඔබට මේ මොහොතේම සාන්දිට්ටික වෙනවා. ප්‍රත්‍යක්ෂ ධර්මයක් ඔබට හම්බවෙනවා.** ඒ කියන්නේ, ඔබ බාහිර දෙයක් අල්ල ගත්තොත් තමයි දුකක් උපදින්නේ, බාහිර දෙයක් තියෙන්නෙ ඕනේ, භවයක් තියෙන්න ඕනේ, ඒ භවය තිබ්බොත් ජාතියක් තියෙනවා පොත කියලා. එහෙම වුණොත් ඔබට ජාති ජරා මරණ ශෝක පරිදේව එනවා. අන්න දුකට යන ගමන පටිච්චසමුප්පාදය තුළ පෙන්වනවා. නමුත් එකේ **සත්‍ය** දැකලා **මිදුන තැනයි**

**තියෙන්නෙ නිවන් මග.** අන්න නිවන් දකින කෙනා, සිතේ සත්‍යය දකින කෙනා, **පටිච්චසමුප්පාද ධර්මය නිවරදිව දකින කෙනා,** ඒ කෙනාට බාහිර දෙයක් හම්බවුණොත් එතැන සමුදය හටගන්නෙ.

ඇයි ඒ පොත කියන දේ හටගත්ත තැනම තියෙන්නේ සමුදය, සමුදය එතැන හටගත්තොත් ඒකට ඇලෙනවා ගැටෙනවා කියන්නේ, ඒ තණ්හාව උපදිනවා කියන්නේ ඒ ආසාව උපදිනවා කියන්නේ සමුදයයි. පොතයි කියන හට ගැනිමයි සමුදය භවය ඇති වීමයි සමුදයට හේතුව. ඒක නිසාම තමයි පටිච්චසමුප්පාද විවරණය ඔබට දකින්න ලැබෙනවා, **ඵස්ස පච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භව, භව පච්චයා ජාති ජරා මරණ, ශෝක පරිදේව.** මේක ඇත්තටම බාහිර දෙයක් හමුවීම තුළයි සිද්ධ වෙන්නේ, එහෙම වුනොත් තමයි ඒකට ඇලෙන්නේ, එහෙම වුණොත් ඒ උපාදානය කරගත්ත එනිසයි ඒක සිද්ධ වෙන්නේ, එකම වැලක කතාවක් මේ එක් ක්ෂණික සිතක නිවන් දකින්න පුළුවන්,මේ සත්‍යය දකින කෙනාට, මේ නිවන් මග පැහැදිලිව ඔබට දැන් අසන්න ලැබෙනවා. මේ නිවන් දකින්න සුදුසු කාලයක්. මේ කාලය තුළ සිතෙන් මිදෙනවා මේ සත්‍ය දකින කෙනාට බාහිර කිසි කෙනෙක් එක්ක ගැටෙන්න යන්න අවශ්‍යතාවයක් නැහැ. කිසි කෙනෙක්ට බනින්න යන්න, ඇයි ඒ බාහිර නෙමෙයි හිතේ උපදින්නේ, දැන් බාහිරයෙන් ඉන්නවද කවුරුවත්, බාහිර තියෙනවද පොත් කියලා දෙයක් නැහැ. එහෙනම් ඔබට, බාහිරත් එක්ක ගැටලුවක් තියනවද, නැහැ. ඔබ බාහිරයෙන් නිවන් දකින්න යනවද නැහැ. ඔබ බාහිරයේ සැපදුක් හොයන්න යනවද, ඒත් නැහැ. එතකොට සිතේ, සිතෙත් එහෙම දෙයක් නැහැ, ඔබ

මහා ශාන්ත සුවයට පත්වෙනවා. අන්න, **ඒතං ශාන්තං ඒතං ප්‍රණීතං යදිදං සබ්බ සංඛාර සම තෝ** අන්න සියලු සංස්කාර සිතුවිලි සමථය වුණ තැන ඒ ශාන්ත ප්‍රණීත නිවන් සුවය ඔබට දැනෙනවා.

ඔබට මරා ගන්න දෙයක් නැහැ බනින්න ඉරිසියා කරන්න වෛර කරන්න කවුරුත් හම්බ වෙන්නේ නෑ. තමන්ගේ සිතේත් එහෙම දෙයක් නැහැ. අන්න ඔබ මහා ශාන්ත සුවයට පත් වෙනවා කිව්වේ ඒකයි මේ සදාතනික සුවයක් ඔබට හමු වෙනවා. ඒක මේ ලෞකික ආයතන වලට අයිති එකක් නෙමෙයි ඒ ආයතන වලින් මිදිලායි මේ සුවය ඔබට හමුවන්නේ. අන්න සදා අමරණීය සුවයක් ඔබට දැනෙනවා. ඒකයි බුදුන්වහන්සේ දේශනා කරන්නේ **ඒතං සංතං ඒතං පනිතං යදිදං සබ්බ සංඛාර සමථෝ** කියාලා සියලු සංස්කාරයෝ සමථය වුණු තැනේ ඒ ශාන්ත සුවය ඔබට දැනෙන්න ගන්නවා.

ඒ තුළ තියෙන්නේ අනිමිත්ත, ශූන්‍යත, අප්‍රනිහිත, සුවයක්, අනිමිත්තයි එතන, ශූන්‍යතයි කිසිවක් ම ඔබට හම්බවෙන්නේ නැහැ. ඒ වගේම අප්‍රනිහිතයි, ඒ තුළ ඔබට අර ඇලෙන්න ගැටෙන්න නැති තැනක් අප්‍රනිහිත. එක තමයි මේ සුවය පාවෙන තැන, ඔබට දැනෙන්න ඕනේ පුළුන් රොදක් සේ මනස සැහැල්ලු වෙන තැනක්. **සබ්බුබදි පටිනිස්සග්ගෝ** සියලු උපදින් අත් හැරලා යනවා මේ විදියට එන එන සිත දකින කෙනා. **සබ්භූපදි පටිනිස්සග්ගෝ විරාගෝ නිරෝධෝ නිබ්බානෝ;** අන්න ඒ කෙනාට කිසිම දේකට ඇලෙන්න හේතුවක් නැහැ. මේ සිතින් මිදෙන තැනයි, විරාගය කියන්නේ. මේ බාහිර දේකට තියන ආශාව නැති වෙලා මේ අර කම්මැලිකමට ඉන්න අර නිකන් කුම්මැහි කමට ඉන්නවා

කියන්නේ අන්න ඒක නෙමෙයි විරාගය කියන්නේ. විරාගය කියන්නේ මේ සිතේ සත්‍ය දැකලා සිතෙන් මිදෙන තැන, ඒ සිතට ඇලෙන්නේ නැති තැන තියෙන විරාගය. ඇත්තටම සෞම්‍ය ස්වභාවයක විරාගයක්. ඒක පෙන්වන්න පුළුවන් සුබුම ස්වභාවයකින් තමයි. අන්න **විරාගන්ති නිරෝධන්ති, නිරෝධන්ති පටිනිස්සග්ගානු පස්සි** අන්න මේ කෙනා නිබ්බිදාවට එනවා. **නිබ්බිදන්ති විරාගන්ති** එතනින් එන්නේ, ඇලෙන්නේ නැහැ, ගැටෙන්නේ නැහැ, ඒ කෙනා විරාගයට ගිහිල්ලා සිතින්,මේ සිතින් මිදෙන තැන විරාගය, සම්මුතිය තුළ කතාකරන විරාගය නෙවෙයි. මේ ලෝකෝත්තර භූමිය ආයතන වලින් මිදුණු තැන.

ආයඝීවරුන්ගේ භූමිය කියන්නේ පුද්ගල සංඥාවලින්, ආත්ම දෘෂ්ටියෙන් මිදුනු තැනයි ආයඝී භූමියක් උපදින්නේ, එතන ආයතන වලින් මිදිලා **පච්චේ පරිග්ගහා ඥානය** තියෙන තැන, නාම රූප වලින් මිදුණු තැනයි, එය හමුවන්නේ. අන්න විද්‍යාව පහළ වන තැන එතැනයි. අන්න අවිද්‍යාව බිඳවැටෙනවා, **අවිද්‍යා පච්චයා සංඛාර** සිද්ධ වෙන්නේ නැහැ. අවිද්‍යාව බිඳ වැටෙන තැන ඔහු නිවන් මඟට ප්‍රවේශ වෙනවා. විද්‍යාව උපදිනවා. ඒක තමයි මේ **අනිත්‍ය** කියන වචනය තුළ තියෙන්නේ මේ සිතේ **අනිත්‍ය** මේ මොහොතේ දකින එකක්. ඒ නිවන් මගට උපනිශ්‍රය වෙනවා. ඉතින් මේ අවිජ්ජා ප්‍රහාන සූත්‍රය තුළ මේ කාරණාව මනාකොට දකින්ට ලැබෙනවා. **මහණ, චක්ඛුෂය අනිත්‍ය විසින් දක්නා හුට, දන්නා හුට, අවිද්‍යාව ප්‍රහීණ වේ**. විද්‍යාව උපදී. රූපයන් අනිත්‍ය විසින් දන්නාහුට දක්නාහුට අවිද්‍යාව ප්‍රහීණ වේ. විද්‍යාව උපදී. **චක්ඛු විඤ්ඤාණය අනිත්‍ය විසින් දන්නා හුට දක්නාහුට අවිද්‍යාව ප්‍රහීණ වේ, විද්‍යාව උපදී.**

**චක්ඛු සම්ඵස්සය** නිසා හටගන්නා ස්පර්ශය අනිත්‍ය විසින් දන්නාහුට දක්නාහුට අවිද්‍යාව ප්‍රහීණ වේ. විද්‍යාව උපදී. **චක්ඛු සම්ඵස්සය** නිසා ස්පර්ශය නිසා සුව වූ හෝ දුක් වූ හෝ යම් නොදුක් නොසුව යම් වේදනාවක් උපදී නම්, එයද අනිත්‍ය විසින් දන්නා හුට දක්නාහුට අවිද්‍යාව ප්‍රහීණ වේ. **විද්‍යාව උපදී.** මෙය මනාකොට කොට පැහැදිලි කරන බුදුන් වහන්සේ සියලුම ආයතන වලට මේ විදියට ගලපලා පෙන්වනවා බුදුන් වහන්සේ මේ කාරණාව. මෙයයි නිවරදි නිවන් මග හඳුනාගන්න.

මේ හැම සූත්‍රයක ම බුදුන් වහන්සේ දේශනා කරලා තියෙන්නේ, බැලුවහම නිවනට ම උපනිශ්‍රය වූ ධර්මයක්, නිවන් මග තමයි හැම සූත්‍රයකම දකින්න ලැබෙන්නේ. ඉතින් **අවිජ්ජා ප්‍රහාන සූත්‍රයේ** ඔබ ඒ නිවන් මගයි දුටුවේ.

තෙරුවන් සරණයි !!!!

# 04. ඣදාණ සූත්‍රය

**ඣදාණ සූත්‍රය, සංයුක්ත නිකායේ පස්වෙනි කාණ්ඩයේ බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාවේ දාහත් වැනි ග්‍රන්ථය, සංයුක්ත නිකායේ පස්වෙනි කාණ්ඩයේ බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාවේ දාහත් වැනි ග්‍රන්ථය,**

**ඣදාණ සූත්‍රය ඍධිපාද සංයුක්තය අපිට දකින්ට ලැබෙනවා. මේ එකොළොස් වැනි පිටුවේ මෙන්න මේ ඣදාණ සූත්‍රය.**

මහණෙනි, මේ ඡන්දය නිසා පැවැති සමාධියෙන් හා ප්‍රධාන සංකාරයෙන් යුත් ඍධිපාදය වඩයි. ඍධිපාද කියනකොට **ඡන්ද, චිත්ත, විරිය විමංසා,** එතකොට මේ ඣදාණ සූත්‍රය තුළ පෙන්නන කාරණය අපි ගත්තොත් අපි ඔබට පැවසුවා ධර්මය තුළ ප්‍රායෝගික පැත්තේදි, නාමරූප වලින් වෙන් වෙන තැන, බාහිර දෙයක් නැති බවට සත්‍ය වශයෙන්ම අවබෝධයෙන් දකිනවා නම්, මේ අපි හිතෙන දෙයක් මිස බාහිර දෙයක් හම්බ වෙන්නේ නැති බව, පොත, මේසය, ගහකොළ ඉර, හඳ ගෙවල් දොරවල්, දුව, පුතා, කියන මේවා සේරම. අපි විසින් දාගත්ත සම්මුති ප්‍රඥප්ති. එහෙම නැත්නම් අපිට මේ බාහිරයෙන් එහෙම කිසිවක් දෙයක් හමුවන්නේ නෑ, මහා භූත අපිට පෙනෙන්නේ නැහැ. ඒවිදියට බැලුවොත් ඔබටම වැටහෙනවා මේ නිමිති අනුව ගිය සාමාන්‍ය ඇසුනවත් පෘථග්ජන භූමිය ඒ කියන්නේ දෙයක් තියෙනවා කියලා බාහිරය අල්ල ගත්ත තැන, බාහිරයට

රැවටෙන තැන, ඒ බාහිරයට බැසගෙන තියෙන තැන, සතා සිවුපාවා පවා ඉන්නේ බාහිරය ඇත්ත කරගෙන බාහිර බඩුමුට්ටු වලින් සැප දුක් එනවා කියලා හිතන එක, බාහිර කෙනෙක් ඉන්නවා ඒ නිසා. ඒකයි මට දුක එන්නේ. බාහිර දෙයක් තියනවා ඒ නිසයි මට දුක එන්නෙ කියලා හිතන එක. ඒකයි රැවටීම, ඒකයි මුලාව, එතනයි අවිද්‍යා භූමිය තියෙන්නේ. හැබැයි එහි සත්‍ය දකිනවා නම්, මේ බාහිර දෙයක් නෙමෙයි සිතන ධර්මයක් කියලා, අන්න එතනයි "**යථාභූත ඥානය**" සත්‍ය දකිනවා. එතකොට බාහිරයෙන් දෙයක් හමුවන්නේ නෑ, පොත කියලා දෙයක් බාහිරයෙන් අපට හමුවෙන්නේ නැහැ, **අපේ සිතත් බාහිර දෙයක් කියලා තියෙන්න පුළුවන්ද**, සිතෙත් බාහිර දෙයක් නෑ අන්න එතැන සිතෙනුත් මිදුණු තැන බාහිරිනුත් මිදුණු තැන ශූන්‍යත. අන්න නිමිති හම්බ වෙන්නේ නැහැ. පොත, මේසය, දුව, එහෙම කියලා නිමිත්තක් හම්බ වෙන්නේ නෑ. එතකොට නිමිත්තක් බාහිර හමු නොවෙන අනිමිත්තයි, ඒ ශූන්‍යතයි. මේ එන අරමුණ කොහේවත් පතිත වන්නේ නැහැ අප්පඨිහිතයි, අප්පඨිහිත විඤ්ඤාණය, එතකොට මේ අරමුණම තමයි සිත කියන්නේ එතකොට ඒ අරමුණ අනිදස්සනයි. විඤ්ඤාණය පතිත වෙන්නේ නෑ කියන්නේ අනිදස්සනයි, අහසට ටෝච් එක ගැහුව වගේ කොහෙවත් ගිහිල්ල වදින තැනක් නෑ, අන්න අනිමිත්තයි. නිමිති නෑ, ශූන්‍යතයි, අන්න අනිමිත්තයි. ශූන්‍යතයි, අනාත්මයි. බාහිර දෙයක් තිබ්බොත් තමයි, ඒක දකින කෙනෙක් ඉන්නේ. බාහිර දෙයක් නෑ කියන්නේ මම කියලා ගන්න කෙනෙක් නැති වෙනවා. මම දකින පොතක් නැති වෙනවා. පොතෙන් තොර මමෙක් නෑ කිව්වේ ඒකයි. බාහිර පොතක් නැත්නම් ඒක දකින කෙනෙකුත් නෑ. එහෙනම් මම මගෙ කියලා ගන්න දෙයක් නෑ. පොතක්

කියලා දෙයක් නැත්නම් මම කියලා මගේ කියලා දෙයකුත් නැහැ. මම කියලා කෙනෙකුත් නැහැ අනාත්මයි. ආත්ම කතාවක් නැති වෙනවා. දෙයක් නැති තැන අනාත්ම ධර්මය හමුවන්නේ, අන්න **අනිමිත්ත, ශූන්‍යත, අප්‍රණිහිත, චේතෝ විමුක්තිය.** අන්න එතන මේ කියන තැන. එතකොට ඇතිවෙන සිත. සිත කියන්නේ එන අරමුණ සත්‍ය නොවන තැන සිතක් ඇතිවුණ බව දැනෙන්නේ මේ ඤාණයටයි කියලා අපි කිව්වා. මේ මෙතැන මේ ඤාන සූත්‍රයට අනුව ඔබට එය දකින්ට ලැබෙනවා. ඔබ දන්නවා මේ ඍධිපාද මොනවද? මේ ඍද්ධි පාද ගොඩාක් අය පොත්පත් වලින් තමයි දකින්නේ. පොත්පත්වලින් දකිනකොට අපට දකින්නට ලැබෙනවා **ඡන්ද, චිත්ත, විරිය, විමංසා** කියන ඍධිපාද, සාමාන්‍ය බැලූ බැල්මට තේරෙනවා චන්දය කියන්නේ කැමැත්ත, චිත්තය කුමක්ද? චිත්තය දකින්න. සත්‍ය ඒකයි. වීර්යත් ඒකයි. විමංසාව ඒ ගැන දැන තියන විමංසනය ඒකට ගන්න වීර්ය සත්‍ය දකින්නටයි. මේ විමංසාව ඒකට ගන්න විර්යයි. **ඡන්ද, චිත්ත, විරිය, විමංසා** කියන්නේ අන්න ඒ ආකාරයටයි. එතකොට මේ සත්‍යය කියන්නේ කුමක්ද? සත්‍යය කියන්නේ දෙයක් තියෙන තැන අප රැවටීම, දෙයන් නැති තැන නොරැවටීම, හැබැයි දෙයක් හමුවෙන්නෙ නැති තැනයි සත්‍ය දකිනවා කියන්නේ. ඒකයි චිත්ත, ඒ සිත ඒ විඤ්ඤාණය, සත්‍ය දකින එකයි, එතකොට ඒකට තියෙන ඡන්දය කැමැත්ත සත්‍යය දකින්න තියෙන කැමැත්ත ඒකට ගන්න වීර්ය ඒ විමංසාව **ඡන්ද, චිත්ත, විරිය, විමංසා** මෙන්න ඒ වීරිය විමංසා, මෙන්න මේ තුළ තමයි ඒ සත්‍ය දකින තැන **ශූන්‍යත අනිමිත්ත අප්පණිහිත කියන තැන.** ඒ ස්වභාවය තුළ අපිට කිසිවක්ම හමු වෙන්න නැහැ. හැබැයි ඒක දැනෙන්නේ ඤාණයටයි කියල අපි කිව්වා සිහියට. සිහිය වර්ධනය වීම

තුළයි ඒ ඤෙයස්ස අධිගමාය කියන නිවන් මග හමුවන්නේ කියල කිව්වේ, මහණෙනි, මේ ඡන්දෙ නිසා ඇතිවන සමාධිය අන්න සමාධිය, අනිමිත්ත සමාධිය, මේ කතා කරන්නේ හා ප්‍රධාංසංඛාර යෙන් යූත් ඔය ප්‍රධාන් සංඛාරය කියන එක ගොඩක් අයට තේරෙන්න නැහැ. ඇත්තටම මේකේ මේ වචනය පවා පරිවර්තනය කරලා නැහැ. ප්‍රධාංසංඛාරය කියන වචනය ඒ විදිහටමයි තියෙන්නේ සමාධිය, අනිමිත්ත සමාධියෙන් යුත් ප්‍රධාන සංඛාරය කියන්නේ මෙතන පධාන සංඛාරය කියන වචනය දාන්න හේතුව තමයි මෙතන මේ එන අරමුණෙන් මිදෙන තැන සාමාන්‍යයෙන් සංඛාර තුළ විඤ්ඤාණයක් තියෙනවා, හැබැයි මෙතැන **විඤ්ඤාණය අනිදස්සන** වන තැන ප්‍රධාන සංඛාරය කියන එක හඳුනා ගන්න ඕනේ එතන සංඛාරයක් නෑ කියලා පනවන්න බැහැ, සිතක් නැති මොහොතක් නෑ හැබැයි ඒක **අනිදස්සන** වන තැන ඒ පධාන සංඛාරයෙන් යුත් කියලා කියන කොට, ඒ සංඛාරයට බල ගැන්වීමක් නැහැ. ඒ ප්‍රධාන සංඛාරයෙන් යුත් කියන වචනය භාවිතා කරන්නේ අන්න ඒ අර්ථයෙන්. එතැන **ශූන්‍යතයි අනිමිත්තයි අප්පණිහිතයි.** චිත්ත විමුක්තිය තුලයි ඒ ප්‍රධාන සංඛාරය හමුවන්නේ. අන්න, **චන්දය, ප්‍රධාන සංඛාර සමංනාගත ඍද්ධි පාදය, චිත්ත පධං සංඛාර සමන්නාගත ඍද්ධි පාදය, වීර්ය ප්‍රධාන සංඛාර සමංනාගත ඍද්ධි පාදය.** සංඛාර කියන කොට අපි දන්නවා සංඛාර කියන්නේ සකස් වෙනවා. ඒ සකස් වෙන්නේ දෙයක් නැති බවයි. ප්‍රධාන සංඛාර ඒක සමන්නාගතයි ඒ සමන්නාගත ඍද්ධිපාදය. ඒ වචනය දිග වචනයක්. නමුත් ඒකේ ලොකු තේරුමක් තියෙනවා. ඒකයි එතැන **ඡන්ද, චිත්ත, විරිය, විමංසා** කියන ඒ ආකාර තුනෙන්ම පෙන්වනවා. මහණෙනි, මේ විමංසා සමාධි ප්‍රධාං සංඛාර සමන්නාගත ඍද්ධි පාදය. එතකොට

පෙර නොඇසූ විරූ දහම්හි මට ඇස පහළ විය. එළිය පහළ විය, මහණෙනි, ඒ විමංසා සමාධි ප්‍රධාං සංඛාර සමන්නාගත ඍද්ධිපාදය වැඩිය යුතුය. මට මහණෙනි, ඒ වඩන ලද්දේයි පෙර නො ඇසූ විරූ දහම්හි, ඇස පහළ විය, නැණ පහළ විය. මට පැන පහළ විය. විදු පහළ විය, එළිය පහළ විය. එතකොට මේ අපි පෙන්නන්න ගිය, ඔබට මෙතන මේ ඤාණ සූත්‍රය තුළ බුදුන් වහන්සේ පෙන්වන්නේ මෙන්න මේ ඤාණ දස්සනය අවදි වුණා කියන එක අපි ඒක සූත්‍රය තුළින් බලමු. එතකොට අපිට පුළුවන් පරිවර්තනය, යම්කිසි සූත්‍රය තුළ ඊට වැඩිය යමක් අපිට දකින්න ලැබෙනවා.

**'ඤාණ සූත්‍රා, අයං ඡන්ද සමාධි ප්‍රධාංසංඛාර සමන්නාගත වු ඍධිපාදෝති මේ භික්ඛවේ,'** ඒ අර පැහැදිලි කරපු අකාරයමයි, **'පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු'** අන්න පෙර නො ඇසූ විරූ දහම්හි **පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, ප්‍රඥා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි.'** දැන් මෙතන, පැහැදිලිවම කියනවා **චක්ඛුං උදපාදි** පෙර නොඇසූ විරූ දහම්හි මට ඇස පහළ විය, ඤාණය පහළ විය, **ඤාණං උදපාදි** ප්‍රඥාව පහළ විය, **ප්‍රඥා උදපාදි, විජ්ජා උදපාදි** විද්‍යාව පහළ විය **ආලෝකෝ උදපාදි** ඒ මහා ආලෝකය පහළ වීය. **'සෝ ඛෝ පනායං ඡන්ද සමාධිපධාන් සංඛාර සමංනාගතෝ ඍධිපාදෝ භාවේතබ්බෝති මේ භික්ඛ්වේ භාවිතෝ මේ භික්ඛ වේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු'** පෙර නොඇසු විරු දහම අර විදිහටම කියනවා.

එතකොට 'පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු' කියන හැම තැනම බුදුන් වහන්සේ භාවිතා කරනවා මෙන්න මේ වචන ටික' **චක්ඛුං උදපාදි**' ඒ කියන්නේ, පෙර නොඇසූ විරූ

දහම, දහම් කියන්නේ ධර්මතාවය මේ පෙර නොඇසූ විරූ කියන්නේ සාමාන්‍යයෙන් අපි දන්න දේ නෙමෙයි. අපි දන්න දෙයක් කියලා, දෙයක් නැති බව දකින තැන. අන්න අනිමිත්ත සමාධිය, අන්න ඒ ධම්ම චක්ඛුසය, ඒ ධම්ම චක්ඛුසය දෙයක් නැති බව දකින ධම්ම චක්ඛුසය, ඒක කිසි දවසක අහපු නැති ධර්මය තාවයක් වෙනවා ඔව් ඇත්ත.

සාමාන්‍යයෙන් ඕනෑම කෙනෙක් කතා කරන්නේ මේ එළියෙ දෙයක් තියෙනවා කියලා අරගෙන නමුත්, මේ මාර්ගය තුළ පෙර නොඇසූ විරූ දහමක් වෙන්නේ, දෙයක් නැති බව දකින නිසයි. ඒකයි **ධම්ම චක්ඛුසය** කියන්නේ. ඒක මස් ඇහැට පේන්නෙ නැහැ, හැබැයි ඔබ ධර්මය දැක්කොත්, දෙයක් නැති බව දැක්කොත්, ඒ ධම්ම චක්ඛුසය කියන්නේ ඇත්තටම එය දැකීමක්, ඒක අවබෝධයෙන් දැකීම, නුවණින් දැකිම ප්‍රඥාගෝචරයි. ඔව් ඒ දැකීම තුළ දෙයක් නැහැ, දෙයක් හමුවන්නේ නැහැ **සත්‍යයයි** දකින්නේ, ඒකයි මෙතන ධම්ම චක්ඛුසය අවදි වෙනවා කිව්වේ, ඒකයි **ඤාණ උදපාදි**, ඒ ඤාණය අවදි වෙනවා කිව්වේ. ඒක දැනෙන්නේ කොහොමද? ඒක විඤ්ඤාණයට ද දැනෙන්නේ නැහැ. ඤාණයට කිව්වේ එය සිහියටයි දැනෙන්නේ. ඒක සිහියයි සිතක් ඇති වුණු බවට, සිහියයි ඒ සිතේ සත්‍යය දැකපු බවට. උදාහරණයක් විදියට, පොත නමැති අරමුණ කියන්නෙ සිතනේ, අරමුණ ඇති බවට, ඒ බාහිර පොතක් නැති බව, මෙනෙහි කරපු බවට, එතනත් සිහියයි, හැබැයි පොතේ වටිනාකම දියවීගෙන යනවා ආසවක්ඛය ඤාණයට හසු වෙනවා. ඒකත් සිහියයි, ඒ සිහිය තමයි මේ ඤාණය. ඒ ඤාණය තමයි අවදිවන්නේ ඒ ධම්ම චක්ඛුසය අවදි වෙනවා කිව්වේ ඒකයි ඒ ඤාණං උදපාදි කිව්වේ ඒකයි. ඤාණය උදපාදි අන්න ඤාණය අවදි වෙනවා. ප්‍රඥා

උදපාදි මහා ප්‍රඥාව කියන්නේ, සිත කියලා දෙයක් නැති බව දැකීමයි ප්‍රඥාව, '**ප්‍රඥා භාවේ තබ්බං විඥානේ පරිඤ්ඤෙයියං**' ඒ කියන්නේ '**විඤ්ඤානේ පරිඤ්ඤෙයිය,**' විඤ්ඤානය හැදෙන ආකාරය දකින එකයි ප්‍රඥාව කියන්නේ, '**ප්‍රඥා භාවේ තබ්බං විඤ්ඤාණයේ පරිඤ්ඤෙයිය**' කිව්වේ ඒකයි, එහෙනම් අන්න ඒ ප්‍රඥා උදපාදි. ඒ ප්‍රඥාව අවදි වෙනවා. **විජ්ජා උදපාදි** අන්න අවිද්‍යාවට තැනක් නැහැ, දැන් ඔබ සත්‍යය දකිනවා. **විද්‍යා උදපාදි, ආලෝකෝ උදපාදි** දැන් ඒ අන්ධකාරය ඔය නොදන්නාකම තුළ ඔබ රැවටිලා සැප දුක් වින්ද එක, ඒතැනින් මිදිලා අන්න ආලෝකෝ උදපාදි. මේ මේක හොඳින් දකින්න ඕනේ තැනක්, එතකොට ඒ කියන්නේ ධම්ම චක්ඛුසය අවදි වන එක '**පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු**' කියන එක. '**පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු**' කියන තැන තමයි, බුදුන් වහන්සේ ඒ වාක්‍යයත් සමගයි මේ වාක්‍යය තියෙන්නේ, හැමතැන ම ඒ විදියට අපිට දකින්නට ලැබෙනවා, පෙර නො ඇසූ විරූ දහම්හි මට ඇස පහළ විය. '**චක්ඛුං උදපාදි, ඥානං උදපාදි, ප්‍රඥා උදපාදි, විද්‍යා උදපාදි, ආලෝකෝ උදපාදි, සෝකෝ පනායං ඡන්ද සමාධිප්පධාන සංඛාර සමන්නාගතෝ,**' අන්න එතකොට මේ කියන ඒ සත්‍යය, ඒ ධම්ම චක්ඛුසය, ඒ ඤාණය, ඒ ඤාණ දස්සනය පහල වෙච්ච එක ඒ ප්‍රඥා ලෝකය, ඒ විද්‍යා ලෝකය, ඒ ඡන්දය, ඒ කියන්නේ **සමාධි සංඛාර සමන්නාගතෝ**. එතකොට මේ අනිමිත්ත සමාධිය දෙයක් නැති බව ඒක සංඛාර ස්වභාවයක් එතනත් සංඛාර ස්වභාවයක් හැබැයි සමන්නාගතයි. ඒ ඍධිපාදයක්, ඒ කියන්නේ මෙතැන ඇවිදින කෙනෙක් නැහැ, වතුර බොන කෙනෙක් නෑ, එතකොට බත් කන කෙනෙක්

නෑ, ඔය සිතට දෙයක් කරන්න බැරි බව, අපි මේ සිතාගෙන හිටපු දේවල් සේරම මායාවක් බව අවබෝධ වෙන තැන. එතනත් අවබෝධයක් තියෙනවා, එතනත් දැනෙන දැනීමක් තියෙනවා. ඒකයි ඡන්ද සමාධි ප්‍රධාන සංඛාර, සංඛාර සමාධි ප්‍රධාන සංඛාර අනිමිත්ත සමාධියයි, අනිමිත්ත සමාධියෙන් යුතු සංඛාරයක්. අන්න එවැනි සමාධිමත් ස්වභාවයක් ඡන්ද සමාධිප්‍රධාන සංඛාර සමන්නාගතයි. ඒ කියන්නේ එතැන මිදුණු සොබාවය තුළයි ඒක තියෙන්නේ. ප්‍රායෝගික පැත්තේදි මේ වචනෙට එහා ගිය විශාල අවබෝධයක් තියෙනවා, ඒ තුළයි මේක දැනෙන්නේ.

ඒ **ඍධිපාද භාවේ තබ්බෝති, මේ භික්ඛවේ භාවිතොති මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු** අන්න පෙර නොඇසූ විරූ දහම්හි. අන්න මේක නිතර නිතර භාවිතා කිරීම තුළ පෙර නොඇසූ විරූ දහම්හි අන්න ඇස පහළ විය. **චක්ඛුං උදපාදි** අර විදියටම කියනවා **අරියං විරියං. සමාධි සංඛාර සමන්නාගතෝ, ඍධිපාද** ඒ කියන්නේ දැන් **අයං විරිය, සමාධි ප්‍රධාන සංඛාර සමන්නාගතෝ, අයං චිත්ත සමාධි ප්‍රධාන සංඛාර සමන්නාගතෝ,** ඒ විදිහටම තියෙනවා කියනවා වීර්යං මුල් කරගෙන ඒකට වීර්යක් තියෙනවා. ඒක දකින්න තියෙන කැමැත්ත, ඕනකම **ඡන්දය. ඡන්ද, චිත්ත, විරිය, විමංසා** ඒ විදිහටම කියනවා, **අයං චිත්ත සමාධි ප්‍රධාන සංඛාරසමන්නාගත ඍධිපාදෝති, මේ භික්ඛවේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි,** අර විදියටම කියනවා **චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, ප්‍රඥා උදපාදි, විද්‍යා උදපාදි, ආලෝකෝ උදපාදි;** ඒ විදියටම කියනවා ඡන්ද චිත්ත විරිය විමංසා කියන තැන හතර ආකාරයට, ඒ කියන්නේ ඒකට තියන කැමැත්ත වීර්යය ඒ වගේම ඒ විමංසාව ඒ තුළ

උපදිනා ඒ චිත්ත ස්වභාවය, **අයං විමංසා සමාධි ප්‍රධාන සංඛාර සමන්නාගතෝ ඍධිපාදෝති මේ භික්ඛවේ. පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, ප්‍රඥා උදපාදි, ආලෝකෝ උදපාදි,** අන්න විද්‍යා උදපාදි. ඉතින් මේ **ධම්ම චක්ඛුසය** මේ සත්වයා සත්‍යය තමන්ට ඒ අනිමිත්ත සමාධිය ශූන්‍යත අප්පනිහිත, චිත්ත විමුක්තිය තුළ ඒ සියල්ලෙන් මිදීම තුළ මහා ශාන්ත සුවයක් දැනෙන්න ගන්නවා, ඒක තමයි ඒ සත්‍යය. ආලෝකෝ උදපාදි දහම්හි සත්‍ය දකින ඒ විද්‍යා ආලෝකය පහළ වෙනවා, කියන එක. එතකොට චක්ඛුං උදපාදි කියන්නේ මේ මස් ඇහැට පේන දෙයක් නෙමෙයි, සත්‍යය පේන්නේ ධම්ම චක්ඛුසයටයි. පෙර නො ඇසූ විරූ දහමක් **පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු** එතකොට **චක්ඛුං උදපාදි ඥානං උදපාදි, ප්‍රඥා උදපාදි, විද්‍යා උදපාදි, ආලෝකෝ උදපාදි.** අන්න, ඒ ඥානය අවදි වීමයි මේ ඥාන සූත්‍රය තුළ පැහැදිලි කරන්නේ,

එක සිහියත් සමගයි සිද්ධ වෙන්නෙ! අපි කිව්වා, මේ සිතක් ඇති වෙලා නැති වුන බව දැනෙන්නේ තවත් සිතකට නෙමෙයි ඒකයි සිහිය. ඒකයි ඥානය අවදි වෙනවා කියන්නේ. ඒකයි මේ හැමතැනම ඒ ඤාණය අවදි වන බව පෙන්නුම් කරන්නේ. ඒ ධම්ම චක්ඛුසය අවදිවන බව. ඒකයි පෙර නොඇසූ විරූ දහම්හි මට **පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු,** කියන වචනෙ පෙර නොඇසූ විරූ දහම්හි ඤාණය පහළ වුණා කියන අදහසින් ඔබට දකින්න ලැබෙනවා. එතකොට ඒ ඤාණ සූත්‍රය තුළ බුදුන් වහන්සේ පෙන්වන කාරණාව සංයුක්ත නිකාය, ඍධිපාද සංයුක්තය තුළ ඒ චාපාල වග්ගයේ මෙය දකින්ට ලැබෙනවා. මේ පැහැදිලි කිරීම එහෙම නම් ඒක කෙටි පැහැදිලි කිරීමක්.

නමුත් ඒකෙ අපිට ඕන වුණේ ඉස්සරහට අපි මේ ඍධිපාද ගැන හොඳ පැහැදිලි කිරීමක් මනා පැහැදිලි කිරීමක් ඒ සූත්‍රානුසාරයෙන් දිගින් දිගටම කරන්න උත්සහ කරනවා. හොඳයි එහෙමනම් මේ අපි අවදි වෙන්නේ සිහියටයි ඒ සිහිය තුළ ඥානය අවදි වන්නේ ඒ ඥානය හරහා යන ගමනයි ඤායස්ස අධිගමාය.

තෙරුවන් සරණයි !!!!

# 05. ධම්මකථික සූත්‍රය

**'ධම්මකථික සූත්‍රය' බුද්ධ ත්‍රිපිටක ජයන්ති මාලාව පහළොස්වැනි ග්‍රන්ථයේ සංයුත්ත නිකායේ තුන්වෙනි කාණ්ඩය 285 වෙනි පිටුව ධම්මකථික සූත්‍රය**

එකත්පසක හුන් ඒ මහන භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළේය, වහන්ස ධම්ම කථිකයයි ධම්ම කථිකයයි කියනු ලැබේ, වහන්ස කොපමණකින් ධම්මකථික වේදැයි, " **ඒකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං ඒතදවොච, ධම්මකථිඛො, ධම්මකථිකොති භන්තෙ, වුච්චති. කිත්තාවතා නු කො, භන්තෙ, ධම්මකථිකො හොතී,"** මහන ඉදින් රූපයෙහි කලකිරීම් පිණිස, නොඇල්ම පිණිස, නිරෝධය පිණිස, දහම් දෙසා නම් මහණ ධම්මකථික යයි කියන්නට සුදුසුවේ. ධම්මකථික කියලා කියන්නේ එතකොට තමයි මහණ, ඉතින් රූපයේ කලකිරීම පිණිස, නොඇල්ම පිණිස නිරෝධය පිණිස දහම් දෙසන්නේ නම් අන්න ඒ කෙනාට තමයි ධම්මකථික කියන්නෙ කියලා කියන්නේ,

ධම්මකථික කියලා කියන්නෙ ඔබට දැන් වැටහීමක් ලැබෙන්න ඕනේ මේ බුදුන් වහන්සේ දේශනා කරන මේ ධර්මය කියලා කියන්නේ රූපයේ සත්‍යක් නොවන බව, බාහිරය සත්‍යක් නොවන බව, සිත ද සත්‍යක් නොවන බව, අජ්ජත්ත බහිද්ධා කියන අන්ත දෙක තමයි බුදු කෙනෙක්

ලෝකයට පහළ වෙලා දේශනා කරන ධර්මය ඒ අන්ත දෙකට නොඇලි **මජ්ජේ ඤානං** කියන තැනින් මධ්‍යම ප්‍රතිපදාව, තමයි බුදු කෙනෙක් ලෝකයට දේශනා කරන්නේ, මේ ලෝකය තියෙනවා කිව්වොත් වැරදියි, දැන් සියලුම ශාස්තෘන් වහන්සේලා සියලුම ආගම්වල මේ ලෝකය ඇත්ත කර කරගෙනය ලෝකෙ මත පිහිටලා, තමයි දේශනා කරලා තියෙන්නේ. බුදුන් වහන්සේම පමණයි මේ ලෝකයේ **අජ්ජත්ත, බහිද්ධා** කියන බාහිරත් අභ්‍යන්තරත් කියන අන්ත දෙක පෙන්නලා **මජ්ජේ ඤානං** කියන තැනින් ධර්ම දේශනා කරලා තියෙන්නේ, ලෝකය ඇත්ත කරගන්න නෙවෙයි. විනෙය්‍ය ලෝකේ, ලෝකයේ මායාව, බොරුවක් කියන එක අවබෝධ කරගන්නයි බුද්ධ දර්ශනය තුළින් මේ බෞද්ධයෙක් කියලා කියන්නේ, භවය කියන එක, ලෝකේ තියෙන එක දෙයක් තියෙනවනම්, පොත තියෙනවා නම් මෙතන භවයක් තියෙනවා ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව තියනවා **භව නිරෝධෝ** කියන්නේ බාහිර අපිට හම්බවෙන මේ පොත්, මේස, පුටු, ඇඳන්, ඒ දෙවල් තියෙනවා කියන්නේ එහෙම වුනොත් ජාතියක් හටගන්නවා. උපත ඇතිවීමක්, මගේම නැතිවීමක්, තියනවා ඒ කියන්නේ ජාතියක් මරණයක්. එහෙම වුනොත් තමයි **සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස** තියෙන්නේ දැන් බෞද්ධයෙක් කියලා කියන්නේ මේ බාහිර දේවල් නෑ කියන කෙනයි **භව නිරෝධෝ බෞද්ධයෝ,** එහෙමනං අපි බෞද්ධයෙක් වෙන්නේ බාහිරය ඇත්ත කරගත්ත නිසා නෙමෙයි, බාහිරය ඇත්තක් නොවන බව දැකීම තුළයි. "**චිත්තේන නීයති ලෝකෙ**" සිත තුළ හැදෙන ලෝකය මේ සිතේ තමයි සේරම මැවෙන්නේ මේ සිත තුළයි මේ ලෝකය මේ සම්මුති ලෝකය කියලා අපි හදාගෙන ඉන්නේ. මෙන්න මේ සත්‍ය දකින කෙනා තමයි බෞද්ධයෙක්

කියන්නේ. එතකොට ධම්මකථික කියලා කියන්නේ බුදුන් වහන්සේ දේශනා කළ මේ ධර්මය, නම් එයා දේශනා කරන්නේ එයයි ධර්මය වෙන්න ඕනේ බාහිරය ඇත්තක් නොවන බව දේශනා කිරීම තුළයි, රූපය රූපය කියලා ඔබට අහන්න ලැබෙනවා හැමතැනම මේ හැම දේශනාවකම රූපය කියන වචනෙ තියෙන්නේ මේ හැම දේශනාවක්ම ඔබට අහන්න ලැබුණු "ස්කන්ධ වග්ගය" තුළ විශේෂයෙන්ම හැම දේශනාවකම එකම සූත්‍රයක වත් නැහැ රූපය ගැන කතා නො නොකරන "**රූපය අනිච්චං භන්තේ**" කියන හැම ධර්ම දේශනාවක්ම තියෙන්නේ, එතකොට බුදුන් වහන්සේ මනා කොට මේ දේශනා කරලා තියෙන්නේ බාහිරය ඇත්තක් නොවන බවයි රූපයම තමයි බාහිර කියන්නේ රූපය කියලා කියන්නේ සම්මුතිය තුළ ඔබ සිතන සාමාන්‍ය කෙනෙක්ම කතා කරන රූපය, කියන්නේ පේන මේ රූපයක් ගැනයි කතා කරන්නේ නමුත් බුද්ධ දේශනාව අනුව බුදුන් වහන්සේ රූපය කියන්නේ සියල්ලටම, **ශබ්ද රූප, වර්ණ රූප, ගධ රූප, රස රූප, පහස රූප** ඒ කියන්නේ **පොට්ඨබ්බ කාය ප්‍රාසාද රූප** ඒව වගේමයි **මනෝ රූප මනෝ විඤ්ඤාණ රූප** එතකොට මේ රූප කියලා කියන්නේ අරමුණු වලටයි, හිතට අපි කතා කරනවා හැම මොහොතෙම අපිට සිතක්ම උපදිනවා නිරුද්ධ වෙනවා. මේ සිතක් උපදිනවා නම්, එතන සිතක් කියන්නේ අරමුණක්, ශබ්ද අරමුණක් එනව නම් ඒක ශබ්ද සිතක්, එහෙම නම් ශබ්ද රූපයක් එ වර්ණ අරමුණක් එනව නම්, ඒක **චක්ඛු විඤ්ඤාණ සිතක්,** එහෙම නම් එතන තියෙන්නෙ වර්ණ රූපයක් ඒ වගේම තමයි ගඳ අරමූණු වෙනව නම් එතන ඝාණ විඤ්ඤාණ රූපයක් එතකොට මේ රූපය කියලා කියන්නේ ඔබ දන්නවා දැන් ශබ්ද, වර්ණ, ශබ්ද, ගන්ධ, රස, පහස, ඒ වගේ අරමුණු ගැනීමයි රූපය

කියන්නේ, දැන් මේ ධර්මය දේශනා කරනවා කියනවා නම් කවුරුහරි, එතන ධම්මකථික කියලා කියන්නේ ඒ දේශකයන් කරන දේශනයන් වහන්සේ එහෙමනම් එයා ධම්මකථික වෙන්නේ මේ රූපයේ සත්‍යක් නොවන බව කියන්න ඕනෑ. ඒ කියන්නේ බාහිර ඇත්තක් නොවන බව කියන්න ඕනේ, බාහිර ඇත්ත කරගැනීම රූපය ඇත්ත කරගැනීම බාහිරය ඇත්තක් නොවන බව දැකීම රූපය ඇත්ත නොවන බව දැකීම යමෙක් ධම්මකථික කියලා කියනවා නම් ඔහු මේ රූපයේ **අනිච්චං භන්තෙ** කියන තැනින් බණ කියන්න ඕනේ, එහෙම නැත්නම් ඒක මේ සාසනයට අදාල ධර්මයක් වෙන්නේ නැහැ.

ධම්මකථික වෙන්නෙත් නැහැ. ඒක තමයි මේ සූත්‍රයේ තියෙන විශේෂත්වය, ධම්මකථික බව, කෙසේ නම් ධම්මකථික වෙම්ද? ඒ තමයි භික්ෂූන් වහන්සේලා අහන ප්‍රශ්නය. එතනදී, බුදුන් වහන්සේ පැහැදිලිවම සෘජුවම පිළිතුරු දෙනවා, **'රූපස්ස චෙ භික්ඛු, නිබ්බිදාය විරාගාය නිරෝධාය ධම්මං දෙසෙති. ධම්මකථිකො භික්ඛු'ති අලං නා, වචනාය** 'එතකොට තේරුම් අපි කිව්වා මහණෙනි ඉඳින් රූපයේ කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරෝධය පිණිස දහම් දෙසා නම් ඒ මහණ ධම්මකථික යැයි කියනු ලැබේ. එතකොට රූපයෙ කලකිරීම් පිණිස නොඇල්ම පිණිස නිරෝධය පිණිස ආශ්වාද ආදීනව නිස්සරණ පිණිස ඔබට මේ මොහොතේ අරමුණක් එනවනම් එය වර්ණ සිතක් නම්, අපි උදාහරණයක් විදියට නිතරම කතා කරන දේ පොත කියන අරමුණ එනවා කියමු. ඔය පොතක් පේනවා එතකොට පොතක් පේනවා නම් තමයි සිත. පොත කියන අරමුණ ආරම්මණය තමයි සිත. එතකොට ඒ **චක්ඛු විඤ්ඤාණ** සිත, ඒ පොත කියන අරමුණ එයමයි

එතකොට ඔබේ අරමුණ සිත පොත දැකීම තුළ ඔබ රැවටිලා තියෙන්නේ. ඔබ කියනවා බාහිර පොතක් තියෙනවා කියලා. පෘථග්ජන කෙනෙක්ගේ අවිද්‍යාව තුළ ඉන්න මිථ්‍යාදෘෂ්ටිය තුළ ඉන්න කෙනාගේ අදහස ඒකයි බාහිර පොතක් තියනවා. නමුත් මේ ධර්මය දකින කෙනාට පොත කියන්නේ සම්මුති ප්‍රඥප්ති නාමයක්, බාහිර හැඩතල සතර මහා භූත පොත නෙමෙයි පොත කියන්නේ. අපි ජීවත් වෙන්නේ පොතක් එක්ක. අපේ හිතේ තියනවා චිත්ත රූපයක්, අපේ හිතේ තියෙනවා සිතුවිල්ලක්. ඒය සම්මුතියක්. අපි හදාගත්ත එකක් පොතක්, බාහිර පොත් කියලා දෙයක් නැහැ, අන්න ඒක දැකීමයි රූපයෙ අනිත්‍ය දකිනවා කියන්නෙ.

සිතට රූපාරම්මනය එනකොටම ඒ තමන් විසින් හදාගත්ත සිතුවිල්ලක්, තමන් ඇසුරු කරන්නේ චිත්ත රූපයක්. **චිත්තේන නීයති ලෝකෙ** සිතේ හැදෙන එකක්. උපාදාය රූපයක් කියන්නේ බාහිර එකක් නොවේ සිතේ හැදෙන එකක්. ස්කන්ධයෙන් තමයි ඔබට මේ පොත් කියන අරමුණ හැදිලා තියෙන්නේ. ඇහැට එන්නේ හැඩතලයක්, කිරණයක්, ආලෝකයක්, ඒක ප්‍රතිබිම්බයක්, ගසත් ආලෝකයත් නිසා වැටෙන සෙවනැල්ල, සෙවනැල්ල තමයි **තිණ්ණංසංගති ඵස්සෝ.** සලායතන ඇස නමැති ආයතන විසින් හදන දේ. අපි කලිනුත් කිව්වා මේ ඇස කියන්නේ මස් ඇහැ නෙමෙයි. එහෙනම් මැරුණු කෙනාටත් ඇහැක් කියනවා මැරුණු කෙනාට තියෙන ඇහැට පේන්නෙ නැහැ. එහෙනම් මස් ඇහැට නෙමෙයි ඇස කියන්නේ. පේන බවයි මේ මොහොතේ ආලෝකයක් එනවා, නම් එයට දීප්තියක් එන්න ඇස ඇතුලේ තියෙනවා කේශ නාලිකා, ඒ ඔස්සේ පන ගැන්වුණු මේ **කම්ම චිත්ත සෘතු ආහාරය** කියන එහෙම

නැත්නම් ඔබ කියන වචනයෙන් ඔබ කියනවා මේ ඇහේ තියෙන කළු ලපය ධර්මය විදියට පැහැදිලි කරනවා නම් ප්‍රසාද රූපයක් ප්‍රසාද වත් වෙනවා, ආලෝකයට කන්නාඩියක් ඇල්ලුවම දිලිසෙනවා මේක තමයි අපේ චක්ඛු ඇස, ප්‍රසාදවත් වෙනවා. මෙන්න මේ ප්‍රසාද්වත් වීමයි පෙනීම. ඒ ඇස කැමරාවක් ෆොටෝ එකක් ගන්නවා. ඒක කිරනයක්, ඇහැ දන්නේ නැහැ මොකක්ද කියලා. අපි හිතින් තමයි කියන්නේ පොතක් කියලා අන්න ඒ ඇහේ මූලික අවස්ථාව තමයි චක්ඛු විඤ්ඤාණ අවස්ථාව. අඳුරන්නේ නැහැ මොනවද? කියලා හැඩතල පමණයි ඒ හැඩතල තමයි එතනදි **තිං නං සංගති ඵස්සෝ.** මනසට ස්පර්ශ වන්නේ. අන්න මනෝ විඤ්ඤාණයෙන් කෙරෙන්නේ කලින් තිබුණු සංඥා එක්ක ගලපලා මේ පොතක් කියලා, ගලපන එක. ඒක තමයි හැඩතලය, රූපය, විඳීම්ක් එක්කනෙ එන්නේ. ඒ විඳීම තමයි "සංඥාව" කියන්නේ. වේදනාව සංඥාවකින් නේ අපි දන්නේ. ඒක සංඥාවක් ඒ විඳීම, හැඩතලය, සංඥාව පෙර සංඥාත් එක්ක ගැලපීම් සංඛාර කරනවා කියන්නේ. ඒ දැන ගැනීමමයි විඤ්ඤාණය කියන්නේ. **රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ** කියන මේ ස්කන්ධයට. මේ ස්කන්ධය කියන්නේ අපි හැමතිස්සෙම කියනවා වෙන මොකක්වත් නෙමෙයි මේ අරමුණමයි කියලා. ඒ අරමුණේ මුලික අවස්තාවයි ස්කන්ධය එතන පොත් කියලා දෙයක් තිබුණෙ නැහැ. උපාදාය කියන තැනදී අපි මේ පොත හඳාගන්නව? ස්කන්ධය තුළින් හදා හදා ගන්නවා ඊට පස්සේ අපි ඇසුරු කරන්නේ, අපි විසින් හදාගත්ත පොතක්. පෙර සංඥාව අනුව ගලපා ගත්ත නාමය. ඒකයි උපාදාය රූපයක් කියන්නේ. ඒක චිත්තරූපයක්. පොත කියන්නේ නාමය, නම් ඒකෙ වටිනාකමක් තියෙනවා. ඒක චිත්තරූපයක්. බාහිර හතර මහා භූත වල අපි හිතනවා අන්න

අතන තමයි තියෙන්නෙ. අර තියෙන්නෙ කියලා ගැටගහනවා හතර මහා භූතවලට නමුත් එතන එහෙම දෙයක් නැහැ.

අපි සිතින් හැම එකක්ම මවාගෙන ඉන්නේ අපි ජීවත් වෙන්නේ අපේ සිතේ ලෝකයක සිතුවිලි ලෝකයක, සිතිවිලි ලෝකය බාහිරයෙන් හම්බ වෙන්නේ නැහැ කවදාවත්. ඒක නිසා තමයි බුද්ධත්වය ලබන්නේ බුදුන් වහන්සේ ඇයි ඒ භව බාහිර තියෙන එක නැති කිරීම බෞද්ධ කියන්නේ. බුද්ධ කියන්නේ බෞද්ධ කිරීම ඔය ඕන විදියට වචන විග්‍රහ කරන්න පුළුවන්, නමුත් මෙතන වචන නෙමෙයි ලොකු තේරුමක් තියෙනවා අපි සිතුවිලිත් එක්ක ඉන්නේ එතකොට බාහිරයෙන් රූපයක් හම්බ වෙන්නේ නැති එකයි රූපය අනිත්‍යය දකිනවා කියන්නේ. රූපං නිච්චතෝ අනිච්චං භන්තේ එතකොට එතනම ඔබට පැහැදිලි වෙනවා දැන් ධම්මකථික කියන්නේ. කොතනින් නම් ස්වාමීනි, ධම්මකථික කියමුද? එතකොට බුදුන් වහන්සේ පිළිතුරු දෙනවා මේ රූපයේ **රූපස්ස චෙ, භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය ධම්ම. දෙසෙති ධම්මකථිකො** එතකොටම තේරෙනවා **රූපයේ භික්ඛු, නිබ්බිදාය, විරාගාය, නිරෝධාය, ධම්ම දේසේති.** එහෙනම් එයා ධර්මය දේශනා කරනවා නම් ඒ කවුරුහරි කෙනෙක් මෙන්න මේ විදියට රූපයෙන් මිදෙන්න ඇලෙන්නෙ නැතුව රූපයක් නැති බව නිරෝධය දකින්න, සිතින් හදාගත්ත රූපයක් බාහිර රූපයක් නැති බව දකින්නයි එයා ධර්ම දේශනා කරන්න ඕනේ එහෙනම් බාහිර දෙයක් තියෙනවා ඒක පූජා කරලා පින් කරන්න පුළුවන්, පව් කරන්න පුළුවන්. ඒක කරලා දිව්‍ය ලෝකෙ යන්න පුළුවන් කියන අය ධම්මකථික නෙමෙයි. දැන් ඔබට පැහැදිලි ද මේ බුද්ධ දර්ශනය ඉතාමත්ම වෙනස් ඒකයි **පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු** කියලා කියන්නේ ඕන ඕන විදියට බණ කියන්න බැහැ.

**මජ්ජේ ඥානං** කියන තැනින් යමෙක් ධර්මය දේශනා කරන්නෙ නැත්තන් ඔහු **ඉඳ භික්කවේ භික්බු** මේ සාසනයේ ධම්ම කථිකයෙක් නෙමෙයි, පැහැදිලිද? ඔබට මේ ඍජු භාවයෙන්, මේ දේ අවබෝධ කර කරගන්න. අද ගොඩක් භික්ෂූන් වහන්සේලා ධර්ම දේශනා කරන්නේ ඇත්තටම ධර්මය නොදැන. ධර්මයක් දේශනා කරනවා නම් එයා බාහිර දෙයක් තියෙනවා කියලා කියන්න බැහැ. බාහිර දෙයක් තියෙනවා කියලා කියන දේ නැතුව එයාට බණ කියන්න බැහැ. පින් කරන්න. පව් කරන්න, දිව්‍යය ලෝකේ යන්න කියලා. ඔය කතාව කියන්න බැහැ ඕක මුසාවාදයක් වෙනවා. මුසාවාදය ගොඩක් අය කරගෙන යනවා. ඒක බුදුන් වහන්සේ 'ආණි සූත්‍රයේ' දේශනා කරනවා. අනාගතේ භික්ෂූන් වහන්සේලා ශුන්‍යයත, පටිසංයුත්ත, දේශනා විකෘති කරනවා. ඒවා කියන්නේ නැහැ කියලා ඒ කියන්නේ මේ සත්‍ය දේශනා ඔවුන් ප්‍රකාශ කරන්නේ නැහැ ඔවුන් බොළඳ තැනකින්. අනිත් දෘෂ්ටිවලට කොටුවෙලා ඒ වගේ එකක් කියනවා. ඔවුන් හදාගත්ත එකක් සූත්‍ර පිටක වල හොඳට පේන්න තියෙනවා. එහෙම දෙයක් නෙවෙයි තියන්නේ අපි මේ කතා කරන ස්කන්ධ වග්ගයේ කිසිම තැනක නැහැ රූපය **අනිච්චං බන්තේ** කියන කතාව හැර වෙන කතාවක් එතනින් තමයි ශ්‍රමණ, පනවන්නේ ශ්‍රමන සූත්‍රය අපි පැහැදිලි කළා. එතනින් තමයි අරහත්වය පනවන්නේ. එතනින් තමයි සෝතාපන්න භික්ෂුව පනවන්නේ. එතනින් තමයි ධම්මකථික කියන්නේ කවුද? කියලා පනවන්නේ ඔබට වැදගත් ඒක නිසාමයි. ඔබ ධර්මය අහන්න ඕන. මෙන්න මෙය අවබෝධ කරගන්න ඕනේ. දැනගන්න ඕනේ, ඒ තුළ ඔබ රැවටෙන්නේ නැහැ. ඔබ අසරණ වෙන්නේ නැහැ. ඔබ නිවැරදි ධර්මය කුමක්ද? කියන එකට, ඔබගේ සිත පිරිසුදු කර ගන්න. මේ දේශනා

හේතු වෙනවා. ඉතින් ධම්ම කථිකයෙක් වෙන්නේ "රූපයේ නිරෝධය දකින" කෙනා පමණයි. එය ඔබට දැන් පැහැදිලියි. මහණ ඉඳින් රූපයෙහි කලකිරීම පිණිස, නොඇල්ම පිණිස, නිරෝධය පිණිස, පිළිපන්නේ වේ නම් මහණ ධම්මානුධම්ම පටිපන්න යයි කියන්නට සුදුසුය. අන්න ධම්මානුධම්ම පටිපදාව, වෙන්නෙ කොහොමද, ධම්මානුධම්ම පටිපදාව ඔබ කියනවා ධම්මානුසාරී, ධම්මානුසාරී, වෙන්නේ කොහොමද? රූපයේ අනිත්‍ය දකින කෙනා ඒ දැකීමයි ධම්ම කියන්නේ, ධර්මතාවය දැකීමයි. **ධම්මානුසාරී** ඒතාක් ධර්මය දකින්නේ නැති කෙනා ධම්මානුසාරී නෙවෙයි රූපයෙ අනිත්‍ය දකිනවා කියලා මේ රූපය ඇත්ත වෙලා මේ තියෙන පොතේ අනිත්‍ය දකින එකක් නෙවෙයි. පොතේ කැඩෙන බිඳෙන එකක් නොවේ, මේ කියන්නේ පොතක් හැදෙන්නේ නැති තැන සමුච්ඡේද ප්‍රහානයක්, පොතක් හැදෙන්නේ නැති තැනමේක ගොඩක් අයට තේරෙන්නේ නැහැ. බොහොම සියුම් දර්ශනයක් මෙතන, බුදුන්වහන්සේ ඉදිරිපත් කරන්නේ ඒකයි කියන්නේ මහණෙනි අශ්ව ලෝමක් සියක් කඩකට පැලෙන්න විද්ද දුනුවායෙක් එයත් විශ්වාස කළ හැකිය. මේ ධර්මය අවබෝධ කිරීම සුකර නොවේ, ලේසි නොවේ ඇත්තටම ලේසි නැහැ. මේ හරි සියුම් කාරණයක් මෙතැන තියෙන්නේ පොතේ අනිත්‍ය දකින එකක් නොවේ. පොත් ඕනතරම් හදාගත හැකිය පොත නැති උනොත්, ඒක නිසා ඒක නෙමෙයි මේ ධර්මය.

මේ ධර්මය නම් පොත සත්‍යක් නොවන බවයි. ඍජුවම දකින්න. බොහොම ඍජුයි මේ ධර්මය. ඇත්තටම හැම වචනයකම, ඒ ඍජු භාවය දකින්න ලැබෙනවා. **රූපස්ස චෙ, භික්ඛු, නිබ්බිදාය විරගාය නිරෝධාය පටිපන්නො හොති, ධම්මානුධම්මපටිපන්නො භික්ඛූති අලං වචනාය.** එතකොට

මහණෙනි, රූපයේ කලකිරීම් පිණිස, නොඇල්ම පිණිස, නිරෝධය පිණිස, පිළිපන්නේ වේ නම් ඒ මහණ ධම්මානුධම්ම පටිපදාව යැයි කියන්නට සුදුසුය, ධම්මානුධම්ම පටිපදාවට එන්නේ අන්න එතනින් මහණ ඉදින් රූපයේ කලකිරීමෙන්, නොඇල්මෙන, නිරෝධයෙන්, උපාදාය රහිතව මිදුණේ වේ නම් ඒ මහණ දුටු දැමුවේ නිවනට පැමිණියේ යැයි කියන්නට සුදුසු වේ. අන්න රූපේ මේ සත්‍ය දකින එක ධර්මතාවය දකින එක ධම්මානුධම්ම පටිපදාව යමෙක් ඒ ධම්මානුධම්ම පටිපදා වේ පිහිටලා ඉන්නවනම් ඒ කෙනාට ධම්මානුධම්ම පටිපන්න යැයි කියනු ලැබේ, එතකොට ඒ වගේම තමයි ඔහු ඒ ප්‍රත්‍යක්ෂතාවයට පත් වෙනවා නම් යමෙක් මේ ධර්මය දැකලා, එන එන අරමුණට සිතට පෙන්නනවා නම්, බාහිරෙන් මිදෙනවා නම්, **බාහිර විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දෝමනස්සයට** එනවා නම් අන්න ඒ කෙනා රූපයේ නොඇල්මට ගිය නිරෝධයට ගිය කෙනා, උපාදාන රහිතව මිදුනු කෙනා, නිවනට පැමිණියේ යැයි කියනු ලැබේ. ඉතාම වැදගත් දැන් මේ නිවන් මග හොඳටම ඒ කෙනාට ප්‍රත්‍යක්ෂ තාවයට පත්වීම් තුළ, නිවන් දකින කෙනා කියන්නෙ, අන්න ඒ කෙනාට කියන එකයි. සිංහලෙන් මේක සරලව පැහැදිලි කරනවා නම්, සූත්‍රය තුළ මෙහෙමයි මේ කාරණය තියෙන්නේ **"රූපස්ස චෙ භික්ඛු නිබ්බිදා විරාග නිරොධා අනුපාදාවිමුත්තො හොති දිට්ඨිධම්ම නිබ්බාන පත්තො භික්ඛු'නි අලං වචනාය, දිට්ඨධම්ම නිබ්බානප්පත්තො භික්ඛුති අලං වචනායති."** අර නිවනට පත් වුණා කියන කාරනාව දිට්ඨධම්ම නිබ්බානයට පැමිණෙන කියන කාරණාව, **භික්ඛුනි අලං වුච්චති** කියන තැන මහණ ඉදින් වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණයෙහි කලකිරීම විඥානයේ කලකිරීම් පිණිස, නොඇල්ම පිණිස, නිරෝධය පිණිස, දහම් දෙසා නම් මහන ධම්මකථික යැයි ඒ

අනුව කීම සුදුසු වේ. මහණ ඉතින් විඤ්ඤාණයේ කලකිරීම පිණිස, නොඇල්ම පිණිස, නිරෝධය පිණිස, පිළිපන්නේ වේ. නම් ධම්මානුධම්ම පටිපදාව යැයි කීම සුදුසු වේ. ඒවගේ ම මහණෙනි විඤ්ඤාණයේ කලකිරීමෙන් රූප, වේදනා, සංඥා, සංඛාර විඥානයේ කලකිරීම, නොඇල්ම, නිරෝධය උපාදාන රහිතව මිදුණේ වේ නම් මහණ මේ දුටු දැමුවේ නිවනට පැමිණියේ යැයි කියන්නට සුදුසුය. ඉතිං අපි මේ ඉදිරිපත් කළේ ඔබගේම පිරිසිදුවීම සඳහා **ධර්මය** නම් ධර්මයයි, ධර්මය වන්නේ කුමක්ද? රූපය අනිත්‍ය දැකීමයි. රූපයේ අනිත්‍ය දැකීම කියන්නේ මේ රූපය කියන්නේ බාහිරයේ පොතක අනිත්‍ය දකින එකක් නොවේ. මේක අපි නිතරම කියනවා. මොකද අද අපි දකිනවා බොහෝ භික්ෂූන් වහන්සේලා මේක පටල ගෙනයි තියන්නේ. බාහිර දෙයක් ඇත්ත කරගෙන එකෙ අනිත්‍ය දකින්නයි හදන්නේ ඒ නිවන් මඟක් නොවේ.

මෙය බොළඳ තැනක් නිවන බොළඳයි කියලා හිතන්න මෙය එපා. ඔබගේ බොළඳතාවයට ඔබට නිවනට පත්වීමට සිදු නොවන එකයි වන්නේ, ඒ බොළඳ කෙනා නිවනට පත් වන්නේ නැහැ. නිවන නම් මේ රූපයේ ඇත්ත දකිනවා කියන්නේ යථාභූත ඥානයෙන් දකිනවා කියන්නෙ රූපයක් සත්‍ය නොවන බවයි දකින්නේ. **රූපයේ සත්‍ය නම් තමන්ගෙ හිතේ හැඳුණු ඒ චිත්ත රූපය බාහිර හතර මහා භූත රූපයට එකතු වෙන්නේ නැහැ. එයයි සත්‍යය,** ඒ නිසා ඔබ දකින්නේ ඇසුරු කරන්නේ බාහිර ලෝකය නොව ඔබගේ **චිත්තේන නීයති ලෝකෙ** ඔබ ඉන්නේ සිතුවිලි ලෝකයක. ඒ සත්‍ය දකින කෙනා, ඒ සිතෙන් මිදෙන කෙනා, නිවන් සාක්ෂාත් කරනවා ඉතින් එයයි පිරිසුදු නිවන් මඟ එහෙම නම් මෙය කොතකින් නම් ධම්මකථික වේද? කියනකොට ඒ රූපයේ නිරෝධයට

නොඇල්මට නිබ්බිදාවට විරාගායට නිරෝධාය කියන තැනට, ඒ රූපය හට නො ගන්නා තැනට යමෙක් සත්‍ය ධර්මය දේශනා කරනවා නම්, බාහිරය ඇත්තක් නොවන බව යමෙක් දකිනවා නම්, ධර්මය ද දේශනා කරනවා නම්, අන්න එයයි ධම්මකථික කියන්නේ, **ඉද භික්කවේ භික්බු** මේ සාසනයේ ධම්ම කථිකයෙක් වෙන්නේ බාහිර ඇත්තක් නොවන බව දේශනා කරන අය පමණයි. සමාජයේ ගොඩක් මේ පැටලිලා තියෙන තැනක්. සමාජයේ බොහෝ අය ඇත්තටම මෙය පිරිසුදු කරගෙන නැහැ කොතැනින් නම් මේ පිරිසිදු ධර්මය අපි ඉස්මතු කරමුද කියනඑක එහෙම නම් බාහිර සත්‍යයක් නොවන බව දැකීමයි, ඇත්තටම **භව නිරෝධයට යන තැන, බෞද්ධයෙක් වෙන තැන,** හැමෝටම මේ කාරණා සැබෑ බෞද්ධයෙක් වන්නට හේතු  කාරණා වෙනවා

තෙරුවන් සරණයි!!!

# 06. පරිඤ්ඤෙය්‍ය සූත්‍රය

**පරිඤ්ඤෙය්‍ය සූත්‍රය සංයුක්ත නිකායේ තුන්වෙනි කාණ්ඩයේ බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාව පහළොස්වෙනි ග්‍රන්ථයේ 277 වන පිටුව, පරිඤ්ඤෙය්‍ය සූත්‍රය**

මහණෙනි පිරිසිඳ දත යුතු දහම් ද, පිරිසිඳ දැනීම ද, පිරිසිඳ දැන සිටි පුගුලහු ද, දේශනා කරමි. එය අසව්! **පරිඤ්ඤෙය්‍ය භික්ඛවෙ ධම්මෙ දෙසෙස්සාමි පරිඤ්ඤංච පරිඤ්ඤාතාවිං පුග්ගලඤ්ච. සුණාහි** එතකොට පිරිසිඳ දැනසිටි ඒ පුගුලාද දේශනා කරන්නෙමි, එය අසව් එතකොට ඊට පස්සෙ කියනවා, **කතමේ ච භික්ඛවෙ පරිඤ්ඤෙය්‍යා ධම්මා?** මහණෙනි රූපය පිරිසිඳ දත යුතු දහමකි. **රූපං භික්ඛවේ පරිඤ්ඤෙය්‍යො චො ධම්මා.** දැන් රූපය පිරිසිඳ දත යුතු ධර්මයක්. අපි ඒක නිසා තමයි ධර්මය තුළ ගොඩක් වෙලාවට අපි මේ රූපය ඇත්ත කරගෙන, අපි ලෝකය ඇත්ත කරගෙන ඉන්නවා කියන එකයි අපට හොඳ අවබෝධයක් තියෙන්න ඕනේ. මේ රූපය රූපං කියනවා. **කිංච නාම රූපං වදේති.** ඒ කියන්නේ රූපය රූපය කියනවා. එතකොට මේ රූපයේ **චත්තාරෝච මහා භූතං චතුනංච මහා භූතං උපාදාය රූපං** රූපං කියන තැනින් ඔබ ඒ වචන ටිකට සීමා වුණොත් ඔබ ඒක දන්නේ නැහැ. ඇයි ඒ එහෙම කියන්නේ, ගොඩක් අය රූපය රූපය කියලා ඇහුවොත් කියන්නේ **චත්තාරෝච** මහා

**භූතං චතුනංච මහ භූතං උපාදාය රූපං**, **රූපං** කියාලා. දැන් ඕක තමයි ගොඩක් අය කියන්නෙ රූපය කියලා. නමුත් ඒකද රූපය කියන්නේ? ඒ හරිද උත්තරේ? ඇයි ඒ වචන ටිකක් කියූ පමණින් ඒක රූපය ගැන දැන ගත්තා වෙන්නේ නැහැ **රූපය පරිඤ්ඤෙයයා** කියන්නේ **රූපය ඇත්තටම**, **රූපය අනිත්‍යය දකිනවා කියන එකයි.** ඒ කියන්නේ ඇත්තටම රූපය කියලා. දෙයක් නැති බව දකින එකයි. හැබැයි මහා භූත ඇසුරු කරගත්ත, මහා භූත නිසා, හදාගත්ත උපාදාය රූපයක් කියලා කියන කොට, එහෙම නම් ඔබද? දකින්නේ.

ඒක උපාදාය රූපයක් ඒ කියන්නේ බාහිර තියෙන එකක් නෙමෙයි. මහා භූතනේ බාහිර. එහෙනම් මහා භූත ඇසුරු කර කරගෙන හටගත් එකක් නේ. මේක හටගන්න ධර්මයක්. අන්න ඇස කියන්නේ හටගන්න ධර්මයක්. ඇස කියන්නේ මේ තියන එකත් නෙවෙයි මස් ඇහැට නෙමෙයි ඒක මැරුණු කෙනාටත් තියෙනවනේ. **ඇස කියන්නේ හටගන්න ධර්මයක්.** අපි කිව්වේ අර ස්පාර්ක් එකක් කියලා අපි කිව්ව **රූප්පණයක්** කියලා **උප්පිත්තදි රුපත්තිකෝ ආවුසෝ රූපං වදේති** කිව්වේ. අන්න ඒ හටගන්න ධර්මයක්, ඇස කියන්නේ හටගන්නා ධර්මයක්. එහෙනම් රූපය කියන්නේ හටගන්න ධර්මයක්. එහෙම නම් හටගත්ත ධර්මය කියන්නේ කොහෙවත් තියෙන එකක් නෙවෙයි. ආලෝකය තියෙනකොට ප්‍රසාදවත් වෙනවා කියන එක. හටගන්න ධර්මයක්, ඇතිවෙන නැතිවෙන ස්වභාවයෙන් එතනම හටගෙන එතනම නිරුද්ධ වෙනවා. එහෙමනම් අපි මේ දකින්නේ බාහිර එකක් නෙමෙයි අපි හිතන ධර්මයක්. අන්න එතනින් ඕනේ මේ ධර්මය දකින්න. එතකොට තමයි ඔබට ධර්මය හොඳින් දකින්න ලැබෙන්නේ. මහණෙනි, රූපය පිරිසිඳ දත යුතුය. **රූපං භික්ඛවේ**

**පරිඤ්ඤෙය්‍යො ධම්මො** මෙන්න මේ රූපයේ පරිඤෙඤ්‍යය දකින එක පිළිසිද දකිනවා කියන එක ඉතාම වැදගත් කාරනාවක්. ඇත්තටම රූපය අවබෝධ කරගතහොත් රූපය දකිනවා කියන තැන රූපය පරිඥෙඤ්‍යය කියන තැන නිවන් මඟම තියෙනවා. සියල්ල අවබෝධය, රූපය තුළයි තියෙන්නෙ. **රූපං නිච්චතො අනිච්චතෝ අනිච්චං භන්තෙ** කියන කොටත් වැටහෙනවා රූපය පිරිසිද දකිනවා. **ඉති රූපං ඉති රූපං සමුදයෝ ඉති රූපං අත්තගමෝ** කියනකොටත් අපිට ඒක වැටහෙනවා. එහෙනම් මේ රූපයේ පිලිසිඳ දැකීම නිවන් මගට කලයුතු ප්‍රධාන කටයුත්ත වන්නේ, ඇස පිළිසිඳ දැකීමයි, රූපය පිළිබඳ දැකීමයි, කියන්නේ එකමයි, එකම කාරණයයි. ඇස කියන්නේ කුමක්ද? පේන බවට එහෙම නම් පේනවා කියන්නේ අපිට පේන්නේ කුමක්ද? රූපය. එතකොට රූපය කියන්නේ **වර්ණ රූප, ශබ්ද රූප, ගන්ධ රූප, රස රූප, පොට්ඨබ්බ රූප.** එතකොට මේ රූප කියන්නේ එකක් නෙමෙයි, හැමදේම රූපයක්. එතකොට අපිට පේන, ඇහෙන ශබ්ද, හැමදේම රූප, රූප්පනයක් ඒ කියන්නේ ස්පාර්ක් එකක්. ඒ කියන්නේ ඉද්දීමක්. ඒ කියන්නේ ඇත්තටම කොහේවත් තියන එකක් නෙවෙයි. එහෙනම් අපි මේ බලන්නේ, අපි අල්ලන්නේ ඇල්ලුවොත් දැනෙන්නේ තද ගතියක් ඇහැට පේන්නෙ වර්ණයක්. එන්නේ ශබ්දයක්, තට්ටු කළොත්, ඉඹලා බැලුවොත් සුවඳක්, දිව ගාලා බැලුවොත් රසක්, ඔතන කොහෙන්ද? මේසයක්, පුටුවක්, පොතක්. ඒක අපි හිතන එකක්. පොත කියන්නේ ශබ්දයක් අපට පේන්නෙ වර්ණයක්. එහෙම වෙන්න පුළුවන්ද? එහෙමනං මේ රූපය කියන්නේ ඇත්තටම මායාවක්. **මාරූප මංච විඤ්ඤාණං.** දැන් තේරෙනවා **රූපය පජානාති** කියනවා නම් එතන **වේදනා සංඥා සංඛාර පජානාති.** ඒවා එකක් පජානාති වෙලා

අනිත් එක දන්නැති වෙන්නේ නැහැ. ඇයි? රූපය කියන තැන් හටගන්නේ පොත නම්, පොත කියන්නෙම සංඛාරයක්, සංඛාරයක් කියන්නේ විඥානයක්. ඒ දෙක හැදෙන්නේ ආපු හැඩතලය වේදනාව කිරණය වින්දේ. අන්න ආපු කිරණය හැඩතලය **පටිඝ සම්ඵස්සයට අධිවචන සම්ඵස්සය** කියලා හැඩතලය. හැඩතලයේ කියන්නේ කිරණයක්. අපි  දකින්නේ පොතක් ශබ්දයක් කොහොමද? ඒක වුණේ? අන්න **වර්ණ, ගන්ධ, රස, ඕජා** සේරම එක්තු වෙලා හැදුනු මේක අපි කිව්වේ මේ මොහොතේම හැදුනු **විඥානයක්** කොහෙවත් තියෙන එකක් නෙවෙයි. මහණෙනි, එක දිගට පවතින විඥානයක් ගැන මම කියන්නේ නැහැ මහණෙනි, අන්න **සාතිය** භික්ෂුවට බුදුන් වහන්සේ දේශනා කරනවා, එක දිගට පවතින **විඤ්ඤාණයක්** නැත මහණෙනි කියලා, එහෙම නම් එක දිගට තියන දේකුත් නෑ. මේ දැන් ඇහැ අරිනකොට ලෝකය මැවෙනවා. ඇහැ වහනකොට ලෝකය නිවනවා. තියන ලෝකයක් නැහැ මහණෙනි කිව්වේ අන්න ඒ නිසයි. එහෙම නම් මේ ධර්මය ඔබට මනා කොට පැහැදිලි වෙනවා අපි හිතන දෙයක් කොහේවත් නැහැ. අපිට පේන දෙයක් කොහේවත් ඇත්තෙත් නැහැ. එහෙනම් ඒක සිතුවිල්ලක්ම පමණයි. අපි දකින්නේ, මහා භූත නෙමේ. අපි දකින්නේ චිත්තයක්. පොතක්, මේසයක්, පුටුවක්, ඇඳක්, ඉරක්, හඳක්, ගෙයක් දොරක්, ගහක් වැලක් කුමක්ද? ඒක ශබ්දයක්. එහෙනම් ඒක චිත්තයක් නාමිය චිත්ත රූපයක්. ෆිල්ම්  එකක් බලනවා වගේ තමයි ටීවී එක දිහා බලන් ඉන්නවා වගේ තමයි ඔහේ එළිය දිහා බලන් හිටියත්. ඇයි ඒ දරුවා, අපි හිතනවා, හිතේ ද දරුවා ඉන්නේ? දරුවා අසනීප වෙලානේ. එතකොට අපි හිතනවා එතකොට මොකද වෙන්නේ එක්කෝ ඒකෙ ඇලිමක් එක්කෝ ඒකෙ ගැටීමක් ඒකෙ අනුසය ඉතිරි වෙනවා. ඒ

තමයි සැප දුක. එතකොට මොකද වෙන්නේ අපි විඳවනවා. එතකොට මොකද වෙන්නේ දුක් විඳිනවා සැප විඳිනව කියන්නෙ ඕකටයි. ඒ තුළ මොකක්ද? වෙලා තියෙන්නේ? ඔබ විඳවනවා ඒ කියන්නේ ඔබ තුළ නිරායාසයෙන්ම යමක් සිදු වෙනවා ඒ කුමක්ද? ඒ තමයි ඔබට මෙතනදි ජීවමය දැනීමක් අර වටිනාකමක්, මැනීමක්, මිම්මක්, ආත්මීය පණ තියෙන ස්වභාවයක් උපදිනවා,

මෙන්න මේක අපි පහසුවෙන් කියනවා මේ ස්පාර්ක් එක තුළ මිලි වෝට් 5ක කරන්ට් එකක් උපදිනවා කියලා. ඕකම තමයි ඔය කියන්නේ. ඒක වචනවලට පෙරළුවොත් ඔය වගේ ආත්මීය සිතක්නේ ඔබ හිතනවා කියන්නේ. එතකොට ආත්මීය සිතක් තියෙන්නෙ ඒ නිසා ඔබ ධර්මය බලන්නේ ආත්මීය සිතකින් එතකොට ඔබට මොකද වෙලා තියෙන්නෙ ඔබේ ඔන්න ඕක ඔය විදිහට කිව්වොත් තමයි දරා ගන්නේ. එතකොට මොකද වෙන්නේ ඔබගේ බොළඳ මනසට ඒක හරි හොඳයි කියලා හිතෙයි, නමුත් ඔය ධර්මය අනාත්මයි. වැටහෙනවද? ඔබට, ඔබ හිතනවා බාහිර දැන්, මේ තියෙනවනේ ආ පොත තියෙනවනේ, ආ දැන් පොතේ අනිත්‍ය දැක්කා නම් හරිනේ. එතකොට රූපයේ අනිත්‍ය දැක්කා වෙනවානේ, බුදුන් වහන්සේ කියන්නේ රූපයේ අනිත්‍යය දකින්න කියලනේ. එහෙමනං අපි නිවන් දකිනවනේ කියලා ඔබ කියයි. ඔබ කවදාවත් නිවන් දකින්නේ නැහැ ඒක අපි කියනවා. ඇයි ඒ ඔබ සර්පයා වලිගෙන් අල්ලාගෙන. නැති දෙයක් තියෙනවා කියලා හිතාගෙන ඒකෙ අනිත්‍ය දකින්න යනවා. කොයි තරන් අඳබාල මෝඩද කියලා ඔබට වැටහෙන්නේ නැහැ. එතකොට, ඒක මහා අඥාන කමක් ඔබේ තියන බොළඳ කමට මේ ධර්මය බොළඳ කරගෙන, කරලා

ඔබට ගන්න බැහැ. **ඔබ එන්න සත්‍ය කරා මේක අනාත්ම ධර්මයක්.** එහෙනම් මේක ආත්මීය මනසින් දකින්නේ ඇයි? එතන දකින්න අනාත්ම ධර්මය. කොහොමද ස්පාර්ක් එකක් කිව්වේ, ඒකයි ප්‍රසාදයක් කිව්වේ ඒකයි. ආවේ හැඩතලයක් කිරණයක්, ශබ්දයක් වර්ණයක් කිව්වේ එකයි නැත්නම් භාහිය තාපසතුමාට කියන්න තිබුණා අර කෙටිම පණිවිඩය ආත්මීය විදියට, එහෙම දෙයක් නැහැ. ශබ්දෙක කොහේද ආත්මයක්? වර්ණයක කොහෙද ආත්මයන්, ආත්මයක්, අන්න පොතක් කිව්වොත් එතන ආත්මීය ස්වභාවයක්. ඇයි ඒකේ පණ තියෙනවා. ඒකෙ තියෙනවා සවිඤ්ඤාණක සප්‍රාණික ගතියක්. නමුත් අපි එක ශබ්දයක් කිව්වොත් මොකද වෙන්නේ ඒක අප්‍රාණිකයි. එතකොට මේ ධර්මය අනාත්මයි කියන්නේ ඇයි? අන්න ඒ අනාත්ම ස්වභාවයයි මේ ධර්මය තුළ තියෙන්නේ. ඒ කියන්නේ එන්නේ කිරණයක්, ශබ්දයක්. අපි දකිනවා කියන එක ආත්මිය මායාවක් විඤ්ඤාණය මවන දෙයක් '**දේදුන්න**' වගේ. එහෙම එකක් ලෝකේ කොහෙවත් නැහැ. අපි ඇසුරු කරනවා, අපි ඒකයි කිව්වේ අපි හිත ඇතුලේ අපි හදාගත්ත ලෝකයක අපි ජීවත් වෙනවා කියලා. එහෙම කිව්වොත් ඔබට තේරෙන්වා, ඒ කියන්නේ අපි සිතුවිලිවලින් මැවෙන මායාවක අතරමං වෙලා. ඒකයි අපි ටීවී එක බලාගෙන අඬන්නේ, අන්න ඒ මායාව දකිනවානම් අපි ඇත්ත ලෝකෙත් දකින්නේ ටීවී එක වගේමයි. අපේ හිත් ඇතුලේ ලෝකයක් මිසක්, එළියෙ තියන ලෝකයක් නෙමෙයි. මෙන්න මේ විදිහට ධර්මය දැක්කොත් ඔබ බාහිරයෙන් මිදෙනවා. හැබැයි, මේක එක අවස්ථාවක මූලික අවස්ථාවක් පමණයි. ධර්මය ගැඹුරින් ගැඹුරට යනවා **නමුත් පළවෙනි අවස්ථාවේදී මුලින් ඔබ දකින්න ඕනේ පේනවා නෙමෙයි හිතනවා කියන එක තමයි.** හැබැයි ඔබ පටලවා ගන්න එපා.

අපි සමහර වෙලාවට දේශනා කරන්නේ අන්තිම අවස්ථාව. එය ගැඹුරු ඥානයක් තියෙන කෙනෙකුටයි. එතකොට අපි එයාට කියන්නේ මේක ශබ්දයක් වර්ණයක් කියලා. හැබැයි ඔබට කියන්නේ එහෙම නෙමෙයි. ඇයි? ඒ ඔබට එහෙම ගැඹුරු ඥානයක් තවම නැති නිසා, ඒක නිසා අපි කියනවා මේක පේනවා නෙමෙයි හිතනවා කියලා. හැබැයි ඒක මූලික අවස්ථාවක් විතරයි. ඒකයි සෝතාපන්න කියලා වෙනම පැහැදිලි කරලා අනාගාමි භූමියට නැවතත් පැහැදිලි කරන්නේ. වැටහෙනවද දැන්. බත් පිඟානට බෙදුවාට එක පාර කන්න බැහැනේ අපි ටික ටික කන්න ඕනේ. අන්න ඒ වගේ, අපි ඉස්සෙල්ලාම බාහිර නෙමෙයි, හිතනවා කියලා දකින්න ඕනේ. නමුත් අපි ඊගාවට හිතෙත් එහෙම දෙයක් නැති බව දකින කොටයි මේක ශබ්දයක් බව වැටහෙන්නේ. එකපාරටම එතනට යන්න බැහැ. ඒක නිසා තමයි අපිත් ඇත්තටම කියන්නෙ. රූපය අනිත්‍ය දකිනවා කියන එක ලොකු කතාවක්, ඔබ හිතන තරම් බොළඳ නැහැ.

ඒක හරිම ගාම්භීර ධර්මයක්. ඇත්තටම අපේ සිත තුළයි ලෝකයක් තියෙන්නෙ. මේ ලෝකේ කෝටි 800ක ජනගහනය ඉන්නවා. කෝටි 800 ට තමන්ගේ සිත් තුළ ලෝකය හදාගෙන ජීවත් වෙනවා, සතා සිව්පාවා පවා ඉන්නේ එතැනයි. හැබැයි සතා සිවුපාවට කවදාවත් තේරෙන්නේ නැහැ එහෙම එකක් බාහිර නැහැ කියලා. අපි මේක හිතන ධර්මයක් කියලා. නමුත් මනුෂ්‍යයාට මේක තේරෙනවා. ඒ නිසයි, මේ **දුර්ලභ මනුස්සත්තං** කියල කියන්න හේතුව. අපි රැවටිලා ඉන්නේ මායාව තුළ අපි දුක් විඳින්නේ මායව තුළ, රැවටිලා මායාවක් ඇතුලේ, විඤ්ඤාණ මායාව ඇතුළේ මෙන්න මේ සත්‍යය අවබෝධ කළොත් ඔබට දුකක් නැහැ ඔබ සියලු දුකෙන්

මිදෙනවා. බාහිරෙනුත් මිදෙනවා, බාහිරයෙන් හොරකම් කරන්න දේවල් ඔබට හම්බ වෙන්නේ නැහැ. බාහිර ගහගන්න මරාගන්න කිසිවකු හම්බ වෙන්නේ නැහැ. ඔබට බාහිර කිසිම ගැටලුවක් නැති වෙනවා. හැබැයි, ඔබේ හිතේත් බාහිර දෙයක් කියලා නෑ අපි හිතනවා කියලනේ දැන් හිතන්නේ. හැබැයි එතකොට හිත තවම තියනවා නේද? එතකොට හිතෙත් එහෙම දෙයක් නැති බව දකින එකයි **අනාගාමි භූමිය.** අන්න එතකොට බාහිරෙනුත් මිදිලා, සිතෙනුත් මිදිලා. එතකොට, ඔබ **ක්‍රියා සිත දකිනවා.** එවිටයි ඔබ ඔබගේම ක්‍රියාවලියට හිත තියාගන්නේ අන්න එතකොටයි. එහෙනම් ඔබ ඉස්සෙල්ලාම එන්න ඕනේ, අර මූලික තැනට නේද? **මේ පේනවා නෙමෙයි හිතනවා කියලා කියන එක. මේ සේරම හිතක තියෙන්නේ කියන එක. අපේ හිතේ මේ මැවෙන්නේ කියන එක. අන්න එතනට ආවොත් ඔබට,** මේ **පරිඥෙඥය්‍යය සූත්‍රය** තුළ පෙන්වන මේ රූපය **පරිජානාති** කියන තැන ඔබට අවබෝධ වේවි. එහෙනම් ඔබ රූපයේ සත්‍ය දැක්කා, කියන තැන ධර්මය පොතෙන් හොයන්න එපා. ප්‍රායෝගික වෙන්න. ඇත්ත ලෝකෙට එන්න, **ඔය මායා ලෝකෙ අතරමං වෙන්න එපා.** බාහිර තියෙන දෙයක් නැහැ. මේ ඔබගේ ම සිතයි. මේ ලෝකෙ කෝටි 800 ක් ජනගහනය ඉන්නවා නම්, ඒකයි අපි කිව්වේ කෝටි 800 ම තමන්ගේ සිත තුළ මයි ජීවත් වෙන්නේ කියලා, ලඟ ඉන්න කෙනා කියයි අර තියෙන්නේ, අර පේන්නේ. එතකොට ඔබත් කියයි ආ මටත් පේනවා ඒක නේද? ඔය දෙන්නම ඉන්නේ දෙන්නාගේම හිත ඇතුලේ කියලා. දෙන්නම දන්නේ නැහැ. දෙන්නම එලියට ඇඟිල්ල දික්කරනවා මහ භූත ඇසුරු කරගෙන හිතින් හදාගත්ත ලෝකෙකට ඇඟිල්ල දික්කරනවා. කවදාවත් හම්බවෙනවාද? නැහැ, මොකක්ද වෙන්නේ? ඔබ දවසින් දවස, දවසින්

දවස ආගාදයට වැටෙන්වා. ඒ තමයි. නොදන්නා ලෝකෙක අතරමං වෙනවා. ඒ කියන්නේ හිත ඇතුලේ තියෙන ලෝකය ඇත්තක් වෙන්නේ නැහැ. ඒකයි ඔබගේ අවාසනාවන්ත ඛේදවාචකය දුකෙහි ඉරනම. ඔබ විසින් හදාගත්ත දුක් ගොන්නක ඔබ අතරමං වෙනවා. ඔබ හැමදාම හදන්නේ දුක් ගොඩක් කියලා ඔබ දන්නේ නැහැ. ඇයි? ඔබ හැමදාම කරන්නේ රැවටෙන්න, දෙයක් හොයාගන්න එක. ඔබ රැවටෙන දේවල් ගොඩක් එකතු කරගන්නවා හිත ඇතුලේ සංඥා ගොඩක්, චේතනා ගොඩක්. ඒවා කවදාවත් ඇත්ත වෙන්නේ නැහැ. කවදාහරි ඔබ විශාල ප්‍රපාතයක් හදාගෙන ඒ ප්‍රපාතයට පනිනවා. සිය දිවිනසා ගන්න අය වගේ. තමන් විසින්ම හදාගත් මායා ලෝකයක තමන්ම අතරමන් වෙලා, තමන්ම දුක්විඳිනවා. ඒ තමයි දුකේ 'ආදීනවය' දකිනවා කියන්නෙ. ඒ තමයි සිතේ ආදීනව දකිනවා කියන්නෙ. රූපයෙ ආදීනව දකිනවා කියන්නේ. බාහිර දෙයක් දකිනකොට ඒක තමන් හදාගත්තා බව, දකින එක තමයි ඇත්තටම ආදීනව දකිනවා කියන්නේ. ඊට පස්සේ ඒක දෙයක් බවට වුණොත් පොත කියලා. අන්න ඒක 'ආශ්වාදය' දකිනවා කියන්නේ. නිස්සරණය කියන්නේ, ඒක ඇත්ත දැක්කොත් බාහිරයෙත් දෙයක් නැති බව දකින තැන, අන්න පොතෙන් මිදෙන තැනයි, නිස්සරණය කියන්නේ. එතකොට ආශ්වාද, ආදීනව, නිස්සරණය කියන එක, ගැඹුරු පරියායකින් පෙන්නන්න පුළුවන්. එතකොට ආශ්වාදය කියන්නේ පොත තියෙනවා කියන එක. ආදීනවය කියන්නේ එහෙම දෙයක් නැති බව දකින එක. නිස්සරණය කියන්නේ ඒකෙන් වන මිදීම. මෙතන දැක්කොත් තමයි ඔබ දුකෙන් මිදෙන්නෙ.

දැන් සමහර අය හිතනවා ආ මේ ආශ්වාදය කියන්නේ මේ පොත තියෙනවනේ, ඒකෙන් එන ආශ්වාදය. පොත

තියෙනවා කියලා හිතාගෙන, ඒකෙන් එන ආශ්වාදය කියලා හිතා ගන්නවා. ආ, මේ ආශ්වාදය කියන්නේ අර අරයා ඉන්නවානේ, එයා නිසානේ මට සැප එන්නේ. අර මල තියනවනේ, ඒකෙන්නේ මට සැප එන්නේ. ඒකටනේ ආශ්වාදය කියන්නේ. ඊට පස්සේ හිතනවා, ආදිනවය කියන්නේ හොඳට විඳින එක කියලා. ඊට පස්සේ හිතනවා නිස්සරණ කියන්නේ ආදීනව දැකලා, මල් කොහොමත් පර වෙනවානේ. අන්න ඊට පස්සේ නිස්සරණය කියන්නේ ඒකටයි කියලා හිතනව. කවදාවත් නිවන් දකින්නේ නැහැ. ඇයි, ඒක අමූලික පට්ටපල්පල් බොරු. ඒ කියන්නේ තනිකර අඥානයෙක්. ඇයි ඒ බාහිර රූපය ඇත්ත කරගෙන නිවන් දකින්න බැහැ කිව්වේ ඒකයි. **බුදුන්වහන්සේ ආශ්වාද ආදීනව නිස්සරණ දකිනවා කියන්නෙ ඕකට නෙමෙයි. පොතක් නැති බව දකින එකට. එයයි ආදීනව දකිනවා කියන්නේ. එතනින් මිදෙන එකයි නිස්සරණය දකිනවා කියන්නෙ. එහෙම නම් පොත තියනව කියන එක ආශ්වාදය, පොත හැදෙන එක ආදීනවය, එහෙම එකක් නැති බව දකින එකයි නිස්සරණය මිදෙන එක.** ඒක අපි ගන්න ඕනේ වෙනින් සූත්‍රයකින්. නමුත් අපි දැන් **පරිඥෙඤ්‍ඤෙයය** කියන සූත්‍රයේදිත් ඒක, අපි පෙන්නුවේ ඒකම තමයි **රූපය පර්ජානාති** කියන තැන නිවන් මගට හේතු වෙන්නේ ඒකම තමයි. **සංඥා සංඛාර විඤ්ඤාණ**, විඤ්ඤාණය කියන්නේ පොත හැදෙන එකමයි. එකෙත් එතකොට ඒ විදියටමයි පෙන්වන්නේ, **රූපං භික්ඛවේ පරිඤ්ඤෙය්‍යො ධම්මො, වේදනා පරිඤ්ඤෙය්‍යො ධම්මො, සංඥා, සංඛාර, විඤ්ඤාණ. පරිඤ්ඤෙය්‍යො ධම්මො ඉමේ වුච්චන්ති භික්ඛවේ පරිඤ්ඤෙය්‍යා ධම්මා.** ඔන්න එතන අන්න ඒකයි, යථාභූත ඥානයෙන් දකිනවා කියන්නෙ. ඒකයි මේ පරිඤ්ඤෙයෙන් දකිනවා කියන්නේ රූපය පරිඤ්ඤෙය්‍ය

කියන්නේ. එතකොට මහණෙනි මේ පිරිසිද දකිනවා කියන එකනේ පරිඤ්ඤෙය්‍යා කියන්නේ. එතකොට **කතමාච භික්ඛවේ පරිඤ්ඤා** මහණෙනි, පිරිසිද දැකීම කවරේද යත්? දැන් ඔන්න කියනවා **යෝ භික්ඛවේ රාගක්ඛයො දොසක්ඛයො මෝහක්ඛයො - අයං වුච්චති, භික්ඛවේ පරිඤ්ඤය.** මහණෙනි, යම් රාග, ද්වේශ, රාගක්ෂය කිරීමක් වේද, ද්වේෂක්ෂය කිරිමක් වේද, මෝහ ක්ෂය කිරිමක් වේද, මහණෙනි, මෙය පිරිසිද දැකිම යයි කියනු ලැබේ. දැන් මේ රාග, ද්වේශ, මෝහ ක්ෂය වන එකයි එතකොට **පරිඤ්ඤෙය්‍යා** කියලා කියන්නේ. එතකොට රාග, ද්වේශ, මෝහ ක්ෂය වන එකයි නිවන්මග කියලා අපි හැම මොහොතෙම ඔබට පෙන්වනවා. එතකොට රාග ද්වේශ මෝහ ක්ෂය වන්නේ රූපයේ ඇත්ත දැක්කොත් විතරයි. ඒකයි අර කිව්වේ " **රූපං භික්ඛවේ පරිඤ්ඤෙය්‍යා ධම්මා**" කියලා. එතකොට පරිඤ්ඤෙය්‍ය දැකිය යුතු '**ධර්මය**' තමයි 'රූපය' කියන්නේ. රූපය දැක්කොත් තමයි **රාග, ද්වේෂ, මෝහ** ක්ෂය වන්නේ. දැන් ඔබට වැටහෙනවා. එහෙමනම්, නිවන් මග පැහැදිලි වෙනවා මේ පරිඤ්ඤෙය්‍යය කියන සූත්‍රය තුළ. ඔව් මහණෙනි පිරිසිද දැන සිටි පුගුල් කවරේද යත් **කතමෝච භික්ඛවේ පරිඤ්ඤෙය්‍යාච පුග්ගලෝ.** එතකොට "**කතමෝච භික්ඛවේ පරිඤ්ඤාතාවි පුග්ගලො**" අර අන්න කවුද? මේ පරිඤ්ඤෙය්‍යා දකින පුද්ගලයෝ කියලා ඒ රහත් තෙමේ යැයි කිවයුතු වේ. **අරහත්තා අරහාතිස්ස වචනියං යා යං ආයස්මා ඒවං නාමො ඒවං ස්වායං ගෝතතො - අයං වුච්චති, භික්ඛවේ පරිඤ්ඤාතවි පුග්ගලොති**" රහත් තෙමේ යැයි කිව යුතුයි. මෙබඳු නම් ඇති මෙබඳු ගොත් ඇති යම් ආයුෂ්මත්තෙක් වේද මහනෙනි, මෙය පිලිසිඳ දත් පුද්ගලයෙක් යැයි කියනු ලැබේ. **අරහාතිස්ස වචනීයං. ස්වායං ආයස්මා ඒවං නාමො**

**ඒවං ගොත්තො** එවං නම් ඇති, ඒවං ගොත්තො ඇති අන්න එවන් අය **වුච්චති භික්ඛවේ** එ රහ නැති අරහත්වය කියන්නේ රාග, ද්වේශ, මෝහ ක්ෂය උනාම අපි කියනවා රහ නැති වුණා කියලා. අන්න එවැනි අය "**පරිඤ්ඤෙය්‍යාතාවි පුග්ගලෝති පරිඤ්ඤාවි පුග්ගලෝ**" ඒ පරිඤ්ඤාත පුග්ගලෝ කියන්නේ අන්න එවැනි අයටයි එතකොට මේ රාග, ද්වේශ, මෝහ ක්ෂය වන ගමන්මගයි රූපය. පිරිසිඳ දැකීම තුල සිදු වන්නේ අන්න එවැනි අයටයි ඒ අරහතන් වහන්සේලා යයි කියන්නේ. එහෙම නැත්නම්, ඒ ආර්යන් වහන්සේලා කියලා කියන්නේ එවැනි අයටයි. ආර්ය භූමිය හඳුනාගන්න පුළුවන්. එතකොට, එවැනි අයටයි, මේ රාග, ද්වේශ, මෝහ ක්ෂය වන අයටයි ආර්යන් වහන්සේලා කියලා කියන්නේ අරහත් වහන්සේලා කියලා කියන්නේ ඒ අයටමයි.

එහෙමනං මේ ඉතාම වටිනා පැහැදිලි කිරීමක් තියෙනවා හොඳින් ඒක දකින්න

තෙරුවන් සරණයි.!!!!

# 07. පලෝ්ක ධම්ම සූත්‍රය

**පලෝ්ක ධම්ම සූත්‍රය සංයුක්ත නිකායේ 4 වෙනි කාණ්ඩයේ එකසිය විසි එක් වෙනි පිටුව පලෝ්ක ධම්මසූත්‍රය**

ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ එක්ත පස්ව ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැළ කළහ. **අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසංකමි එකමන්තං නිසින්නෝ ඛෝ ආයස්මා ආනන්දෝ භගවන්තං ඒතද වෝච,** වහන්ස ලෝකය ලෝකය යැයි කියනු ලැබේ වහන්ස කොතකින් නම් ලෝකය යැයි කියනු ලැබේ ද?

**"ලොකො ලොකො'ති භන්තෙ, වුච්චති කිත්තාවතානු භන්තෙ ලොබෙති වුච්චතී'ති"** කොතකින් ලෝකය යයි කියනු ලැබේද? ආනන්දයෙනි, යමක් බිඳෙන සුළුව ඇත්තේද, ආර්ය විනයෙහි මේ ලෝකය යැයි කියනු ලැබේ. **යම් කෝ ආනන්ද පලෝ්ක ධම්මං අයන් වුච්චති අරියස්සවිනයේ ලොකෝ,** බිඳෙන සුළු බැවින් ලෝකයයි කියනු ලැබේ. මෙන්න මේක තමයි බුදුන් වහන්සේ ලෝකය පෙන්වන ආකාරය **පලුජ්ජති** නම් ලෝකය යයි කියනු ලැබේ. **පලෝ්ක ධම්මං බිඳෙන සුලු නම් ලෝකයයි කියනු** ලැබේ. මේ විදිහට බුදුන් වහන්සේ ලෝකය කියනු ලබන්නේ මේ ස්පාක් වන නිසා මේ. සෙන්සස් පහේ ස්පාක් වන නිසා ලෝකයේ හටගන්න

බවයි. මේක මේ නව යොවුන් තරුණයෙකුට මේ යුගයේ ගොඩක් මෙය කතා කරන භාෂාවෙන් තමයි අපි මේ ධර්මය සන්නිවේදනය කරන්න ඕනේ, එතකොට මේ **පලෝක ධම්මං** කිව්වට දැන් ඉන්න තරුණයකුට මේක තේරෙන්නේ නෑ. නව යොවුන් තරුණයෙකුට දැන් ඉන්න දරුවෙකුට මේ ධර්මය අපි කොහොමද කියලා දෙන්න ඕනේ. ඒ දරුවාට තේරෙන භාෂාවෙන් එහෙනම් ඒ දරුවාට තේරෙන්වා. මේ සෙන්සස් කියන වචනය මේ සෙන්සස් වල ස්පාක් වෙනවා කියනකොට ඒ දරුවා දන්නවා මෙන්න මේක තමයි මෙතන සිද්ධ වෙන්නේ ඇත්තටම. **රුප්පන්තිකෝ ආයුසෝ රූපං වදේති** රුප්පනය වන නිසා ලෝකය කියනවා. පළුදු වෙන නිසා ලෝකෙ කියනවා. **පලුජ්ජති ලෝකං වදේති පලෝකධම්මං ලෝකං වදේති** බුදුන් වහන්සේ මේ ලෝකය කියලා කියන්නේ, මේ ඇස බිඳෙන සුළුයි මහණෙනි, එතනින් මේ ලෝකය කියන්නේ ඒ කියන්නේ ඇස ප්‍රසාද වෙනවා ආලෝකයට හිරු එළියට කණ්නාඩියක් ඇල්ලුවාම දිලිසෙනවා අන්න ඒ දිලිසෙන එක ඉද්දෙන එකයි ලෝකය කියන්නේ ඇස, කන, දිව, නාසය, කය කියන මෙන්න මේ ආයතන පහ (සෙන්සස් 5) ප්‍රසාදවත් වීම නිසා මේ සෙන්සස් වල ස්පාක් වීම නිසා ඒ ඇස වර්ණයට ප්‍රසාද වෙනවා, කන ශබ්දයට ප්‍රසාද වෙනවා, එතකොට නාසය ගන්ධයට ප්‍රසාද වෙනවා, දිව රසට ප්‍රසාද වෙනවා, කය උණුසුම සීතල තද ගතිය ප්‍රසාද වෙනවා, එතකොට ඔබට කයට මේ උණුසුම් දැනෙන්නේ සීතල දැනෙන්නේ තද ගතිය දැනෙන්නේ ත්‍රිමාන වෙන්නේ මෙන්න මේ ප්‍රසාද නිසා (සෙන්සස්) එතකොට මේ වර්ණ කොහේවත් එළියෙ තියෙනවා නෙමෙයි, වර්ණ ඔබගේම ඇසේ යෂ්ටි සෛල කේතු සෛල වල නිර්මාණයක්.

ඒ තරංග යාම වැඩි එක අඩු එක මේ සෛලවල මේ ඇස විසින්මයි හඳාගන්නෙ ඒ වගේමයි ඒ ආලෝක හැඩතල, අර හිරු එළිය වැටෙන කොට එන කිරණ වගේ. ඒ නමුත් මේ වර්ණ හැඩතල සාදා ගන්නේ ඔබගේම මේ ඇස කියන ආයතන කෘත්‍ය තුළින්. ඒ වගේම තමයි කන කියන්නේ අර කර්ණ සංඛි පටලය හෙලවෙන එකට තමයි අප කන් බෙරය හෙලවෙනවා කියන්නේ. සාමාන්‍යයෙන්, ඒකට තමයි අපි කියන්නේ **ශබ්දය** කියලා. එතකොට ශබ්දය කොහෙවත් එළියේ තියෙන එකක් නෙමෙයි. ඒ වේගයක් තමයි අපි හැමතිස්සෙම නිරූපණය වෙන්නේ ඒ කියන්නේ ඇසට ඇවිල්ල වදින්නේ කිරණයක්, අපි දකින්නේ වර්ණ හැඩතලයක්. අන්න ඒ වගේ, කනට ඇවිල්ලා වදින්නේ කිරණයක්. අපිට ඇහෙන්නේ ශබ්දයක්, මේ ශබ්ද අපේ විඤ්ඤාණ මායාව තුළ හඳාගත්ත එකක්, එතකොට අපි මේ වර්ණ, මේ විඤ්ඤාණ මායාවෙන් දැන ගැනීම සිද්ධ වෙනවා. දැනගැනීම තමයි විඤ්ඤාණ මායාව කියන්නේ එතකොට වර්ණ අපි හඳාගත්ත එකක් අපි කිච්චේ කිච්චට පුද්ගල භාවයෙන් ගන්න එපා මේ ඇස කියන ආයතනය කෘත්‍යයේ නිර්මාණයක් තමයි වර්ණය ඒ වගේම කන කියන ආයතන කෘත්‍යක් නිර්මාණයක් තමයි ශබ්ද. ඒකයි මේවාට ආයතන කෘත්‍යක් කියන්නේ. ඇස ආයතනයක්, කන ආයතනයක්, සලායතන ඇස, කන, දිව, නාසය, කය මේවා ශබ්ද වර්ණ ඇසට අපි වර්ණ හදා ගන්නවා. කනට ශබ්ද හදාගන්නවා, එතකොට ආයතන විදියට එතකොට ශබ්ද වර්න එකට ඒ මොහොතේම, එන එක තමයි එකතු වෙනවා කියන්නේ. නැතුව අමුතුවෙන් එකතු කරන දෙයක් නෙමෙයි, ඒක එම මොහොතේම එන එකක් . ඒක එකතුවෙනවා ඒක සොබාදහමේ සිද්ධියක් එතකොට ඒ එකතු වෙන එකක් හැබැයි අපි සංඛාර කියන්නේ එකතු වුණොත්, එතකොට තමයි දෙයක්

නිරූපණය කරන්නේ ඒකයි **සබ්බේ සංඛාරා** කියන්නේ දැන් ඇහැට, අර පුංචි දරුවා **මොන්ටිසෝරි** යනකොට මේ පුතේ රතුපාට ඇහැට දෙනවා ,වර්ණයක් කණට දෙනවා, ශබ්දයක් රතු පාට, රෙඩ්, යෙලෝ. ඔන්න ඔය විදියට තමයි ඔබගේ සිතුවිලි, සිත එහෙමත් නැත්නම් ඔබ ඔය කතා කරන භාෂාව, වචන සේරම හැදිලා තියෙන්නේ, මේක සොබාදහම මෙතන ආත්ම කතාව ඇත්තටම නැහැ. මේ විදියට තමයි ඔබට විශාල ප්‍රමාණයක් මේ විදියට ඔය දාපු සංඥා තමයි ඔබ මේ සිතුවිලි විදියට, පරිහරණය කරන්නේ, ඔබ බලයි ආ මව්කුසෙන් ආවනේ කෙනෙක් එහෙම නෙවෙයි. එහෙම දකින්න එපා. **ජාති ධම්ම සූත්‍රයෙන්** ඒකයි බුදුන් වහන්සේ කිව්වේ ඇසේ උපතයි මහනෙනි උපත, ආයතනයේ උපතයි උපත, ඒ **ස්කන්ධයේ වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ** **වේදනා** කිව්වේ ආලෝක හැඩතලය විඳීම ඒ වේදනාවමයි. සංඥාව දැනගැනීම වේදනා සංඥ වෙන් කරන්න බෑ කිව්වේ ඒකයි. එතකොට වේදනා සංඥා එකතු වෙලා හැදෙන ඒකයි සංඛාරා හෙවත් එකතු වීමයි. එයමයි එහෙනම් දැනගැනීම **වේදනා සංඥා, සංඛාර, විඤ්ඤාණ** කිව්වේ එකයි, **රූප, වේදනා සංඥා, සංඛාර, විඤ්ඤාණ** කියන්නේ **රූප කියන්නේ මේ රූපාරම්මණයටයි** ඒකයි අපි කිව්වේ රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන්නේ **ස්කන්ධ.** ඒ කියන්නේ ඇහැට එන්නේ යම් වර්ණ හැඩ කිරණයක් ද? ඒ කිරණය එතකොට රූපාරම්මනයක්. එහෙනම් ඒ ආරම්මණයයි රූපරම්මනය. රූප කිව්වේ එහෙනම් එයයි ඒ. ඒ **වේදනා සංඥා විඳීමයි** කිරණය සංඥාවයි වර්ණය හඳාගන්න එක තමයි සංඛාර කියන්නේ. අර ශබ්දය දැම්මොත් තමයි කහපාට රතු පාට කියලා දන්නෙ. අන්න අපි දැන ගත්ත කියන්නේ විඤ්ඤාණ මායාව, මේක මනෝ විඤ්ඤාණය කියන්නේ ශබ්ද, වර්ණ

ගන්ධ, රස, පහස උණුසුම ආයතනවල එකතුවයි **මනෝ විඤ්ඤාණය - ධම්ම මනංච පටිච්ච ධම්මේසු උප්පජ්ජේ මනෝ විඤ්ඤානං** මනසට බාහිර දේවල් අරමුණු වෙන්නේ නැහ. මනසට අරමුනු වෙන්නේ මේ සංඥා ටිකයි ශබ්ද, වර්ණ, සංඥා විදියටයි. දැන් මේ කතාව පැහැදිලියි.

අන්න ඒ විදියටයි අපි පොත දැක්කේ, පොත දැක්කා කියන්නේ ජාතිය හටගත්තා, **සකංධානං පාතුභාවො** අන්න ස්කන්ධය වේදනා, සංඥා, සංඛාර අපි අර කිව්වේ එන්නෙ කිරණයක් වේදනාවක් විඳීමක් සංඥාවක්. එයමයි එතකොට සංඛාර එකතු වෙනවා කියන්නේ. එකටමයි එයමයි දැනගැනීම විඤ්ඤාණය කිව්වේ. වේදනා, සංඥා, සංඛාර ස්කන්ධය කියන්නේ අමුතු දෙයක් නෙමෙයි මේ පැහැදිලි කිරීමයි. එතකොට ඒ ඇසේ උපතයි කියලා කිව්වේත් අන්න **ස්කන්ධානං පාතුභාවො** ආයතන අන්න ආයතනයේ කෘත්‍ය වර්ණ හදාගත්තා අන්න ඒකට ශබ්ද, වර්ණ එකතු වුණා අනිත් ආයතනවල ඒවා අන්න **මනෝ විඤ්ඤාණය** කිව්වා **ඛන්ධනං පාතුභාවො ආයතනං පටිලාභෝ අයං වුච්චති ජාති,** ජාති කිව්වේ ඔන්න ඕකයි. අන්න **පලෝක ධම්මං** කණ බිඳෙන සුළුයි දැන් මේ කණට එන වේගය ඇවිල්ලා වදිනකොට සුළඟක් හරි මොනවා හරි වේගයක් ඇවිල්ලා වදිනකොට කන් බෙරය හෙල්ලෙන්නේ, අන්න එකයි පලෝකධම්මං බිදෙනවා අන්න ඒකයි බිඳෙනවා කියලා කිව්වේ අන්න එතන ස්පාක් වෙනවා කියන ඒකයි සෙන්සස් පහේ ස්පාක් වෙන එකයි ලෝකය හැදෙන්න හේතුව. දැන් තියෙන භාෂාවෙන් තරුණයෙකුට කියනව නම් බොහොම සරලව මෙය වැටහෙනවා ඒකමයි මේ කියන්නේ **පලෝක ධම්මං** කියලා බිඳෙන සුළු හෙයින් ලෝකයයි කියනු ලැබේ. ආනන්දයෙනි

යමෙක් බිඳෙන සැහැවි ඇත්ද ආර්ය විනයෙහි මෙක ලෝක යැයි කියනු ලැබේ යම් **බො ආනන්ද පලෝකධම්මං අයං වුච්චති අරියස්ස විනයෙ ලොකො'ති**" අන්න ලෝකය හැඳුන හැටි කිව්වා. ආර්යය විනයෙහි ලා මේ ලෝකය කියලා කියන්නේ ඇස බිඳෙන සුළුයි, කන බිඳෙන සුළුයි, නාසය බිඳෙන සුළුයි මෙන්න මේ ස්පාක් වෙනවා කියන එක මේ සෙන්සස්වල සපාක් වීම කියන එක මෙයමයි උපමාව ආනන්දයනි, කිමෙක් බිඳෙන සුළු වේද? යත් **කිංච ආනන්ද පලෝක ධම්මං අන්න දැන් ආනන්දයෙනි, චක්ඛුසය බිදෙන සුලුය, රූපයෝ බිදෙනා සුළුය, චක්ඛු විඤ්ඤාණය බිඳෙනා සුළුය, චක්ඛු විඤ්ඤාණය නිසා යම් ස්පර්ශයක් හට ගත්තද එයද බිඳෙනා සුළුය, චක්ඛු සම්ඵස්ස ප්‍රත්‍යයෙන් උපදනා වූ එ සුව වු වේවා දුක් වු වේවා නොදුක් හෝ වේවා යම් වේදයිති, විඳීමක් දෙයක් උපදීද එයද බිඳෙනා සුළුය.** අන්න **වට්ටං වට්ටති** ඊගාව වටය කැරකෙනකොට දෙයක් කියලා ගන්නකොටම, ඒකට වේදනාවක් වටිනාකමක් ඇලීමක් වුනොත් අන්න එතන, උපාදානයක්, තණ්හා, ජාති, ජරා, මරණ සේරම තියෙන්නේ මෙන්න මේ බිඳෙන සුලු හෙයින් ඒ රූපයෝ බිඳෙන සුලුය එතන ඔබට කිමෙක් බිඳෙන සුළු වේද ආනන්දයනි චක්ඛුසය බිඳෙන සුලුය, ඇස බිඳෙන සුළුයි, රූපයෝ බිඳෙන සුළුය, මේ විඤ්ඤාණයෝ බිඳෙන සුළුය, චක්ඛු විඤ්ඤාණය බිඳෙන සුළුය, චක්ඛු සම්ඵස්සය (චක්ඛු ස්පර්ශය) බිදෙන සුලුය, චක්ඛු සම්ඵස්සයෙන් හටගත්ත ඒ වේදනා සියල්ලම තණ්හා උපාදාන හැදෙන්ට හේතුව ඒ සුව වේදනා, දුක් වේදනා ලෝකයේ ඒ සියල්ලම හටගෙන තියෙන්නෙ බිඳෙන සුළු බැවිනුයි. ආනන්දය අන්න ඒයයි පැහැදිලි කිරීම එතකොට **චක්ඛුං බෝ ආනන්ද පලෝකධම්මං රූපා පලොකධම්මා චක්ඛුවිඤ්ඤාණං පලෝකධම්මං, චක්ඛු**

**සම්පස්සො පලොකධම්මො, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදහිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි පලොකධම්මං** කියලා බුදුන් වහන්සේ මෙන්න ලෝකය හදා ගත්තෙ බිඳෙන සුළු බැවිනුයි කියලා අන්න සෙන්සස් පහේ ස්පාක් වීමයි, මේ සියලුම ආත්මීය දැනිම ඇති වෙන්නට හේතුව, දැන් ඔබට මෙය පැහැදිලි වෙනවා මේ ආත්මයක් කියලා එකක් අපට එන්නේ මේ පලයත් හේතුව තමයි **පලොකධම්මං** එ කියන්නේ ඇස කන දිව නාසයෙන් එන සෙන්සස් වලින් දැන් ස්පාක් විම ශබ්ද වර්නයි ඒ හේතුව ඵලයතමයි අපි හදාගත්තා ආත්මය, ආත්මයක් කියල එකක් නැහැ කිව්වේ ඒකයි මේක අනාත්ම ධර්මයක් වෙන්නේත් අන්න ඒ නිසාමයි මෙන්න මේ විදිහට අනිත් ආයතන ටිකත් පැහැදිලි කරනවා ජිව්හා බිදෙන සුලුය, රසයෝ බිඳෙන සුළුයි, ජිව්හා විඥානය බිඳෙන සුළුය, ජිව්හා විඥානය නිසා හටගත් ස්පර්ශයෝ බිඳෙන සුළුය, ජිව්හා ස්පර්ශය නිසා හටගත් යම් වේදනාවක් සුව වේවා දුකක් වේවා උපදී නම් ඒයද බිදෙන සුලුය මනස බිඳෙන සුළුය ධර්මයෝ බිඳෙන සුලුය මනෝ විඤ්ඤාණය බිඳෙන සුළුය මනෝ සම්ඵස්සය බිඳෙන සුළුය ඒ ස්පර්ශයක් හටගනීද ප්‍රත්‍යයෙන් උපදනාවූ යම් වේදයිති එය ද බිඳෙන සුළුය ආනන්දෙයිනි යමෙක් බිඳෙන සුලුය වේද අර්යය විනයෙහිලා මෙහිලා මේ ලෝකෙ යයි කියනු ලැබේ. අන්න දැන් බුදුන් වහන්සේ ලෝකය පන වන හැටි පෙන්නුවා. **ජිව්හා පලොකධම්මා, රසා පලොකධම්මා, ජිව්හාවිඤ්ඤාණං පලොක ධම්මං ජිව්හා සමඵස්සො පලොකධම්මො, යම්පිදං ජිව්හාසම්ඵස්සපච්චයා උප්පජ්ජති වේදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛම සුඛං තම්පි පලොකධම්මං** කියලා බුදුන් වහන්සේ ඒ විදියටම ප්‍රකාශ කරනවා. අර සියල්ල එකතු වෙලා මනෝ විඤ්ඤාණයෙන්

දෙයක් කියලා පෙන්නන එකත් එතනම පෙන්වනවා **මනො පලොකධම්මො ධම්මා පලෝකධමම්ා, මනෝවිඤ්ඤාණං පලොකධම්මං, මනෝසම්පඵස්සො පලොකධම්මා යම්පිදං මනෝ සම්ඵස්ස පච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි පලොකධම්මං. යේ බෝ ආනන්ද, පලොකධම්මං, අයං වුච්චති අරියස්ස විනයේ ලොකොති,** ආර්ය විනයෙහිලා මේ ලෝකෙ යැයි කියනු ලැබේ. ඉතින් බුදුන් වහන්සේ මනා කොට පෙන්නලා දෙනවා ඉතින් පරම සත්‍යය කිසි කෙනෙකුට වෙනස් කළ නොහැකිය, මේ ඇස කන දිව නාසය කය මෙන්න මේ ආයතන වලින් එන්නේ වර්න ශබ්ද ගන්ධ මේවා එකතු වෙලා අපි ආත්මයත් හදාගෙන තියෙන්නෙ අපිට ආත්මීය දැනිම ඇතිවෙන්න වෙන දේවල් නැහැ, මේක ආත්මීය දැනීමඇති වුණේ ඇස කන දිව නාසයෙන් ආයතනවලින් එයමයි **සළායතන නිරෝදෝ නිබ්බානෝ** කියන්නේ මේක අනාත්ම ධර්මයක් වෙන්නේ අන්න ඒ නිසයි, ඒ කියන්නේ අපි ආත්මය කියන්නේ දෘෂ්ටියක් ආත්ම දෘෂ්ටියක් සක්කාය දෘෂ්ටියක් හැබැයි එකේ සත්‍ය දැක්කොත් අන්න ශබ්ද වර්ණ වලට වෙන් වෙනවා ඇස කන නාසය දිවය කය හදාගත්ත එක අන්න අනාත්ම ධර්මය මෙතන ආත්මයක් නැති බව අවබෝධ වෙනවා. එයයි නිවන් මග අන්න පලෝක ධම්ම සූත්‍රය තුළ ඔබට නිවන් මග හොඳින් දකින්න ලැබෙනවා. එහෙමනම් ඔබ බොහොම පැහැදිලිව බුද්ධ දේශනයටම ඔබට පැහැදිලි වෙනවා අනුගතවම මෙය ආත්මයක් නැති ධර්මයක් අනාත්ම ධර්මයක් කොහොමද මේ ඇස කන දිව නාසයෙන් හදා ගත්ත එකක් මේ මච්කුසෙන් ආපු ආත්ම කතාවක් නැති බව මේ තුලින් ඔබට හොඳින් වැටහෙනවා. එහෙමනම් ඔබට මේ ඔබගේම ලෝකෙට බැසගත්ත ඒ අවිද්‍යා මෝහ

ගන අන්ධකාරය මිදෙන්න ඔබගේ ඒ අවිද්‍යා අසේස විරාග නිරෝධෝ කියන නිවන් මග ඔබට හමුවන්නේ ඒ සත්‍ය දකිනා විටයි. මෙතන ආත්මයක නැති බව සත්වයෙක් පුද්ගලයෙක්, කෙනෙක් නැති බව, මේ සොබාදහමේ නිර්නායකයක් ඔබ අවබෝධ කළ විටයි. අන්න එවිට ඔබ සියල්ලෙන් මිදුනා වෙනවා. අන්න අනිමිත්තයි ශූන්‍යතයි අප්‍රහනිතයි චේතෝ විමුක්තිය ඔබට හමුවන්නේ අන්න චිත්ත විමුක්තිය හමුවන්නේ ආත්ම සංඥාවෙන් මිදුණු ඒ සියලු ලෝකයෙන් මිදීමයි අන්න ලෝකවිදූ කියලා කියන්නේ. ඉතින් ඒ ස්වභාවය තුළ ඒ බුද්ධ සොබාවය පවතින්නේ ඉතින් එ සිතුවිලි වලින් වැහිලා තියෙන්නෙ කිව්වේ ඒකයි ඒ බුද්ධ ස්වභාවය ධර්මය දකින්නා බුදුන් දකී කිව්වේ. ධර්මය කියන්නේ දෙයක් නැති බවයි සියල්ලෙන් ඔබ  මිදෙන තැන අන්න බුදධ ස්වභාවයයි ඒ ලෝක සොබාදහමයි ඉතින් එන එන අරමුණ දැකීමයි.

මේ මිදෙන එක සංඝං සරණං ගච්ඡාමි එහෙනම් ධම්මං සරණං ගච්ඡාමි දෙයක් නැති බව දකින එකයි. බුද්ධං සරණං ගච්ඡාමි කියන්නේ එතකොට ඔබ මේ සිතුවිලි නිසයි දුක තියෙන්නේ සිතුවිලිවල මේ සත්‍යය දකින විට ලෝකයෙන් මිදීමයි අන්න දුකෙන් මිදීම. බුද්ධං සරණං ගච්ඡාමි නත්ථි මේ සරණං අඤ්ඤං කියන්නේ වෙන සරණක් නෑ කියන එකයි, එහෙනම් මේ සිතේ සත්‍ය දකින එකයි සංඝං සරනං ඒ ධර්මය දකින එකයි. ඒ ධර්මතාවය ධම්මං සරණං, එහෙනම් දෙයක් නැති බව දකින  තැන අන්න ශූන්‍ය ස්වභාවයයි. අන්න ඒයයි දුකෙන්  මිදිම සිතුවිලි ඔබට දුක ඇති කරලා තියෙන්නේ මේ සිතිවිලි වල හරයක් නැති බව දකින තැන ඔබගේ සිතේ සිතුවිලි වලින් හටගත්ත දුකෙන් ඔබ මිදෙනවා. අන්න නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධෝ මේ සරණං වරං

කිව්වේ තෙරුවන් සරණ යන ඒ සැබෑම සියලු දුකෙන් මිදෙන ඒ ලෝක සත්වයාට දුකෙන් මිදෙන මගක් පෙන්නපු ඒ නිවන් මග මනාකොට ඔබ දැන් අසනවා. ඒකාන්තයෙන්ම ඔබට මේ ආත්ම භවයෙ සියලු දුකෙන් මිදෙන්න සියලු කටයුතු හේතු වාසනා හිමි ඒ භාග්‍යවන්තයින් මේ ධර්මය ඇසෙන අයමයි.

එහෙනම් ඔබට තෙරුවන් සරණයි සියලු දුකෙන් මිදෙන්න මේ සියලු ධර්ම පණිවිඩයත් උපනිශ්‍රය වේවා!!!

තෙරුවන් සරණයි !

# 08. බාල පණ්ඩිත සූත්‍රය

බාල පණ්ඩිත සූත්‍රය, සංයුක්ත නිකායේ දෙවෙනි කොටසේ
බුද්ධ ජයන්ති ත්‍රිපිටක දාහතරේ 38 වෙනි පිටුව

**"අවිජ්ජා නීවරණස්ස, භික්ඛවෙ, බාලස්ස තණ්හාය සම්පයුත්තස්ස ඒවමයං කායො සමුදාගතො. ඉති අයඤ්චෙව කායො බහිද්ධාච නාමරූපං ඉත්ථෙතං ද්වයං, ද්වයං පටිච්ච ඵස්සො සළායතනානි. යෙහි ඵුට්ඨො බාලො සුඛදුක්ඛං පටිසංවෙදයති ඒ තේ යං වා අඤ්ඤතරෙන"** මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසුනු තණ්හාවෙන් බැඳුණු බාලයාට, මේ කයක් ලැබිලා තියෙනවා. මේ කය එක පැත්තකත්, නාම රූප අනිත් පැත්තේත්, කය කියලා කියන්නේ සවිඤ්ඤාණකයි. නාමයත්, රූපයත්, එහෙම නැත්නම් කයත් සිතත් ඒ දෙක නිසා එතන ඉඳලයි පස්ස, එනම් සලායතනය වන්නේ නාමරූප පච්චයා සළායතනං කියන කාරණය මේ බාලපණ්ඩිත සූත්‍රය තුළ ඉස්මතු කරනවා.

නමුත් මෙහි විශේෂයක් තියෙනවා මේ ඉදිරිපත් කිරීම දිහා බැලුවාම මේ සූත්‍රය දිහා මනාකොට බැලුවොත් මහණෙනි, අවිද්‍යා 'නීවරණයෙන්' වැසුනු තණ්හාවෙන් බැඳුණු එතකොට, අවිද්‍යාවෙන් වැසුනු තණ්හාවෙන් බැඳුණු කිව්වම, **අවිජ්ජා නිවරණස්ස භික්ඛවේ බාලස්ස තණ්හාය සම්පයුත්තස්ස.** දැන් අවිද්‍යාව තියෙන්නේ කොතනද? අවිද්‍යා

භූමිය කුමක්ද? ඔබ හඳුනා ගන්න ඕනේ. බාහිර ඇත්ත කරගත්ත තැන තියෙන්නේ අවිද්‍යා භූමිය. විඤ්ඤාණයෙන් දැනගැනීම මායාවට රැවටුන තැනයි, භාහිර ඇත්ත වෙන්නේ **මා රූප මඤ්ඤා විඤ්ඤාණං** කියනකොට අපිට ඒක මනාකොට පැහැදිලි වෙනවා. විඤ්ඤාණය මායාවක් බව. එහෙම නම් සිත අපට කියන්නේ මායාවක්. දැන් බාහිර තියෙනවද? ඒ තියන දේවල්. ඔබ පොඩ්ඩක් හිතල බලන්න. ඔබට පේන්නේ ඉර, හඳ, ඇළ, දොළ, ගහ, පොළොව, හැමදේම අම්මා, තාත්තා ගෙවල් දොරවල් හැම දෙයක්ම බලන්න ඔබදැන් ඉන්නේ කොතනද? ඔතන ඉදිරිපිට තියෙන දේ දිහා බලන්න ඔබට නමත් තියෙනවා. ඔය හැමදේටම සම්මුතියේ නමක් දාලා තියෙනවා. මේ නාමය ආවේ කොහෙන්ද? නුග ගහ කිව්වේ නැහැ මම නුග ගහක් කියලා අඹගහ කිව්වේ නෑ, මම අඹ ගහක් කියලා. අපේ හිතේ තියෙන්නේ නුග ගස් අඹ ගස්. එහෙම නම් අපි අපේ හිතේ හදාගත්ත සම්මුති නාමය බාහිරට ගැට ගහලයි තියෙන්නේ. දැන් ඔබට වැටහුනාද? **"චත්තාරෝච මහ භූතං චතුංනන්ච මහා භූතානං උපාදාය රූපං, රූපං වදේති"** කිව්වේ මේ මෙන්න මේ නිසයි. හතර මහා භූත නිසා අප විසින් හදාගත්ත උපාදාය රූපයක් අපි ඇසුරු කරන්නේ. අපි රූපං රූපං කියන්නේ **කිංච නාම රූපං වදේති.** අන්න මෙතැන රූපය කොටස් වලට බැලුවත් ඔබට හොඳට දකින්ට ලැබෙයි බාහිර හතර මහා භූත නිසා හැදුනු දේ නෙමේ අපි ඇසුරු කරන්නේ. උපාදාය රූපයක්, අපි ස්කන්ධය නිසයි, මේ ඇත්තටම අපිට විඤ්ඤාණය දැනග ැනීම එන්නේ. **ස්කන්ධානං පාතුභාවො ආයතනං පටිලාභෝ අයං වුච්චති ජාති,** අඹ ගහ කියන ජාතිය හැදුනේ, මෙන්න මේ ස්කන්ධ වේදනා, සංඥා, සංඛාර නිසයි,

දැන් කොහෙන්ද **රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණය** මේ ස්කන්ධ දිහා බැලුවම මේ රූපය ආවේ. එතකොට තමයි ඔබට දැනෙන්නේ හේතුඵල දහම. හේතුව නිසා හටගත්ත ඵලයක් තමයි, මේ ප්‍රතිබිම්බය. අපේ ඇහැට වැටෙන්නේ කිරණයක්, හැඩතලයක් කැමති විදියට දක්වන්න පුලුවන්. හැබැයි ඒක සම්මුති නාමයක් නැත. ආලෝකය තිබුනොත්, ඒ ආලෝකය ගසට පතිත වෙලා, ඒ ගසෙහි හෙවනැල්ල පොළොවට පතිත වෙනවා. මෙන්න මේ, ආලෝකයත් ගසත් නිසා හටගත්ත සෙවනැල්ල තමයි ප්‍රතිබිම්බය. මේ සෙවනැල්ල අර කන්නාඩියේ වැටෙන ප්‍රතිබිම්බය වගේ. එතකොට මේ ප්‍රතිබිම්බයේ තියෙනවද දෙයක්. ප්‍රතිබිම්බයේ තියෙනවද සම්මුති නාමයක්, නැහැ නේද? හැබැයි මේ ප්‍රතිබිම්බයේ කිසිවක් නැහැ නේද? ප්‍රතිබිම්බය කණ්නාඩිය කියලා හිතන්න. මේ ඇස, එහෙම නම් මේ ඇස කණ්නාඩිය වගේ. හැම දේම ඇසට වැටෙනවා. හැබැයි මේ ඇසෙ එහෙම කිසි දෙයක් නෑ. කණ්නාඩියේ කිසි දෙයක් නැහැ. හැබැයි ඒ වගේ පේනවා. ඔබ ගෙදරදි ටීවී එක දිහා බලනවා ඇත්තටම ටීවී එකේ තිරයේ මුකුත් තියෙනවද? නැහැ, හැබැයි ඔබට සැපදුක් එනවා. ඔබේ ටීවී එකේ තිරයෙ තියෙන දේට ද සැපදුක් එන්නෙ. ඔබ හිතින් හදා ගත්ත දෙයට ද? **අපි හිතින් හදාගත්ත දෙටයි, සැපදුක් එන්නෙ. එහෙම නං අපි සිතින්, අපි හදාගෙනයි බලන්නෙ ඒකයි ඇත්ත.** ඒක නිසා තමයි බුදුන් වහන්සේ මේ පෙළ දහම පෙන්වනවා **චක්ඛුං පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තින්නං සංගති ඵස්සෝ, ඵස්ස පච්චයා වේදනා, යංවේදයිති තං සඤ්ඣිනාති** කිව්වොත් මේකේ ඇත්ත දැකලා **යංවේදයිති තං සංජානාති, යං සංජානාති තං විතක්කේත, යං විතක් නේති. තං විජානාති** එතකොට **විජානාති** දැනගැනීම

එතකොට අපි නැවතත් බැලුවොත් **චක්ඛුංච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං**, එතකොට **චක්ඛු විඤ්ඤාණය** කියන්නේ, මේ ඇහේ ආපු ප්‍රතිබිම්බය ඒකේ සම්මුති නාමයක් නැහැ. එතනත් හැබැයි චක්ඛු විඤ්ඤාණයේ, විඥානයේ නම තියෙන නිසා ස්කන්ධයක් පවතිනවා. විඳීම්, හැඳිනීම්, දැනගැනීම් හැබැයි එතන කෙනෙක් පුද්ගලයෙක් එහේම දෙයක් නැහැ. එතන තියෙන්නේ ස්කන්ධයක් පමණයි. එහි ඇත්තේ හැඩතලයක්, ඒ නිසා හටගන්න ප්‍රතිබිම්බයක්. එතකොට ඒ නිසා හටගත්ත ස්පර්ශයක්, පටිගසම්පස්සයට අධිවචන සම්ඵස්සය. මේ ස්පර්ශය ගැන තමයි මෙතනදි කතා කරන්නේ. ඇත්තටම, අපි බලමු මෙය පැහැදිලි කරලා. ස්පර්ශය නිසා හට ගන්නේ **වේදනාව, තිණ්ණං සංගති ඵස්සෝ, ඵස්ස පච්චයා වේදනා.** වේදනා වේ මෙතනදි මනෝ විඤ්ඤාණයට එනවා ස්පර්ශය වෙනවා කියන්නේ **පටිඝ සම්ඵස්සයට අධිවචන සම්ඵස්සයක්** කියන්නේ **අධිවචන** කියන්නේ **චෛතසික.** එහෙමනම් එතැන සිතුවිලි තියෙනවා.

එහෙම නම් එතැනට වේදනා කියන්නේ මේ හැඩතලයේ විඳින, ඒ හැඩතලයේ විදපු, "**යං වේදයිත යං සංජානාති**, සංජානාති දැන ගැනීම එනවා. ඒ සංඥාවට තමයි පෙර තිබුණු සම්මුතිය ගලපලා බලන ඒක සංඛාර කරනවා කියන්නේ. අන්න **යං වේදෙති තං සඤ්ජානාති** ඒ කියන්නේ. **සඤ්ජානාති තං විතක්කේති**, ඒ කියන්නේ මේක සංඛාර කරලා විතර්ක කරලා ගලපලා බලනවා. **යං සංජානාති තං විතක්කේති, යං විතක්කේති, තං විජානාති,** ගලපලා බලලා පෙර මතකයෙන් සම්මුතියෙන් හදාගත් නම් නාමය හඳුන ගන්නවා. ආවෙ හැඩතලයක්, දැනගත්තේ නමක්. නම තමයි බාහිර තියෙන්නේ අඹ ගහ, පොත,

කළය, මුට්ටිය, ඒ ඕන දෙයක්. දැන් ඔබ බාහිරෙන් දෙයක් තියෙනවා කියලා අල්ලා ගත්තොත්, ඒක උපාදාන කරගත්තා වෙනවා. **වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ** නිසා හටගත් දේ, ඒ විඤ්ඤාණයෙ දැනගැනීම බාහිරයට ගැට ගැහුවොත් උපාදාන වෙනවා. ඒකයි **යං වේදේති තං සඤ්ජානාති යං සංජානාති තං විතක්කේති යං විතක්කෙති තං විජානාති** කියලා කියන්නේ. බාහිරයෙන් ඒ දේ ඇත්ත වෙලා. එහෙම වුණොත් සැපදුක් එනවා. ඒ කියන්නේ **යං විජානාති** කියපු ගමන්, බාහිරයට හිත යනවානේ. හැබැයි එතන මේ සත්‍ය, මේ සිත හැදෙන හැටි දැක්ක කෙනාට, අන්න සත්‍ය ඤාණ ඇති කෙනා අන්න එයා, සංජානාති වෙනවා, ඒ කියන්නේ මේක දකිනකොට බාහිර නෙමෙයි, පේනවා නෙවෙයි, මේ හිතනවා කියන තැනට එනවා. එතනයි තියෙන්නේ යථාභූත ඥානය. දැන් මෙතනදි අපි තවත් දෙයක් දකින්න ඕනේ, ඒ කියන්නේ, බාහිර උපාදාන කරගත්තා කියන්නේ, **උපාදාන පච්චයා භවෝ,** පටිච්චසමුප්පාද විවරණයට අපි දැන් එමු, **අවිජ්ජා පච්චයා සංඛාරා,** මෙන්න මේ අවිද්‍යාව නොදන්නා කම නිසයි, මේ සංඛාර සිතුවිලි බාහිරයෙන් ගලපලා බලලා සම්මුතියෙන් අරගෙන තියෙන්නේ **අවිජ්ජා පච්චයා සංඛාර, සංඛාර පච්චයා විඤ්ඤාණ,** ඒ සංඛාර නිසා තමයි චේතනා කිරිම නිසා තමයි විඤ්ඤාණ දැනගැනීම ආවේ. **සංඛාර පච්චයා විඤ්ඤාණ, විඤ්ඤාණ පච්චයා නාමරූප** අන්න ඒ විඤ්ඤාණය දැනගැනීම දැන් බාහිරයට ගැටගහලා බලන එක නාම රූප හදාගන්න ආයතනයක් හදාගන්න ඕනේ, ඒ නාම රූප දෙක ගැට ගැහෙනවා නාම රූප දෙක දැන් හිතින් හදාගත්ත දෙය නාම, බාහිර තියෙන රූපයකට ගැට ගැහිලා නාම රූප දෙක ගැට ගැහෙනවා එතකොට **විඤ්ඤාණ පච්චයා නාමරූප** ඒ විඤ්ඤාණයට නාම රූප ගැට ගැසීම

තුළයි විඤ්ඤාණය. එතකොට ඒත් එක්කම සළායතන ඇසක් ඇරලා ආයි බාහිරය බලනවා. අර තියෙන්නේ ඒක තමයි කියලා බාහිරයෙන් ඒක අල්ලගන්නවා. අන්න **නාම රූප පච්චයා සලායතන, සලායතන පච්චයා ඵස්සෝ.** නැවතත් මේ කියනවා. ඇස ඇරලා බැලුවා ආයි ස්පර්ශයට එනවා. එතකොට ආයි ප්‍රතිබිම්බය පේනවා. ඔව් ඒක තමයි ඒ තියන්නේ **රූපං රූපත්තාය සංඛතං අභිසංකරෝති** කිව්වේ, මෙන්න මේ නිසයි. මේ රූපය රූපයක් බවට පත්වෙනවා, දැන් නැවත බැලීම නිසා උපාදාන කරගත්ත නිසා. එතකොට මේ පැහැදිලි කිරීමත් එක්ක ඔබ බැලුවොත් පටිච්චසමුප්පාද විවරණයම ඒතකොට **අවිද්‍යා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණ, විඤ්ඤාණ පච්චයා නාමරූප, නාමරූප පච්චයා සළායතන, සලායතන පච්චයා ඵස්සෝ, ඵස්ස පච්චයා වේදනා,** දැන් මේ අර ආපු ක්‍රමයට. ඉතින් මේ මනෝ විඥානයට ආපු වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, මේ විදිමෙන්, වේදනාවෙන් විදපු දේ. ඇත්තටම බාහිර දෙයක් බවට පත් වුණා. ඒකට ඇලෙනවා, ගැටෙනවා එකට තණ්හාව, ඇති වෙනවා උපාදාන කරගත්ත නිසා **වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදාන, උපාදාන පච්චයා භවෝ,** අන්න භවයක් හැදෙනවා. දැන් අඹ ගහ කියනා භවය, එහෙම නැත්තං පොත කියන භවය, කලය කියන භවය. එතකොට **වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති.** ඒ කියන්නේ භවයක් හැදුනොත්, බාහිර අඹ ගහක් තිබ්බොත්. හැබැයි ඒක ඇති වෙනවා නැති වෙනවා. එහෙම නං **ජාති ජරා මරණ.** මෙතන තියෙනවා. අඹ ගහක් කියන තැන ජාතිය හැදෙනවා, ජරා මරණත් ඒ එක්කම තියෙනවා. මේ **පටිච්ච සමුප්පාද විවරණය** එක් ක්ෂණයෙ

සිත දකින හැටි. හැබැයි මේ කතාව මෙතැනට ඔබ ගලප ගන්න ඕනේ. සූත්‍රය බොහොම පොඩියට පෙනුනට මෙහි ගැඹුරු අර්ථයක් පෙන්වනවා. අවිද්‍යා නීවරණස්ස. අවිද්‍යාව නීවරණයක්, නිවන වහන ධර්මයක්. ඒ කියන්නේ මේ සිතේ සත්‍ය දකින තැනයි. මේ නිවන තියෙන්නේ, හිතේ සත්‍ය වහනවා. **අවිද්‍යා නීවරණස්ස භික්ඛවේ බාලස්ස තණ්හාය සම්පයුත්තස්ස.** ඒ කියන්නේ වැසුනු තණ්හාවෙන් බැඳුනු බාලයාට මේ කයක් ලැබිලා තියෙනවා. **තණ්හාය සම්පයුත්තස්ස ඒවමයං කායෝ සමුදාගතෝ.** එතකොට **කාය සමුදා ගතෝ** කියන්නේ, බාහිරයෙන් කයක් හම්බවෙලා, දැන් ඒ කෙනා තමන්ගේ රූපය දකින්නේ බාහිරයෙන් ඒ විදියටම තමයි. ඒ කියන්නේ, තමන්ට අඹ ගහ පේන්නේ තමන්ගේ ඇස් දෙකෙන්නේ. තමන්ගෙ ඇස් දෙක පොඩ්ඩක් පාත් කරලා කණ්ණාඩියෙන් හරි තමන්ගේ රූපය දිහා බැලුවොත්, බාහිරයෙන් කයක් හම්බවෙලා. ඒ කියන්නේ, ඒ කෙනාට මේ තියෙන රූපය මගේ කියලා, නමුත් ඒක බාහිර. නමුත් ඒ රූපය මගේ කියලා. එතකොට කයක් තියෙනවා කියලා හිතනවා. මම ඉන්නවා කියලා හිතනවා. අන්න එතන අවිද්‍යා නීවරණයෙන් වැසුනු ඒ තණ්හාවෙන් බැඳුණු බාලයාට කයක් තියෙනවා කියලා ඒ බාලයා රැවටෙනවා කියන එක. බාලයාට මේ කයක් ලැබිලා තියනවා කියලා. මේ කය මගේ කියලා බාලයා අල්ලගන්නවා. අන්ත දෙකයි. මෙතැනදී **ඒව මේවං කායෝ සමුදාගතෝ,** ඉතින් කායවල් **සමුදාගතෝ** කියන්නේ ගොඩවල්. ඒගොඩවල් **කායො** කියලා ගන්න පුළුවන්. නැතිනම් ඒ **කාය** කියලා තමන්ගේ කය ගන්නත් පුළුවන්, කොහොම හිතුවත් මෙතැනදි **සමුදාගතො** අල්ලා ගැනීමක් සිද්ධ වෙනවා. එතකොට "**ඉති අයංච කායෝ බහිද්ධාච නාම-රූපං ඉත්තත්තන් ද්වයං.** එතකොට නාම රූපයක් "**ඉති**

**අයංච කායෝ බහිද්ධාවා, අජ්ජත්වා, බහිජ්ජත්වා"** කියන කොන්දෙක මෙන්න මෙතනදි ඒක බාහිර කියලා ගත්ත ගමන්, ඒ අර කොන් දෙක විඤ්ඤාණයේ දැනගැනීම. එතකොට **අජ්ජත්ත බහිද්ධා,** බාහිර කියලා අර ගත්ත ගමන්, බාහිර තියෙනවා කියලා ගත්ත ගමන්, එතකොට මෙතන එහෙමනං බාහිර දකින කෙනා, මම ඉන්නවා. එහෙමනං බාහිර, **බහිද්ධා අජ්ජත්තා,** මෙතන මම. එතකොට අතන ඒක නම් මෙතන මම. **ඒතං මම,** එතකොට ඒක දකින මම ඉන්නවා. දැන්කෙනෙක් ඉන්නවා කියලා බාලයා ගන්නවා. **ඉති අයංච කායෝ බහිද්ධා ච නාමරූපං ඉත්තත්තං ද්වයං, ද්වයං පටිච්ච ඵස්සෝ සලායතනානි යෙහි පුට්ටො ද්වයං පටිච්ච ඵස්සෝ.** දැන් මේ දෙක එකතුවෙලා පටිච්ච වෙලා තමයි **නාමරූප පච්චයා සලායතන** කියන්නේ. නාමයත් රූපයත් මෙහෙම වෙන් කරලා දැකීමමයි සලායතන කියන්නේ. **ද්වයං පටිච්ච ඵස්සෝ සළායතනාති යෙහි පුට්ටොයේහි බාලෝ සුඛ. දුකඛං පටි සංවේද ඉති.** බාලයාට **සුඛ දුක්ඛං පටිසංවේදී.** දුක ඇතිවෙනවා මෙන්න මේ විදියට ඇත්ත කරගැනීම තුළ. බාහිර අජ්ඣත්ත බහිද්ධා කොන් දෙකක් තිබීම නිසා. ඉතින් මේක තමයි සූත්‍රය පැහැදිලි කිරීම. **'ඒතේ සංවා අඤ්ඤතරං'** කියලා. මේක තමයි එතකොට මේ බාලපණ්ඩිත සූත්‍රය සංයුක්ත නිකායේ බුද්ධ ජයන්ති ත්‍රිපිටක 14 සංයුක්ත නිකායේ දෙවැනි කොටසේ 38 වැනි පිටුවේ දකින්න ලැබෙන **බාල පණ්ඩිත සූත්‍රය** බාලයාට මේ කයක් ඇත කියලා ගැනීම තුළ ඇතිවන ඒ දුක ඇතිවෙනවා කයේ, මනාකොට පැහැදිලි කරනවා. එහෙමනම් තෙරුවන් සරණයි. මේ කොන් දෙකෙන් මිදුණු මධ්‍යම ප්‍රතිපදාව හඳුනාගන්න ඕනෙ, බාහිර දෙයක් තියෙනවා කියලා ගත්තොත් ඒ දකින මම මෙතැන ඉන්නවා. **ඒතං** මම, බාහිර දෙයක් නැහැ බාහිර සත්‍ය දැක්කොත්

මේ සිතේ අන්න **සංජානාති.** සංඥාවට විතර්ක කරලා දැන් ගත්ත දේ, සිතේ ඇත්ත දකිනවා. ඒහෙම උනොත් ඒ කෙනා බාහිරයෙන් මිදෙනවා, **මෙයයි දර්ශනය.** මේ දර්ශන සත්‍යය ඥාණය. මෙන්න මේ බුද්ධ දර්ශනය හඳුනා ගන්න ඕනේ, ඒ තුළ තියෙනවා අන්ත දෙකෙන් මිදෙන එක. ඇත්තටම අජ්ඣත්ත බහිද්ධා කියන මේ කොන් දෙකෙන් මිදෙන එක. ද්වයං සූත්‍ර මාලාවම ඉදිරිපත් කරන්නේ බුදුන් වහන්සේ. එය අපට පැහැදිලි කරපු **ඛුද්දක නිකායේ** එහෙම මේ සේරම මේ අන්ත දෙක පෙන්නන තැන තමයි. ඇත්තටම බුද්ධශාසනයේ අන්ත දෙක දකින තැන තමයි තියෙන්නේ. අන්ත දෙකෙන් දැකලා අන්ත දෙකෙන් මිදිලා මධ්‍යම ප්‍රතිපදාව හඳුනගන්න තැනයි. අපට මේ බුද්ධ ශාසනය හමුවන්නේ. එහෙමනම් මේ බුද්ධ දර්ශනය හඳුන ගන්න ඕනේ. ඒ වගේම සත්‍ය ඥාණය දර්ශනය කුමක්ද කියලා තමන්ට අවබෝධයක් තියෙන්න ඕනෙ, ඒ කෙනාට තමයි මේ නිවන් මඟ එළි පෙහෙළි වන්නේ. සෝවාන් මාර්ගඥාණය ලබන්න පුළුවන්. දර්ශන සමාපත්තිය ඇති අයකුට පමණයි කියන එක. ධර්ම සංඝීකරනයේ පමණක් නොව සබ්භාසව සූත්‍රයේ පවා ඔබට දකින්ට ලැබෙනවා. මේ **දස්සනා පහ තබ්බා** කියන කොටසේදී, ඒ සෝතාපන්න වෙන්නේ. ඒ කියන්නේ මේ නිවන් මාර්ගය සාක්ෂාත් වෙන්නේ, මේ දර්ශන සමාපත්තිය, එහෙම නැත්නම් මෙන්න මේ සිතේ සත්‍ය දකින කෙනාටයි කියන එක.

තෙරුවන් සරණයි

ඔබටත් නිවනින්ම සැනසීම ලැබෙන්න ඕනේ.!!!!

# 09. ලෝක සූත්‍රය

**ලෝක සූත්‍රය සංයුක්ත නිකායේ 4 බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාවේ දාසය වැනි ග්‍රන්තයේ 117වෙනි පිටුව**

මේ ලෝකය ලෝකය කියලා කියනවා, අපි දන්නවා බුදුන් වහන්සේ, ලෝකය කියලා කියනකොට, බුදුන් වහන්සේ, දේශනා කරන්නේ, **චිත්තේන නීයති ලෝකෝ,** සිත තුළ මැවෙන ලෝකය බාහිර තියෙන ලෝකයක් ගැන නෙමෙයි බුදුන් වහන්සේ දේශනා කරන්නේ, සිත තුළ මැවෙන ලෝකය. ඒකට හේතුව අප දුක් විඳින්නේ අපේ සිත තුළ මැවෙන ලෝකය නිසයි. අපි දුක් විඳින්නේ අපි සැප විඳින්නේ අපේ හිතින්. බාහිර තියෙන දෙයක් නිසා නෙමෙයි, නමුත් අපිට හිතෙන්නේ අපිට මේ හැමදේම බාහිර තියෙනවා කියලා. අපිට දුක එන්නේ නමුත් බාහිර තියෙන දෙයක් නිසාද? එහෙම නම් ඇයි අපි ටීවී එක දිහා බලාගෙන, අඬන්නේ ඇයි? අපි ටීවී එක දිහා බලාගෙන දුක් වෙන්නේ, සතුටු වෙන්නේ ටීවී එකේ දෙයක් තියෙනවද? නැහැ **චිත්තේන නියති ලෝකෝ**. සිත තුළ මැවෙන ලෝකෙ, **සළායතන ලෝකෝ ලෝකෝ** ඇස, කණ, දිව, නාසය, කය, මන, කියන මෙන්න මේ ආයතන නිසා මැවෙන ලෝකෙක අපි අතරමං වෙලා ඉන්නවා.

හැබැයි මේ ලෝකය පවතින ලෝකයක් නෙමෙයි, මේ ලෝකය හේතු නිසා හටගෙන හේතු නැති වෙනකොට නැතිවෙන මායාවක්, මේ මායාවේ අපි අසරණ වෙලා ඉන්නවා. මේ මායාව මැවෙන්නේ කොහොමද, ප්‍රසාදය කොහොමද සිද්ධ වෙන්නේ. ආලෝකයට මේ ඇස ප්‍රසාද වත් වෙනවා, ශබ්දයට කණ ප්‍රසාදවත් වෙනවා, ගන්ධයට, ඒ ඝාන ඉන්ද්‍රිය ප්‍රසාදවත් වෙනවා. ඒ රසට දිව ප්‍රසාදවත් වෙනවා, **ඇස කන දිව නාසය කය මන,** කියන ඒ කයට උණුසුම සීතල තද ගතිය ප්‍රසාද වත් වෙනවා, මනසට සිතුවිලි නැවත නැවත අරමුණු ඔස්සේ ප්‍රසාදයක් ඇති කරනවා. මේ විදියට හැම ක්ෂණයේම මේ ස්පාර්ක් එකක් කියලා අපි කිව්වා. ප්‍රසාදයක් සිද්ධ වෙනවා. බුදුසමය තුළ භාවිතා කරන වචන අද නව යොවුන් තරුණයෙකුට මේ යුගයේ ගැලපෙන වචන අනුව අපට පුළුවනි පැහැදිලි කරන්න. අපි නිහතමානීව බුදුන් වහන්සේ ලෝකයට හෙලි කරපු ඒ සත්‍ය දෙයක් නැති බව, හේතු නිසා හටගෙන හේතු නැති වෙනකොට නැති වෙන ධර්මතාවය. ධර්මතාවයක් තුළ දෙයක් නැහැ. පොත, මේසේ, ඇඳ, දුව, පුතා, ඉර, හඳ, අඹ ගස, නා ගසා අපි හිතන්නේ මේක තමයි අපේ ලෝකය කියලා. අපිට දෙයක් තියනවා, පොත කියලා දෙයක් තියනවා,

පුටුව, මේසේ, ඇඳ, ගෙවල් දොරවල් මේ හැමදේම දෙයක් වගේ බලන්න, දෙයක් නෙමේද? ඔව් දෙයක් තියෙනවා, තියෙනවා නම් අපිට ඒවා කැඩෙනවා, කැඩුනොත් අපිට දුක එනවා, එහෙමනම් මේ දෙයක් තියෙනවා කියලා ගත්ත නිසයි දුක එන්නේ හොඳට දකින්න. ඇත නැත කියන අන්තවල මේ සත්‍ය ධර්මය නැහැ. ඇත්තටම තියෙන දෙයකුත් නැහැ, එහෙමනම් අපි ඉන්නේ රැවටිලා. මේක සම්භූත වෙනවා

කිව්වේ ඒකයි. "**හේතුං පටිච්ච සම්භූතා හේතු නිරුජ්ජා නිරුජ්ජති.**" එයයි ධර්මය. මේ ලෝක සූත්‍රය පෙන්වන්නේ අන්න ඒකයි. එක්තරා මහන කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය, එකත් පසව උන් ඒ මහන භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළේය, වහන්ස ලෝකය ලෝකය යයි කියනු ලැබේ, වහන්ස කොතනකින් නම් ලෝක යයි කියනු ලැබේද, මේ බුදුන් වහන්සේගෙන් අසන ලද ප්‍රශ්නය ලෝකය ලෝකය යැයි කියනවා ස්වාමීනි කොතනකින් නම් මේ ලෝකය පනවම්ද? අන්න එතනදි බුදුන් වහන්සේ මනා කොට පැහැදිලි කරනවා,

"**ලුච්චතිති කො භික්ඛු තස්මා ලෝකෝති උච්චති,**" මහන නැසේ නම්, පලුදු වී නම්, නැසෙනුයේ ද, එහෙයින්, ලොකය යයි කියනු ලැබේ. **ලුජ්ජතිති ඒ කියන්නේ පලුදු වෙනවා** කියන එක, එ කියන්නේ අපි කිව්වා ප්‍රසදවත් වෙනවා කියලා. ඇයි ප්‍රසාදවත් කියන වචනයේ ලුජ්ජතිති කියන වචනේ, මේ ලුජ්ජතිති කියන වචනයට ඇයි ස්පාර්ක් වෙනවා කියලා කියන්න බැරි, මෙතන ස්පාර්ක් ගොඩක් කියලා කියන්න බැරි අර කරන්ට් එක නෙගටිව් පොසිටිව් වයර් දෙක එකට එකතු කළ විට ස්පාර්ක් වෙන්නෙ, අර අව්වට අර ආලෝකයට ඉර එලියට කණ්නාඩිය ඇල්ලුවම දිලිසෙන්නෙ, මේ ක්ෂණයක් ක්ෂණයක් පාසා විශාල වශයෙන් මේ එන ප්‍රසාදවීම, ආලෝකයට දිලිසීම නේද? මේ චක්ඛු ප්‍රසාදය සිද්ධ වෙන්නේ. එතැනදී. එහෙනම් දිලිසීමක් නම් ඒක ආලෝක දිලිසීමක් පමණයි. චක්ඛු ප්‍රසාදය කියන්නෙ, දිලිසීමක් පමණයි කිව්වෙ, එක ආලෝකයත් ගසත් නිසා වැටෙන සෙවනැල්ල ප්‍රතිබිම්බය, කන්නාඩියේ ඔපය නිසයි එතන කණ්නාඩියේ අපට දෙයක් පේන්නේ. එහෙනම්, **කම්ම, චිත්ත, ඍතු,** ආහාර

කියලා "**චතු සමුට්ඨාන**" කියලා රූප කලාප පනස් හතරකට බෙදන්නේ, අන්න ඒ ඔපය හැදෙන හැටි පෙන්වන්නයි. අර වීදුරුවේ රසදිය නිසානේ, වීදුරුවෙන් අපට පේන්නේ, අන්න ඒ වගේ තමයි, අපේ මේ අක්ෂි, එහෙම නැත්නම් චක්ඛු ප්‍රසාදය, ඒ ඔපය හැදෙන හැටි, ඒ සිනිඳු පටලය හැදෙන හැටි, ඒ කේශ නාලිකා ඔස්සේ ඒ ආශ්වාස ප්‍රශ්වාස වාතය ඔස්සේ එන අන්න ඒ සිනිඳු පටලය හැදෙන හැටි. ඒකයි **පඨවි, ආපෝ, තේජෝ වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා** කියලා **ශුද්ධාෂ්ටක** විදිහට දැකලා ඒ ශුද්ධාෂ්ඨක විදියට, ඒ රූප කලාප විදියට ඒ රූප කලාප 54 කින් ඒ චක්ඛු ප්‍රාසාදය හැදෙන හැටි. **කම්ම, චිත්ත, ඍතු, ආහාර** කියලා පෙන්නුවේ. ඒක ප්‍රසාදයක්, බිඳීමක්, මොකක්ද බිඳෙන්නේ එතන ප්‍රසාදවත් වෙන්නේ, ඒ චක්ඛු ප්‍රසාදය, ඇස ආලෝකයටයි ප්‍රසාදවත් වෙන්නේ ආලෝකය නිසයි බිඳෙන්නේ. දැන් වැටහෙනවාද? **ලුජ්ජතිති** කියන වචනය ස්පාර්ක් කියන, අපි කියන ප්‍රසාදය කියන්නේ, ස්පාර්ක් ගොඩාක් කියන්නෙ ස්පාර්ක් ගොඩාක්. අපි බිත්තිය දිහා බලන් ඉන්නවා. හැබැයි මෙතන වේගයෙන් ස්පාර්ක් වෙනවා වර්ණයක්. අන්න චිත්තක්ෂණ කෝටි ගාණක් පහළ වෙනවා කියලා අපි ඔය කතා කරන්නේ, චිත්ත විථිවල කතා කරන්නේ ඔය කාරණයයි. **සම්පටිච්චන, සංතීරණ, වොත්තපන ජවන්, ජවන්, ජවන්** කියලා කියන එක ලොකු තේරුමක්, "**පටිඝ සම්පස්සයට අධිවචන සම්පස්සය,**" එහෙම නැත්නම් ස්පර්ශයක් මේ මොන විදිහට කිවුවත් මේකේ මූලික අවස්ථාවයි ප්‍රසාදය කියන්නේ. ඒ චක්ඛු ප්‍රසාදයකින් විතරක් අපට දෙයක් හම්බ වෙන්නේ නැහැ. "**දිට්ඨේ දිට්ඨ මත්තං**" කියන තැනට එහෙම නම් යනවා, ඔව් දුටු දෙයක් නැහැ, දෙයක් කොහොමද හැදෙන්නේ දුටු කෙනෙක් නැහැ, දෙයක් කෙනෙක් කියලා අපි ගත්තොත් විතරයි දෙයක් කියන දෙය

හැදෙන්නේ, දෙයක් කියන දෙය හැදෙන්නේ කොහොමද? ආත්ම දෘෂ්ටියකින්, මේක අපි දකිනවා කියලා දෙයක් නෙමෙයි, සොබාදහමක් මෙතන තියෙනවා. ඒ තමයි මේ ප්‍රසාදවත් වනවා කියපු එක, මේ ස්පාර්ක් වෙනවා කියපු එක, එහෙම නැත්තං මේ **පලුජ්ජති** කියපු එක, එහෙම නැත්නම් මේ **ලුජ්ජතිති** කියපු එක, මේකයි ඔබ නුවණින් දකින්න ඕන කාරණය, මෙතන ස්පාර්ක් වෙනවා, ඇහැ ස්පාර්ක් වෙනවා, වර්ණයට කන ස්පාර්ක් වෙනවා, ඒ කර්ණ සංඛ පටලය හෙල්ලෙන්නෙ ඒ නිසයි.

අහසේ විදුලි කොටන කොට මෙහෙ ජනෙල් හෙල්ලෙනවා වගේ, එලියේ ශබ්දයක් එනකොට අම්මා කියලා, අපේ කර්ණ සංඛ පටලය හෙල්ලෙන්වා. ඒ ශබ්දයට, ප්‍රතිකම්පනය වෙනවා. ඒ ප්‍රතිකම්පනයට, අර ස්වරාලය ආශ්වාස ප්‍රශ්වාස වාතයත් එක්ක විසිල් එක වගේ වදින කොට, මම්, මම් ගාලා ඒ ශබ්දය ප්‍රති කම්පනය නිසයි එසේ සිද්ධ වෙන්නේ. අර ආලෝකයට ඒ එන හැඩතලයට, ආලෝක හැඩතලයට වර්ණ ප්‍රසාදයත්, එතන ශබ්ද වර්ණ ප්‍රසාදයත්, එකට සම්මිශ්‍රණය වීම, **සං පටිච්චන වීම,** එකතු වීම, ඒ එකතු වීමේ ස්වභාවය, චිත්ත ස්වභාවයයි. ඒ චිත්ත ස්වභාවය තමයි මෙතන ප්‍රතිකම්පනයට හේතු වෙන්නේ. ඒයයි හේතුව එතැනින් එන ශබ්ද ස්වභාවයයි, ඒ ශබ්ද ස්වභාවයට මේ ශබ්ද ස්වභාවයයි, බලන්න මේක ස්වභාවිකව ගොඩක් සංසිද්ධී තියෙනවා. එක තැනක රැහැයියෙක් කෑගහන කොට ර් ගාලා තව තැනක ඒ වගේම ශබ්දයක් එන්නෙ. තව විදියකට බැලුවොත් මේ පැත්තෙන් අපි බෙලෙක්කයක් හයියෙන් හෙළ වුවොත් ඒකට වැලි කැටහරි දාලා තිබුනොත් ඒකත් ඩර් ගලා තවත් විදියකට හෙල්ලෙනවා. අතන තව ශබ්දයක්, ඒක නිසාම හටගත්ත

තවත් ශබ්දයක්, අන්න ඒ වගේ එලියේ ශබ්දයක්, ඒ ශබ්දය නිසාම හටගත් ස්වරාලය, තවත් ශබ්දයක් අර අම්මා පුතේ මේ අම්ම, අම්මා අර හැඩතලයට දැන් අම්මා එකතුවෙලා. දැන් අද කෝල් එකක් දීලා අම්මා කිව්වහම අපිට හැඩතලය එනවා. ඉස්සරහ හැඩතලය එනකොට ආලෝකය එනකොට අපිට ශබ්දය එනවා.

මේ දෙක වෙන් කරන්න බැරි ඒකයි, මේ සිතක සිද්ධ වන්නේ **චිත්ත නියාමය, ඒකයි ඍතු නියාම, බීජ නියාම, කම්ම නියාම, ධම්ම නියාමය, චිත්ත නියාම** අඳුනගන්න. මෙයයි රැවටීම එතන ආත්ම කතාවක් නැහැ. සොබාදහමයි. සොබාදහම යනු ශබ්ද වර්ණ එකතු වීම කියන කාරණයයි, මෙය නොදකින තාක් කිසි කෙනෙකුට මේ ධර්මය හමුවන්නේ නැහැ. බාහිර දෙයක් නැහැ කියලා හිතන්න පුළුවන්, හැබැයි දෙයක් නැහැ කියලා හිතනවා, ඒක අමතක කරන්න එපා. එතනත් දෙයක් හැදිලයි, නෑ කියලා හිතන්නේ. හිතෙත් දෙයක් නැහැ කියලා හිතන්න පුළුවන්. හැබැයි දෙයක් නැහැ කියලා හිතනවා, එතන දෙයක් හැදිලයි, නෑ කියල හිතන්නේ. දෙයක් හැදිලා නෑ කියලා හිතන එකේ දෙයක් නැති වෙලා නැහැ, ඒකයි ඔබට පොත නෑ කියලා හිතුවාට පොත නැති වෙන්නේ නැත්තේ. ඒකයි ඔබේ ඥානයට සිහියට තාමත් ලෝකය තියෙන්නේ. ඔබ ලෝකයෙන් මිදිලා නැත්තෙ. ඒකයි ඔබ සෝතාපන්න නොවන්නේ. ප්‍රතිපදාවේ වරදක් නෙමෙයි. නමුත් **දර්ශනයේ** වරද තියෙන්නේ. බුද්ධ දර්ශනය තුළ දෙයක් නැති බව දැක්කේ නැති එකයි, **විනෙය්‍ය ලෝකෙ** කියන තැන හිටිය නැති ඒකයි සතර සතිපට්ඨානය වරදින්න හේතුව. ඒක කොහොමද ප්‍රායෝගික වන්නේ කියාලා නොදන්නා කමයි අසරණ බොළඳකම.

අවුරුදු සීයක් ගියත් කවුරුවත් මේක හරියට ගලපා ගත්තෙ නැත්නම් නිවන නම් හමුවන්නේ නැහැ. ඔබ අපි ඉන්න තැනට එන්න ඔබට අවුරුදු සීයක් ගියත් එහෙම නම් බැරි වේවි. බාහිර දෙයක් නෑ කියලා හිතුවත්, හිතේත් දෙයක් නෑ කියලා හිතුවත්, මේක ඇතුලෙ තියෙනවා රහසක් ඒ තමයි ශබ්දයයි වර්ණයයි කියලා ඒ අවිඤ්ඤාණක ස්වභාවය, සවිඤ්ඤාණක මනසට ගන්න බැරිකම, ආත්මීය හිතකට අනාත්ම දෙයක් අවබෝධ කරගන්න බැරිකම, පුලුවන්නම් ඔබ මේ දෙය කරලා බලන්න. පුළුවන් නම් ඔබ මේ මහා ප්‍රඥාව ඇති කරගන්න. පුළුවන්නම් ඔබ මේ ඥානය අවදි කර ගන්න. පුළුවන් නම් ඔබ මේ ඥාන අවදි කරගෙන මහා **අභිඤ්ඤාවකින්** නිවන කරා යන්න. ඒකයි අපි කියන්නේ හැම තිස්සේම මේ සිහියයි වැඩෙන්නේ, සිහියටයි දැනෙන්නෙ, නමුත් මහා ප්‍රඥාවට මෙතැන දී මහා විශාල කාර්යක් තියෙනවා **ඤායස්ස අධිගමාය නිබ්බානං සච්චිකිරියාය**, යන ගමන යන්න ඔනේ, අන්න එතනයි **ලුජ්ජති** කියන වචනය අපි පැහැදිලි කරන්න හේතුව, **ලුජ්ජති බෝ භික්ඛු තස්මා ලොකෝති වුච්චති**, මහණ, පලුදු වෙනවා, නැසෙනවා, එසේ හෙයින් ලෝකයයි කියනු ලැබේ. මේක ගලප ගන්න. මේ ලෝකය කියන එක ප්‍රසාදයක්, ඒ ප්‍රසාද ගොඩක එකතුවක්, වර්ණයයි, ශබ්දයයි. පොත කියන්නෙ ශබ්දයක්, ඒ ශබ්දය කවුරු හරි මුලින් දැම්මෙ නැත්නම් අද කොහෙද? පොත් කියලා දෙයක් තියෙන්නෙ. රැවටෙන්න එපා, ශබ්දයයි වර්ණයයි මේ කතාවෙ තියෙන්නෙ. මේකයි ශබ්ද, වර්ණ. මේක දැනිම, **දිට්ඨ සුත මුත** කියලා භාහිය තාපසතුමාට, බුදුන් වහන්සේට, කියන්න පුලුවන් නම් **දිට්ඨ සුත මුත** කියන තැන මූළ ධර්මයම තියෙනවා. දැන් වෙන මුකුත් එකතු වෙනවාද අපි ඔබෙන් අහනවා වර්ණයයි ශබ්දයයි ගන්ධයයි, රසයි

පහසයි, හැර වෙන මුකුත් එකතු වෙනවාද? දැන් **සක්කාය** කියන්නෙ වෙන මොනවා හරි එකතු වෙලාද? එහෙම නම් වර්ණය ශබ්දය නෙමෙයිද එකතු වෙන්නේ. එහෙම් නම් නාමය කියලා වෙනින් නොදන්න දෙයක්, හදාගෙන හරි යනවද, රූපය කියලා තව මොනවත් වචන ගොඩාක් හදාගෙන හරි යනවාද, "**චත්ථාරෝච මහ භූතං චතුංනංච මහ භූතං උපාදායා රූපං රූපං වදේති**" කියලා දැන් කවියක් වගේද? මේක කිව යුතුයි. ඔව් හතර මහාභූත නිසා "**චත්තාරෝච මහා භූතං**" ඒ හදාගත්ත උපාදාය රූප කොහේද, ඊට පස්සේ කියනවා හිතක්, ඊට පස්සේ මොකද වෙන්නේ, උපාදාය රූපය දැන් තියෙන්නෙ හිතේ. ඊට පස්සේ මොකද වෙන්නේ, දැන් නාමය, රූපය දැන් එතකොට, නාමීය රූපයනේ දකින්නේ, මේ නාමීය රූපය කියන්නේ, දෙකක් නෙමෙයි එකක් කියලයි දකින්නේ, අපේ අය, එතනය රැවටීම. පෘතග්ජන භූමියෙ තියෙන්නේ, අවිද්‍යාව, දෙකක් නෙමෙයි. එකක් කියලා දකින එක නාමිය රූපයක්, නාමීය රූපයක් කියලා කියන්නේ සිතුවිල්ලක්. එක විඤ්ඤාණයක්, එහෙම නම් ඒක විඤ්ඤාණයට එන්නේ, ඒක **රූප සංඥාවක්**, එහෙම නම් ඒක චිත්තයක්, එලියේ තියෙන දෙයක් නෙවෙයි, අපි හිතන එකක්. එහෙම නම් ඒක නාමය කියන්නේ **වේදනා, සංඥා, චෙතනා, ඵස්ස, මනසිකාර** හරිනේ. **චුල්ල වෙදල්ල සූත්‍රය** බැලුවත් ඔබට මෙයය හමුවෙනවා. සූත්‍රය පුරාවටම ඔබට දකින්න හම්බ වෙනවා. **වේදනා, සංඥා, චේතනා, ඵස්ස මනසිකාර අයං වුච්චති නාමං වදේති**, දැන් නාමය කියන්නේ මොකක්ද එතකොට. දැන් වේදනාව ආවේ කොහෙන්ද? එහෙම නම් ඔබට වේදනාව අහසින් එනවද? නැහැ, **චක්ඛුඤ්ච පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං තිණ්ණං සංගති ඵස්සෝ**, ප්‍රසාදයෙන්, පසුව එන වේදනාව. අන්න **ඵස්ස**,

**පච්චයා, වේදනා**" එතනින් ස්පර්ශය දෙපාරක් එනවා. ඒ කියන්නේ ස්පර්ශ දෙකක්, ස්පර්ශ දෙකක් කියන්නේ "**වට්ටං වට්ටටති**" කිව්වේ ඒකයි. එන්නේ කිරණයක්, කිරණයේ කොහෙද පොතක්, නැහැ, රැවටෙන්න එපා. දෙවැනි වටය දකින්න. එහෙනම් ඒ එන්නෙ කිරණයක්, දකින්නේ පොතක්. සිතුවිල්ල කොහෙද හැදුනේ, අන්න ඒකයි **චිත්ත මායාව**, ඒ කියන්නේ **වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර, වේදනං** ඒ වේදනාව යනු කිරණයක් "**පටිඝ සම්ඵස්සයට අධිවචන සම්ඵස්සය**" කියපු කතාව ගලපාගන්න, **ඒකයි මෙහි සැඟවුණ රහස.** විශාල දෙයක් මෙතන තියනවා '**පටිඝ සම්ඵස්සයට අධිවචන සම්ඵස්සයක්,**' ඒ '**පටිඝසඤ්ඤා**' ඒ **(රූප සංඥා)** වලින් මිදුණු තැනයි, ඔබට මේක දකින්න පුළුවන්, මහනුවණකට. ඒ කියන්නේ මේ වේදනාව කිරණයක්, ඒ කිරණයේ වේදනා මේ සංඥාව ඒ කිරණයේ හැඩතලය, ඒ හැඩතලය විඳීම, ඒ '**වේදනා සංඥා සංඛාර**' කියන්නේ ශබ්ද වර්ණ සියල්ල එකතුවෙලයි එන්නෙ, ඒකයි වේදනා, සංඥා, චේතනා අන්න ඒ චේතනා හෙවත් '**සංඛාරය**' සියල්ල එකතු වූන තැන **ඵස්ස මනසිකාර** කියන්නේ. **මඤ්ඤනා ප්‍රපංච,** හැදෙන්නේ ඒක දෙයක් වෙලා. දෙයක් වුණේ කොහොමද? ශබ්දයි වර්ණයි එකතුවෙලා. අන්න ඒකයි චිත්තය. ඒකයි ආත්ම කතාව. ඒකයි මේ පුංචි සූත්‍ර පාඨය තුළ විශාල ධර්මයක් පේනවා. ඔබට ඒක පෙනේවි. මේ විදියට දැක්කම එයයි ධර්මය. ධර්මය දැක්කම ධම්ම චක්ඛුසයෙන් දැක්කොත් ඔබට මේක පෙනේවි. නැතිනම් ඔබට මේ සූත්‍රයක් තවත් එක සූත්‍රයක් විතරයි. ඒකයි කිව්වේ '**ලුජ්ජතිති බෝ භික්ඛු තස්මා ලොකොති වුච්චති.**' මහණ පලුදු වේ ද, නැසෙනුයේ ද, ඒ හෙයින් ලෝකය යයි කියනු ලැබේ. මේ කතාවේ මුළු ධර්මයම තියෙනවා. '**කිංච ලුජ්ජති**' කිමෙක් පලුදු වේද යත්,

අන්න කියනවා, මහන ඇස පලුදු වේ, රූපය පලුදු වේ, චක්ඛු විඤ්ඤාණය පලුදු වේ. දැන් ඇසත් රූපයත් ඇසේ විඤ්ඤාණයත්, **චක්ඛුඤ්ච පටිච්ච රූපේ ච** මේ ඔක්කොම මේ සේරම හටගන්නේ ස්පර්ක් එක තුල, පලුදු වීම තුළයි හැදෙන්නේ. එකක්වත් ඒවා තියෙන ඒවත් නෙවෙයි, **ඒක මායාවක් වේගය තුළයි සකස් වෙන්නේ,** වේගය තුළ ඇතිවන නැතිවන ප්‍රවාහය තුළයි තියෙන්නෙ. ගඟ, සිත, වැස්ස, සුළඟ තියෙන දෙයක්ද? නැහැ. **ලුජ්ජතීති පලුදු වේ.** ඒ එකක්වත් තියෙන ඒවා නොවෙයි. දෙයක් කියලා දෙයක් තියෙනවද, දෙයක් කියලා දෙයක් නැහැ. මේ ඔබට හමුවන්නේ එත්‍ය ධර්මයයි. '**චක්ඛුං කෝ භික්ඛු ලුජ්ජති**' අන්න, කිමෙක් පලුදු වේද යත්, '**රූපා ලුජ්ජති චක්ඛු විඤ්ඤාණං ලුජ්ජති, චක්ඛු සම්පස්සෝ ලුජ්ජති.** අන්න ඊට පස්සේ කියනවා. එතකොට ඇස පලුදු වේ, රූපය පලුදුවේ, චක්ඛු විඤ්ඤාණය පලුදු වේ. එතනින් නවතිනවාද? නැහැ, දැන් මේ ඇස නිසා හටගත්ත **වේදනා, සඤ්ඤා, චේතනාව** තුළ තියෙන්නේ මොනවාද? දෙයක් කියලා ගත්තොත් එතන, පොතක් කියලා ගත්තොත් එතන ඇලෙනවා ගැටෙනවා. අන්න එතන තියෙනවා ඇසේ පහස, අන්න එතන තියෙනවා තෘෂ්ණාව, තණ්හාව. අන්න එතනයි කියන්නේ ඇසෙයි පහස පලුදු වේ, ඇස් පහස නිසා, 'සුව වූ' හෝ 'දුක් වූ' හෝ නොදුක් හෝ නොසුව වූ යම් විඳිමක් වේද, උපදී ද, එයත් පලුදු වේ.

දැන් ඔබට හොඳයි මිහිරියි රසයි කියල චන්ද රාගයෙන්, අපි හොඳයි පොතම ගනිමු. අපිට පොතක්, කියනකොටම හොඳයි කියලනේ දැනෙන්නේ හා පොතක් තියෙනවා කියලනේ දැනෙන්නෙ, හැබැයි තියෙන දෙයක් නැහැ පළුදු වේ. ඒයත් අනිත්‍යයි තියෙන දෙයක් නැහැ අන්න එතන ඇස

පහස නිසා හට ගත්ත, 'ඇස් පහස' පලුදු වේ. ඇස් පහස නිසා හට ගත්ත, දුක් වූ හෝ නොදුක් වූ හෝ නොසුව වූ හෝ ඒ යම් විදිමක් වේද, එය ද පලුදු වේ, එසේ යම් විදිමක් තියෙනවා නම් එයත් පලුදු වෙන තැන, දුක මයි හට ගන්නේ.

මහණ පලුදු වේ, නම් නැසේ නම්, ඒ නිසා, හට ගත්ත එයින්ම හට ගත්ත ලෝකයත් පලුදු වේ, ලෝකයත් නැසේ, දැන් ලෝකයක් කියලා දෙයක් ගන්න බැරි බව මෙතනින් මනාකොට වැට හෙනවා. අපි දැන් සූත්‍රයේ තියෙන වචන වලින්ම බලමු. '**චක්ඛුං ඛෝ භික්ඛු ලුජ්ජති රූපං ලුජ්ජති, චක්ඛු විඤ්ඤාණං ලුජ්ජති, චක්ඛු සම්පස්සානං ලුජ්ජති, යම්පිදං චක්ඛු සම්පස්ස පච්චයා උප්පජ්ජති, වේදයිතං සුඛංවා දුක්ඛං වා අදුක්ඛම සුඛංවා තම්පි ලුජ්ජති, ලුජ්ජතිතෝ භික්ඛු තස්මා ලෝකෝති උජ්ජතිති.** අන්න චක්ඛු සම්ඵස්සය නිසා හටගත්ත යමක් තියෙනවා නම්, එයත් පලුදු වෙනවා, නැසෙනවා. ඒ නිසා හට ගත්ත යමක් තිබේ නම් එයත් නැසෙනවා, '**යම්පිදං චක්ඛු සම්පස්ස පච්චයා උප්පජ්ජති වේදයිතං**' යම් කිසි විදිමක් වේදනාවක්, '**චක්ඛු සම්පස්ස**' නිසා හටගත්තා නම් සැප වේදනා, දුක් වේදනා කියලා ගත්තා නම් අන්න එයත් නැසෙනවා. පවතින්නේ නැහැ. '**යම්පිදං චක්ඛු සම්ඵස්ස පච්චයා උප්පජ්ජති වේදයිතං සුඛංවා දුක්ඛංවා අදුක්ඛම සුඛංවා තම්පි ලුජ්ජති ඉති කෝ භික්ඛු තස්මා ලෝකෝති උච්චතිති,**' දැන් ඔබගේ ලෝකය කොහෙද තියෙන්නේ? ඒ ලෝකය තියෙන ලෝකයක්ද? ලෝකයක් කියලා දෙයක් තියෙනවා ද? තියෙන ලෝකයක් තියෙනවා ද? දැන් ඔබට පිනවන්න විදවන්න පුලුවන් දෙයක් හම්බ වෙනවා ද? නැහැ, ඒකයි කිව්වෙ මෙතන ප්‍රවාහයක්. වේගයක් තියෙන දෙයක් නැහැ, මේ සිතුවිලි වලින් තමයි මේක දකින්නේ. 'චිත්තේන

**නීයති ලොකෝ,'** මේකයි ධර්මය, මෙය දකින්න. ධම්ම ඇසින්ම දකිනවා කියන්නෙ, සිත තුළ මැවෙන කතාවයි. බාහිරය යනු සාධකයක් පමණි. නමුත් බාහිර තියෙන ලෝකයක් ගැනයි ඔබ හිතන්නේ.

නැහැ, මෙය තමයි සිත තුළ මැවෙන මේ මායාව, බිඳ වැටෙන එකක්, සිත තුළ මැවෙන මේ මායාව තියෙනවා කියලා අපි හිතුවොත් එතැන තමයි දුක හටගන්නේ. සිත තුල මැවෙන තැන. ඒ දෙයක් තියනවා කියලා ඔබ ගත්තේ නැත්නම් එතන දුකෙන් මිදෙනවා. සිත තුළ දෙයක් තියෙනවා කියලා ගත්ත කමමයි, සිත තුළයි දුක තියෙන්නෙ. සිත තුළ තියෙනවා කියලා ගත්තොත්, එතන දුකක් තියෙන්නෙ හැම තැනම ඒකයි පෙන්වන්නේ. ඔබ දකින්න ඇති අපි මීට කලින් පැහැදිලි කළා අර දෙල්ප චිත්‍ර අසුරෙන්දයාගේ මාර බන්ධනය සුර අසුර යුද්ධය තියෙන්නේ ඔතනමයි. සිතේ දෙයක් තියෙනවා කියලා ගත්ත කම නැති දෙයක් තියනවා කියලා හිතපු එකමයි දෙල්ප චිත්‍ර අසුරයාගේ පැරදීම, " සුර අසුර යුද්ධය" තියෙනවා, නැත කියලා. මෙතන ආත්ම අනාත්ම කතාවක් තියෙන්නේ. තියෙනවා කියලා ගැනීම ආත්ම කතාව නැති දෙයක් තියනවා කියලා ගත්ත කමයි. ඒ මාරයා කියන්නේ නැත්නම් අපි කියන්නේ මේ අසුරයාගේ මාර බන්ධනය කියන්නේ. එහෙම නම් නැති දෙයක් තියෙනවා කියලා ගත්ත කමයි. හැබැයි, නැති දෙයක් නැති බව දැක්කොත් සුරයි. ඒ කියන්නේ මාරයා පරදිනවා. ඒක වෙනමම සූත්‍රයකින් ඔබට ඒ සුර අසුර යුද්ධය ගැන තියෙන ඒ පැහැදිලි කිරීම අපි දක්වන්න ඕනේ, මෙතනදීත් හැබැයි මේ අපට, මේ හැම තැනම ධර්මය පේනවා. '**අත්තානුං දිට්ඨිං උහච්ච මච්චුරාජා නපස්සති.** කියන කොට එතනත් මෝඝරාජ

සූත්‍රය තුළත් පෙන්වන්නේ එයමයි. බුදුන් වහන්සේ ආත්ම දෘෂ්ටිය අතහැරුන තැන මාරයා හමුනොවේ කියන තැන. එතකොට ආත්ම දෘෂටියමයි මාරයා කියන්නේ. '**ශුන්නතෝ ලෝකං අවේකස්ස මෝඝරාජා සදාසතෝ අත්තානු දිට්ඨිං ඌහච්ච මච්චු රාජා නපස්සති,**' කියපු තැන. මෝඝ රාජ හැම කල්හිම ලෝකය ශූන්‍ය ලෙස බලව කියපු තැන. අන්න එතනයි, ආත්ම දෘෂ්ටිය අත හැරෙන තැන. එතනයි, **මච්චු රාජා නපස්සිනෝ** මාරයාගෙන් මිදෙන තැන. මේ සියල්ලෙම කියන්නේ එකම කතාවයි. පවතින ලෝකයකුත් නැහැ, අපි හිතින් හදාගත්ත දේත් පවතින්නේ නැහැ. සිත තුළ **හටගෙන නිරුද්ධ වන** ධර්මතාවයක් මෙතන තියෙන සොබාදහම, අර ශබ්ද වර්ණය එකතු වෙලා අර අපි කිව්වේ මෙතන දැනෙන දැනිමයි මි.ලි. වෝට් 5 කරන්ට් එක කියලා අපි කිව්වේ දැනෙන දැනිමයි, ඉන්නවා, තියනවා කියන දැනිම. හැබැයි එහෙම දෙයක් නැහැ. හැබැයි ඒ වේගය නිසා දැනෙන දැනිමයි, ආත්මය කියන්නේ. තියෙන බවට දැනෙන දැනීම, ඒක දියවෙන තැන, ආත්ම දෘෂටියම දියවෙලා යනවා. හැබැයි මේක අවබෝධය තුළ ඔබට, අවබෝධයක් ඇතිවෙනවා. ඒ තුළ මෙය දියවෙන්න හේතුවක් තියෙනවා. ඒකයි දර්ශනය තුළින් හිමාලය පර්වතය වගේ කෙලෙස් ප්‍රමාණයක් ක්ෂය වෙනවා කියන්න හේතුව. අතට ගත්ත ගල් කැටය තරම් බොහොම ටිකයි මහණෙනි ඉතුරු වෙන්නේ, ආනන්දය, කෙලෙස් ඉතුරු වෙන්නේ තව ටිකයි කියලා පෙන්නපු එක. එයයි '**සෝතාපන්න**' වෙනවා කියන්නේ. මේ අනාත්ම ධර්මයට එන එකයි. අනුසෝතය කියන්නේ ගඟ ගලන අතට ගලනවා කියන එකයි. ආත්ම සංඥාව තුළ යන එකයි. **පටිසෝතය** කියන්නේ. සෝතාපන්න වෙනවා කියන්නේ. ආත්ම සංඥාව ගිලිහිලා ආත්ම සංඥාවෙන් මිදීමයි. එහෙම නම් එයට සත්‍යය දකින්නම ඕනේ. ඒ අනාත්ම ධර්මය දකින්නම ඕනේ, එ

සවිඤ්ඤාණක නෙමෙයි අවිඤ්ඤාණක මනසින් දැක්කොත් විතරයි පේන්නේ. මෙයයි සක්කාය දෘෂ්ඨිය ප්‍රහීණ වීම.

ශබ්දයයි, වර්ණයයි කියන්නෙ ඒක ආත්මීය දෙයක් නෙමෙයි ඒක, භෞතිකයි. ඒක අවිඥාණයකයි, ඒ තුළ ඇති වන සපාර්ක් එක කාටුන් එක වගේ අවිඤ්ඤාණයයි. සොබාදහම, සොබාදහමක් පමණයි. පේන දේ, වෙනදා විදිහටම පේනවා, ඇහෙන දේ වෙනදා විදිහට ඇහෙනවා, දැනෙන දේ වෙනදා විදියටම දැනෙනවා, හැබැයි ඊට **ඡන්ද රාගයයි** නැති වෙන්නේ. අන්න ආශ්‍රව කෙලෙස් ක්ෂය වෙන තැන එතනයි. ආශ්‍රව කෙලෙස් ක්ෂය වීගෙන යන්නේ සත්‍ය දකින කොටයි. අන්න එතකොටයි ඔබගේ ඒ සියලු සිතුවිලිවල තියෙන ඒ බලගැන්විලි වලින් ඔබට මිදෙන්න පුළුවන්. සත්‍යය දැක්කොත් විතරයි. බාහිර දෙයක් තියෙනවා කියලා ගත්තොත් ඒක හම්බවෙන්නෙ නැහැ. සිතෙත් දෙයක් තියෙනවා කියලා ගත්තොත් එතැන හම්බවෙන්නේත් නැහැ. හැබැයි මෙතන දෙයක් කියලා දෙයක් නැති බව දැකීම තුළයි බාහිරත් නැතිවෙලා සිතෙත් නැතිවෙන එක සිද්ධ වෙන්නේ. දෙයක් කියලා බාහිර දෙයක් නැති බව දකින එක, කියන කොට, දෙයක් තියනවා (දකින කෙනා සිටින නිසා) හැබැයි ශබ්දයයි වර්ණයයි කියන එකේ. ශබ්දයක් කියලා දකිනකොට ඒ ධර්මය **යථාභූත** වන හැටි දකිනවා කියන්නේ එතැනයි, එතන වර්ණයට ශබ්දයක්, තියෙන්නෙ, එතන සිත කියලා දෙයක් නැති බව, සිත කියලා දෙයක් නැති බව දකින තාක්කල්, මේ ධර්මය කිසිවෙකුට හමුවන්නේ නැත්තේ ඒකයි.

ඔබ බාගෙට ධර්මය දැනගෙන, බාහිරයෙත් දෙයක් නැහැ, හිතේත් දෙයක් නැහැ. මේ දෙකෙන් මිදුනු තැන ශූන්‍යයි, කියන තැන බාගෙට ධර්මය දැනගැනීමයි. වෙන්නේ සම්පූර්ණයෙන් ඔබ ඒ සියල්ලම '**සබ්බ සූත්‍රයේ**' කියනවා

වගේ, සියල්ලම දැක්කා වෙන්නෙ, සබ්බ සූත්‍රය බැලුවම ඔබට පෙනෙයි. ඇස ප්‍රජානාති, ඇස දැක්කමයි. ඇසයි රූපයයි සියල්ල කියලා බුදුන් වහන්සේ පෙන්වූවේ ඒකයි '**සබ්බ සූත්‍රය තුළ.**' එය හරියට දැක්කා නම්, දැකිය යුතු කෝණය, එය ඔබට ඕන යුතු කෝණයෙන් වෙන්න බැහැ. ඒක ආත්ම කෝණයයි. එහෙමනම් අනාත්ම කෝණය කියන්නේ මොකක්ද? අන්න ඒකයි බුදුන් වහන්සේ දේශනා කරන්නේ. මහණෙනි, උදෑසන හිමිදිරි පාන්දර තන අග පිනි දිය බිඳක යමෙක් දේදුන්නක් දකී ද, ඊටම අදාල වූ කෝණයකින් දැකිය යුතුය. ඊටම අදාළ කෝණයකින් කියන්නේ, අපිට ඕන කෝණයකින් බලලා බැහැ, මෙය මෙහෙම කියලා හිතුවත් බැහැ.

සිතුවිලිවලින් නිවන් දකින්න බැහැ කිව්වේ ඒකයි. ඊටම අදාළ වූ කෝණය කියන්නේ ස්වභාව දහමට. ඒ අනුගත කෝණය තමයි, සොබාදහම දකින එක. ඒක භෞතිකයි, ඒක අජීවියි, අනාත්මයි, අවිඤ්ඤාණකයි, පුළුවන් නම් දකින්න සිත හැදෙන හැටි. දැක්කොත් ඔබ ඒකාන්තයෙන් සියලු දුකින් මිදිලා කිසිදා '**නහි ජාතු ගබ්භ සෙයීයං පුනරේති, දිට්ඨංච**' මෙයයි දිට්ටිය මෙය ඉතාම ගැඹුරුයි. '**දිට්ඨංචි අනුපගම්ම සීලවා දස්සනේන සම්පන්නෝ**' මෙයයි දර්ශනය. '**කාමේසු විනෙය්‍ය ගේදං නහි ජාති ගබ්බ සෙයියං පුනරේති.**' ඔහුට නම් නැහැ කිසි දෙයක්, පිනවන්න කියාලා කම් සැපයක්. '**නහිජාතු ගබ්බ සෙයියං පුනරේති,**' 'කලලෙක' නැවත උත්පත්තියක් පනවන්න බැහැ. එය අවසාන ආත්ම භාවයයි. ඒයයි නිවන් මග.

එහෙම නම් මේ සත්‍ය ධර්මය හැමෝට ම මනාකොට අවබෝධ කරගන්න මේ පුංචි පණිවිඩය හේතුවෙන්න ඕනේ.

තෙරුවන් සරණයි!!!

# 10. සක්කාය දිට්ඨිප්පහාන සූත්‍රය

**සක්කාය දිට්ඨි පහාන සූත්‍රය සංයුක්ත නිකාය 4 බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලා වේ 16 වෙනි ග්‍රන්ථය 293 වෙනි පිටුව.**

**"ඒකමංතං නිසින්නෝ කෝසෝ භික්ඛු, භගවන්තං ඒත ද වෝච කතංකෝ භන්තේ, ජානතො කතං පස්සතෝ සක්කාය දිට්ඨි පහියන්ති."**

එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන්සේට තෙල සැළ කළේය. වහන්ස; කෙසේ දන්න හුගේ කෙසේ දක්නා හුගේ සක්කායදිට්ඨිය ප්‍රහීණ වේද?

**"චක්ඛුං ඛෝ භික්ඛු, දුක්ඛතො ජානතො පස්සතො සක්කායදිට්ඨි පහියති. රූපේ දුක්ඛතෝ ජානතො එස්සතො සක්කායදිට්ඨි පහියති, චක්ඛුවිඤ්ඤාණං දුක්ඛතො ජානතො එස්සතො සක්කායදිට්ඨි පහියති. චක්ඛුසම්එස්සං දුක්ඛතො ජානතො, එස්සතො සක්කායදිට්ඨි පහියති. යම්පිදං චක්ඛු සම්පස්සපච්චයා උප්පජ්ජති වෙදයිතිං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි දුක්ඛතො ජානතො පස්සතො සක්කාය දිට්ඨි පහීයතී'ති"**

මහණ, ඇස දුක්, විසින් දන්නාහුගේ දක්නාහුගේ, සක්කායදිට්ඨිය ප්‍රහීණ වෙයි. රූපය දුක් ලෙස දන්නාහුගෙ දක්නාහුගෙ, සක්කාය දෘෂ්ඨිය ප්‍රහින වේ. චක්ඛු විඤ්ඤාණය

දුක් ලෙස, දන්නාහුගේ, දක්නාහුගේ සක්කායදිට්ඨිය ප්‍රහීණ වේ. ඇසේ පහස, දුක් විසින් දක්නාහුගේ, දන්නාහුගේ සක්කායදිට්ඨිය ප්‍රහීණ වේ. ඇසේ පහස නිසා සුව වූ හෝ දුක් වු හෝ නොසුව වූ හෝ යම් වේදනාවක් උපදි නම්, එය ද දුක් විසින් දන්නාහුගෙ දක්නාහුගේ සක්කාය දිට්ඨිය ප්‍රහිණ වෙයි.

දැන් මෙතනින් ඔබට මනා ලෙස පැහැදිලි වෙනවා යම් කාරණයක්. ඒ තමයි, ඇසත්, රූපයත්, ඇසේ විඤ්ඤාණයත්, ඇසේ විඤ්ඤාණය නිසා හටගන්නා යම් වේදයිතයක් තියෙනවා නම්, එතකොට මේ සියල්ලම දුකක් ලෙස. එහෙම නැත්නම්, ඒ රූපයේ දැන් එකක් ගත්තොත්, දැන් ඇසත්, රූපයත්, ඇසේ විඤ්ඤාණයත්, චක්ඛු විඤ්ඤාණයත් ඒ වගේම ඒ නිසා හටගත්ත පහස එහෙම නැත්නම් වේදනාව දැන්, දුකක් කියලා දකිනවා නම් ඒ කෙනා ඒ "**දුක්ඛ තෝ ජානතෝ පස්සතො සක්කාය දිට්ඨි පහියන්ති.**" එතකොට දුකක් කියලා දන්නවා නම්, **ජානතෝ.** එහි සත්‍යය දකිනවා නම්, **එස්සතෝ.** එය හටගන්න හැටි දකිනවානම්, **සක්කාය දිට්ඨි පහියන්ති. සක්කායදිට්ඨි,** අන්න ඒ කෙනාගේ සක්කා දිට්ඨිය ප්‍රහීණ වෙනවා. දැන් රූපය ගත්තොත්, මේ රූපයේ එහෙම නැත්තං ඇසත් රූපයත් දකිනවා කියන එක, රූපය දකිනවා කියන එක, **චක්ඛු විඤ්ඤාණය** දකිනවා කියන එක, ඒ නිසා හටගත්ත වේදනාව දකිනවා කියන එක. දැන් ඇස කියලා කියන්නේ ඔබ දන්නවා මේ ආයතනයට, එහෙම නැත්නම් ජේන බවට. ජේන බවට කියන්නේ මසස නෙමෙයි, ඇත්තටම ආලෝකයත් ගසත් නිසා වැටෙන ප්‍රතිබිම්බය තමයි මේ උපමාව - **තිණ්ණං සංගති එස්සෝ** කියන තැන. එතකොට, මේ ඇස කියලා කියන්නේ මෙතන

මේ ක්‍රියාවලිය. රූපයයි නාමයයි එකතුවෙලා දැනග ැනීම සිද්ධවෙන ක්‍රියාවලිය. එතකොට මෙතනදී එන්නෙ හැඩතලයක්, හැඩතලයක් බාහිරයෙන් එන්නෙ මේ චක්ඛු විඤ්ඤාණයේ දැනගැනීම සිද්ධවෙන්නේ බාහිරයෙන් එන හැඩතලයට එහෙම නැත්නම් ප්‍රතිබිම්බයට. එතකොට ඒක නිසා තමයි චක්ඛු විඤ්ඤාණය සෙවනැල්ල. දැන් ගසත් ආලෝකයත් නිසා හටගත්ත සෙවනැල්ල තමයි චක්ඛු විඤ්ඤාණය කියන්නේ. **"චක්ඛුංච පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං"** එතකොට ඇසත් රූපයත් නිසා හටගත්ත විඤ්ඤාණය, චක්ඛු විඤ්ඤාණය. මේක අප කොහොම කතා කරත් මේ පර්යාය තමයි කතා කරන්නේ. එතකොට ඇස කියන්නෙ පේන බවට, සරලව ගත්තොත් එහෙමයි. හැබැයි මෙතනදී අපට අදියර දෙකකට තමයි මේ දැනගැනීම කියන එක සිද්ධ වෙන්නේ.

චක්ඛු විඤ්ඤාණයට එන්නේ හැඩතලය, එතනත් ස්කන්ධයක්. අපට දැනෙනවා, **වේදනා, සංඥා, සංඛාර** නැතුව විඤ්ඤාණයක් උපදින්නේ නැහැනේ. නමුත් එතනයි හැඩතලයක් තියෙන්නේ. ඒක නිසා හටගත්ත **මනෝ විඤ්ඤාණයෙන්** තමයි දැනගැනීම සිද්ධවන්නේ. එතනින් තමයි ස්පර්ශය කියලා ගන්නේ. **පටිඝ සම්ඵස්සයට අධිවචන සම්ඵස්සය** කියන්නේ. එතැනදී තමයි, ඒ විඳපු හැඩතලය සංඥාව පෙර මතකයෙන් හඳුනාගෙන ඒ ගැලපීමම තමයි විතක්ක කරනවා කියන්නේ. ඒ කියන්නේ එතැන **සංඛාර** කරනවා. ඒකෙන් තමයි **විඤ්ඤාණය** දැනගැනීම සිද්ධවන්නේ. දැන් එතකොට එතන මනෝ විඤ්ඤාණයට තමයි මේ පොත කියන ඒ දැනගැනීම එන්නේ. බාහිර තියන දේ ඒ දැනගැනීම කියන ඒ ආපු සිත. **එහෙම නැත්නම් අරමුණ, සත්‍යය දකිනවා**

**කියන එක තමයි, ජානතෝ කියන්නේ,** එතකොට සක්කාය දිට්ඨිය ප්‍රහින කරනවා කියන්නේ, එතකොට සක් කියන්නේ, ආත්මීය හැඟීම. කාය කියන්නේ, ගොඩ. එතකොට ආත්මීයව එන, අපිට තියෙනවා සක්කාය දෘෂ්ටියක්. මේ මම ඉන්නවා කියලා ආත්මීය හැඟීම්ක් තියෙනවා. ඒ වගේම සක්කාය, එකතු වෙච්ච ගොඩක් අපිට තියෙනවා. එහෙම දෘෂ්ටියක් අපිට තියෙනවා. දැන් ආත්මය දෘෂ්ටියක් අපිට තියනවානේ. **සක්කාය දෘෂ්ටිය** කියන්නෙ, ඔබට එහෙම දැනීමක් තියෙනවානේ මේ මම ඉන්නවා කියලා, අන්න ඒ දැනීමම තමයි සක්කාය දෘෂ්ඨිය. ඇත්තටම එහෙම දෙයක් නැති බව දකින්න නම්, මේ සිතේ සත්‍ය දකින්න ඕනේ. ඉතින් දර්ශන සමාපත්තිය ඇතිවෙන්න නම් බොහෝ උපකාර වෙනවා මේ සිතේ සත්‍ය. හැම විදියකින්ම බුදුන් වහන්සේ දේශනා කරලා තියෙන්නේ. ඇත්තටම, බැලුවොත් විවිධ ආකාර පරියායන් ඔස්සේ විවිධාකාර විදිහට එදා බුදු සමය තුළ බුදුන් වහන්සේ විශාල පරිශ්‍රමයක් දරලා තියෙනවා. මේ බුද්ධ දර්ශනය හැම කෙනෙකුටම ලබාදෙන්න. ඒ වෙනුවෙන් දාපු පරිශ්‍රමය තමයි කෙනාට කෙනාට වෙන වෙනම, ඇත්තටම කෙනාගෙ හැටියට තමයි, කෙනාගෙ ස්වභාවයට. ඒ කෙනා කරන කටයුතු ඒවත් එක්කමනේ ඒ කෙනාගේ ස්වභාවය තියෙන්නෙ. අන්න ඒවයින් තමයි මේ ආත්මීය දෘෂ්ටිය දැකලා, බුදුන් වහන්සේ ඒක ඉවත් කරන්න උත්සාහ කරන්නේ.

එතකොට එතනදි ඉදිරිපත් කරන්නේ සත්‍යය ම තමයි බුදුන් වහන්සේ, සිතේ සත්‍යම පෙන්වන්නේ. එතකොට, ඒ සත්‍යය දැකලා තමයි ඒ අය මේ සිතින් මිදෙන්නෙ. **සක්කාය දෘෂ්ඨිය** ප්‍රහීණ කරලා, සෝවාන් වෙන්නේ. එහෙම නැත්නම් සතර අපායෙන් මිදෙන්නේ, සුගති පරායන වෙන්නේ, **නියත**

**සම්බෝධි පරායන** වෙන්නේ. දැන් මේ මිථ්‍යා දෘෂ්ටියෙ ඉන්නකං අපිට කිසිම සැනසීමක් නැහැනේ. මිත්‍යාදෘෂ්ටි භූමිය තුළ බාහිර ඇත්ත වෙලා, තියෙන්නේ. ඇයි ඒ සත්තු පවා එහෙමයි, මිනිස්සුත් ඉන්නෙත් එතැන ද? මිනිස්සුත් ඉන්නේ බාහිර ඇත්ත වෙලා ද? ඒ නිසා නේද? මනුෂ්‍යයා බාහිර කෙනෙක් එක්ක රණ්ඩු කරන්නේ, මරා ගන්නේ, ඉරිසියා කරන්නේ, වෛර කරන්නේ, බාහිර කෙනෙක් ඉන්නවා කියන අදහසින්නේ. මිනිස්සු හොරකම් කරන්න යන්නේ බාහිර වටින දේවල් තියෙනවනේ කියන අදහසින්නේ. හැබැයි, බෞද්ධ දර්ශනය අනුව ගිය කෙනෙක්ට ඒක වෙන්නේ නැහැ. **ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී, හවේ රක්ඛති** කියන තැනට එනවා. ඇයි? ඒ ඔහු දකිනවා ධර්මය, ධර්මය කියන්නේ දර්ශනය. දර්ශනය තුළ බෞද්ධ කියන්නේ බාහිර දෙයක් නැති වෙනවා. බාහිර තියෙන දෙයක් නැති කියන විට, ඒකෙ සත්‍ය දකිනවා. **සත්‍ය කියන්නේ, හේතුඵලය දකිනවා. හේතු තියනකොට තියෙනවා. හේතු නැති වෙනකොට නැති වෙනවා. ඇත්තටම බාහිර දෙයක් තියෙනවා කිව්වත් වැරදියි. නෑ කිව්වත් වැරදියි. ඒකයි සක්කායදිට්ඨි ප්‍රහීණ කියන තැන තියෙන විශේෂත්වය.** ඒක දකින්න ඕනේ මහා නුවණකින්. බොහෝම සරලව බොහොම කෙටියෙන් අපිට එහෙම දකින්න බැහැ. මේ සත්‍යය දකින කොට ඔබට එනවා, මේ හැම මොහොතෙම හැම සිතකම සත්‍යය දකින එක. එතකොට ඔබ දකිනවා මේ හැම දෙයක්ම මයාවක්. **විඤ්ඤාණය, කියන්නේ මායාවක්,** මායාව විඤ්ඤාණ තමයි ඔබේ සිත. ඔබේ සිතින් හිතලා කියන හැම දෙම මායාවට අයිති, සත්‍යයක් වෙන්නේ නැහැ. ඒක බාහිරට ගිය සිත, ඇත්තටම ඉන්නේ. අන්ධකාරේ භූමියේ. බාහිරයෙන් ඇලෙනවා, එක්කෝ ගැටෙනවා, බාහිර දෙයක් අල්ලගෙන, එක්කෝ ඒකෙන් සැප එනවා, නැත්නම් දුක එනවා, ඒක

නිසා තමයි බාහිරට ගිය සිත ඇත්තටම මිත්‍යාදෘෂ්ඨි භූමිය. ඉතින් මෙන්න මේ දැක්ම බෞද්ධයින්ට ඉතා වැදගත් මොකද? බෞද්ධයන්ගේ සරණ තියෙන්නේ **ධම්මෝ හවේ රක්ඛති** ධර්මය සරණයි තියෙන්නෙ. ධර්මය කියන්නේ මේ සත්‍ය දකින එකයි. එතුළ මහා සරණක් තියෙනවා. ඇත්තටම ඒක **සාන්දිට්ඨිකයි.** ඒක ඇත්තටම ඔබට මේ මොහොතේම ඔබට ප්‍රත්‍යක්ෂ ඥානයට හසු වෙනවා. ඉතින් එතනට එන්ට තමයි ඇත්තටම හැම සූත්‍රයක් ම අනුගත වෙලා තියෙන්නේ. මේ සක්කාය '**දිට්ඨි ප්‍රහාණ සූත්‍රය**' තුළ මේ රූපයෙන් මිදෙන එක, ඇසෙන් මිදෙන එක, චක්ඛු විඤ්ඤාණයෙන් මිදෙන එක, ඒ නිසා හටගත්ත වේදනාව. මේ හැම තැනම බුදුන් වහන්සේ දේශනා කරන්නේ **දුක්ඛතෝ ජානතෝ පස්සතො.** අන්න, එතනින් සක්කායදිට්ඨිය ප්‍රහීණ වෙනවා කියලා.

**"චක්ඛුංකෝ භික්ඛු දුක්ඛ තෝ ජානතෝ පස්සතෝ සක්කාය දිට්ඨි පහියන්ති රූපතේ භික්ඛු ජානතෝ පස්සතෝ සක්කායදිට්ඨි ප්‍රහියන්ති දුක්ඛ තෝ ජානතෝ එස්සතෝ"**

බලන්න ඒකෙ දුක දකිනවා කියන්නෙ, දෙයක් හටගත්තොත් ඒ දේ නිසා එක්කෝ ඇලෙනවා, ගැටෙනවා දුකයි. ඒ කියන්නෙ, එතකොට එහෙම වුනොත් ඒකේ සත්‍ය දකිනවා කියන්නේ, දුක දකින තැන සත්‍ය දකිනවා **ජානතෝ** සත්‍ය මේක හැදෙන ආකාරය දකිනවා. **පස්සතෝ.** අන්න, ඒ කෙනා දකිනවා, මේකෙ **දුක්ඛ තෝ ජානතෝ පස්සතෝ.** ඇත්තටම දෙයක් හටගත්තොත් බාහිර පොතක් හටගත්තොත් එය හටගන්නේ දුකක්මයි. ඒක **සුඛ දුක්ඛං දුක දුක්ඛං** හොඳ කිච්චත්, නරක කිච්චත්, එතැන ගින්නක් හට ගන්නවා. ඒ කියන්නේ දුකක්. ඒ කියන්නේ **සමුදය.** පොතක් කියන්නේ කෙලින්ම උපාදාන වෙලා නම්, ඒක ඇත්ත වෙලා නම්, ඒකට

රැවටිලා. පොත කියන්නේ සම්මුති නාමයක්. අපේ හිත්වල හදාගන්නෙ. ඒක, ඇත්තටම මේ ඇහැට එන්නේ හැඩතලයක්. හැඩතල කියන්නේ නෑ පොත කියලා, වර්ණය කියන්නේ නැහැ. පොත කියලා, ඇහැ එතන ස්පාක් වෙනවා වගේ ආලෝකයට. එහෙම දෙයක් සිද්දවෙනවා ප්‍රසාදය කියලා. එතකොට, එතනින් තමයි **චක්ඛු විඤ්ඤාණය** එන්නේ. ඇසේ විඤ්ඤාණය, දැන ගැනීමක් සිද්ධ වෙන්නේ නැහැ. **මනෝ විඤ්ඤාණය** එතකොට සිද්ධ වෙන්නේ, එතකොට **වේදනා, සංඥා, සංඛාර** පෙර හුරු සංඥාව ගැලපීමත් එක්කලා එන්නේ. එතකොට එතනදි තමයි මනෝ විඤ්ඤානය දැන ගැනීම. පොත කියන එක එන්නේ පෙර මතකයෙන්. එතකොට පෙර මතකයෙන් ගත්ත සම්මුති ප්‍රඥප්ති අපි මනසක හැදුනු සිතුවිල්ලක්.

සිතුවිල්ල බාහිර තියනවද? නැහැ, බාහිර පොත් කියලා දේවල් තියෙනවද නැහැ. එතැන සතර මහා භූත අපිට දකින්න බැහැ, නමුත් ඒක තමයි රූපය. සතර මහා භූත " **රූපය චත්තාරෝච මහ භූතං චතුන්නංච මහා භූතං**" අපි ඒ රූපය නෙමෙයි ඇසුරු කරන්නේ. අපි ඇසුරු කරන්නේ. අපි හිතින් හදාගත්ත උපාදාය රූපයක්. ඒකයි ඒ රූප සංඥාවක් අපි ඇසුරු කරන්නේ. දැන් ඔබට දැනෙනවා. ඔව් සිතුවිල්ලක අපි ඉන්නෙ සිතුවිල්ලක් එක්ක. මේ නිසා තමයි **චිත්තේන නීයති** ලෝකෙ සිතින් හැදුනු ලෝකයක ඉන්නවා. අපිට පේන හැමදේම සිතුවිලි, ඒ වගේ තියෙන්නෙ සම්මුති නාමයන්. අපි බාහිරත් ඒක්ක නෙමෙයි ජීවත් වෙන්නේ, අපේ හිතේ හැදුනු සිතුවිලි නාමයත් එක්ක අපි ජීවත් වෙන්නේ. ළමයි, ගෙවල්, දොරවල්, ඇඳන්, බඩුමුට්ටු හැම එකම නමක් අපි නාමීය ලෝකෙක ජීවත් වෙන්නේ. අපි **චිත්තේන නීයති**

**ලොකෙක** තමයි අපි ජීවත් වෙනවා කියන්නේ. ඉතින් මේක තමයි සත්‍යය දකිනවා කියන්නෙ. **'ජානතෝ පස්සතෝ'** ඒ යථා ආකාරයෙන් දකින එක. ඉතින් ඒ කෙනා තමයි **සක්කාය දිට්ඨිය** ප්‍රහීණ කරන්නේ, ඒ කියන්නේ ආත්ම දෘෂ්ටිය ප්‍රහීණ කරන්නේ. අන්න ඒ කෙනා, රූපය දකිනවා වගේම, දැන් රූපය නිසා හටගත්ත **චක්ඛු විඤ්ඤාණයේ** සත්‍යය දකිනවා. ඒ නිසා හටගත්ත වේදනාව සත්‍යය දකිනවා කියන තැන. දැන් මෙතැනදී අනිත් ආයතනත් ඒ විදියටම ආයතන හයටම බුදුන් වහන්සේ පෙන්නන්වා, **සෝතං පේ, ගානං පේ, ජිව්හං පේ, කායං පේ, මානං පේ, දුක්ඛතො ජානතෝ ඵස්සතෝ සක්කාය දිට්ඨී පහියන්ති, ධම්මං දුක්ඛතෝ ජානතො පස්සතො සක්කායදිට්ඨී පහියන්ති, මනෝ විඤ්ඤාණං දුක්ඛතො ජානතෝ පස්සතො සක්කායදිට්ඨී පහියන්ති. මනෝ සම්ඵස්සං දුකඛ තො ජාන තෝ පස්සතෝ සක්කායදිට්ඨී පහියන්ති.** බලන්න, අතන **චක්ඛු විඤ්ඤාණය** ගැන කියනවා. දැන් බුදුන් වහන්සේ **මනෝ විඤ්ඤානය** ගැන කියනවා. අතන රූප දැන් මේ විදියටම බුදුන් වහන්සේ ස්කන්ධ ගොඩවල් දෙකකට කතා කරනවා. ඒ කියන්නේ චක්ඛු විඤ්ඤාණයට වෙනමම කතා කරනවා. **ඇසත් රූපයත්, ඇසේ විඤ්ඤාණය** කියලා ආයෙ බුදුන් වහන්සේ **මනෝ විඥානය** පිළිබඳව ආයේ කතා කරනවා මේ හැම තැනම ඒ කියන්නේ බුදුන් වහන්සේ **මනෝ විඤ්ඤාණයෙන්** දෙයක් හැදෙන බව මෙතනිනුත් පැහැදිලි කරනවා.

"**දුක්ඛ තෝ ජානතෝ ඵස්සතෝ**" කියන තැන ඉතාම වැදගත් ඒ කියපු තැන, එතනදි බුදුන් වහන්සේ, **මනං දුක්ඛතො ජානතෝ ඵස්සතො සක්කායදිට්ඨී පහියන්ති ධම්මං දුක්ඛතො ජානතෝ ඵස්සතො සක්කාය දිට්ඨී පහියන්ති**

**මනෝ විඤ්ඤාණං දුක්ඛතො ජානතෝ සක්කාය දිට්ඨි පහියන්ති මනෝසම්පස්සං දුක්ඛතො ජානතෝ ඵස්සතො සක්කාය දිට්ඨි පහියන්ති යම්පිදං මනෝ සම්පස්ස පච්චයා උප්පජ්ජති වේදේයිතං සුඛංවා දුක්ඛංවා අදුක්ඛම සුඛංවා තම්පි දුක්ඛතො ජනතො ඵස්සතො සක්කාය දිට්ඨි පහියන්ති ඒවං ඛෝ භික්ඛු ජානතො එවං ඵස්සතො සක්කාය දිට්ඨි පහියන්ති.”**

අන්න ඒ කෙනා සක්කාය දිට්ඨි ප්‍රහාණය කරනවා. කවුරුද? මෙන්න මේ සිතේ සත්‍ය දකින කෙනා සක්කාය දිට්ඨි ප්‍රහීණ කරනවා කියා කණ, නහය, දිව, කය, සිත කියන ආයතන පිළිබඳව මේ පැහැදිලි කිරීම බැලුවොත්, දුක දන්නාහුගේ, දක්නාහුගේ, සක්කාය දිට්ඨිය ප්‍රහීණ වේ. මනෝ විඤ්ඤාණය දුක බව දන්නාවූගේ, දක්නාහුගේ, සක්කාය දිට්ඨි ප්‍රහීණ වේ. **ජානතෝ පස්සතෝ,** දන්නහුගේ, ඒ කියන්නේ සත්‍ය ඥානය ඇති කෙනාගෙ, ඒ වගේම **පස්සතෝ** දක්නාහුගේ, වචන දෙකක් පාවිච්චි කරනවා. දන්න බව වෙනයි, ඒක දැක්ම වෙනයි, දක්නාහුගේ, **මනෝ සම්ඵස්සයේ** නිසා ඇති වන දුක දන්න දක්නාහුගේ දන්නාහුගේ සක්කාය දිට්ඨිය ප්‍රහීණ වේ. දන්නා බව වෙනයි, දකින බව වෙනයි. දැනගැනීම වෙනයි. ඒ ප්‍රත්‍යක්ෂ ඥානයෙන් දැකීම වෙනයි. ඒක නිසයි **ජානතෝ පස්සතෝ** කිව්වේ. **මනෝ සම්ඵස්ස** දුක් විසින් දන්නාහුගේ දක්නාහුගේ **සක්කායදිට්ඨිය** ප්‍රහීණ වේ. **මනෝ විඤ්ඤාණය සම්පස්ඵස්සය** නිසා හටගත්ත වේදනාවක් තියෙනව නම් අන්න ඒ වේදනාව, සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් සුව වූ හෝ **මනෝ විඥානය** නිසා යම් වේදනාවක් හටගත්තොත්, අන්න, ඒ වේදනාව, දුක බව දන්නාහුගෙ දක්නාහුගේ **සක්කායදිට්ඨිය** ප්‍රහීණ වෙයි.

දැන් මෙන්න මෙසේ දන්නාහුගේ මෙසේ දක්නාහුගේ **සක්කායදිට්ඨිය** ප්‍රහීණ වෙයි කියලා. 'සක්කාය දිට්ඨි ප්‍රහීණ සූත්‍රයෙන්' බුදුන් වහන්සේ ගෙන හැර පානවා. ඉතින් මේ කාරණාවෙන් ඔබට මේ ආත්මය අනුව ගිය දෘෂ්ටිය, ඒ ආත්ම දෘෂ්ටිය සක්කාය දෘෂ්ටිය ඇත්තටම, නැති වෙන්න නම් තමන්ට දර්ශනයේ ඇති වැදගත්කම මෙතනදි පේනවා. ඒ වගේම **සත්‍යය ජානතෝ** කියන කොටම, සත්‍යය පෙන්නන ඕනේ හිතට. හිතට එන හැම අරමුණකම, මේක පෙන්නන්න ඕනේ. මේ දුක්ඛතෝ ඒක දකින්නත් ඕනේ, ඇත්තටම අර දර්ශනය තියෙන කොට ඒ කෙනා දකිනවා දෙයක් හටගන්න කොට පොත කියන කොටම ඒක දුකයි. කියලා පොත තමයි සමුදය, ඒක හටගැනිම, පොත හට ගැනීමේ හේතුවමයි දුක. එතකොට එකේ සත්‍ය දකින තැන, නිරෝධයට එනවා. ඒ නිරෝධයට යන දැකීම, මාර්ගය බවට පත් වෙනවා. අන්න චතුරාර්ය සත්‍යය දකිනවා. පොත කියන එක සමුදය. එකේ දුකක් එනවා, පොත හටගන්න තැනම, දුක හට ගන්නවා. එතකොට එකේ සත්‍යය දකින කෙනා දර්ශනය තියෙන කෙනා, සිත හැදෙන හැටි දකිනවා මායාව දකිනවා සත්‍ය දකිනවා. එතකොට පොතක් හම්බ වෙන්නේ නෑ. එයාට, එතකොට පොතෙන් මිදෙනවා, අන්න නිරෝධය. ඒ දකින කටයුත්ත මාර්ගයෙ අන්න, '**දුක්ඛ සමුදයේ නිරෝධ, දුක්ඛ නිරෝධ, ගාමිණී පටිපදා, ආර්ය සත්‍යය.**' දුක්ඛ නිරෝධයට යන ඒ ගමන්මග. ගාමිණීපටිපදා, ප්‍රතිපදාවක් විදියට එන එන හැම නිමිත්තක් පෙන්වන එක, **දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය.** ආර්යවරු, සත්‍යය දකිනවා. මේ චතුරාර්ය සත්‍යය මෙතැන දී මනා කොට ඔබට දකින්න ලැබෙනවා. එහෙමනම් තෙරුවන් සරණයි!!!

සියල්ලෝම සත්‍ය ධර්මය දකිත්වා!!!